# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ මැදින් පුර පසළොස්වක පෝද 2023 මාර්තු 06 සඳුදා BUDUSARANA MONDAY MARCH 06, 2023

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 37 පත්‍රය , පිටු 32 ආරම්භය 1965 - 06 - 13 මිල රු. 100.00



කඩවත කිරිල්ලවල ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථානයේ
අභිනවයෙන් ඉදිවූ සමාධි බුද්ධ ප්‍රතිමාවහන්සේ

ඡායාරූපය -
රුක්මල් ගමගේ

# සංකර සිරිතෙන් හිස උදුම්මා ගැනීම බොදු පිළිවෙත නොවේ

"වැඩිහිටියන් යනු අපට වඩා වයසින් වැඩි අයයි. කුඩා අපට ආදර්ශ ලබා දෙන්නේ වැඩිහිටියන් ය. අසරණ වූ අවස්ථාවල ඔවුන්ට පිහිටවිය යුතු ය. අපගේ දෙමාපිය – නෑදෑයින් පමණක් නොව සියලුම වැඩිහිටියන්ට ගරු කළ යුතු ය. අපේ ලෝකය ගොඩනංවන්නේ අපේ වැඩිහිටියන් බැව් අමතක නොකළ යුතු ය."

**කොළඹ ප්‍රධාන පෙළේ බෞද්ධ බාලිකාවක දෙවැනි ශ්‍රේණියේ දැරියක ලියූ ඉහත මුතු වැකි සමුච්ඡය මා නෙත් සිත් පැහැර ගත්තේ ය.**

ගුණ දහම් අමතකවැ, හොඳ සිරිත් වියැකී, වල්විරිත් දෝතින් පිළිගත් වල්මත් සමාජයක, සරු දේ අතහැර නිසරු දේ වැළඳගත් මිනිසුන් වෙසෙන මෙබඳු කාල වකවානුවක මෙවන් පූජනීය සිතිවිලිවලින් පොහොසත් දුවා දරුවන්ගේ නොවක් අදහස් මාගේ මෑතෑභූමිය යුගයෙන් යුගය සාධු සිරිතෙන් ඔප්නංවන බවට වූ සැනසිලිදායක සිතිවිල්ලෙන් මා සිත පහන් විය.

සුපහන් – ප්‍රභාශ්වර චිත්ත සන්තානය නම් වූ සරු බිම තුළ මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂාවේ ගති සොබාවේ ඡායාවන් විද්‍යමාන වෙයි නම්, සිත් – සතත් තුළ මෙත් මුදිතාදී කරුණා ගුණ වෙයි නම්, එය රටට සමාජයට ලෝකයාට මහත් අස්වැසිල්ලකි.

රටට, සමාජයට වැඩ කළ ඇත්තන් අමතක කර ආටෝප සාටෝප සංකර විරිතෙන් හිස උදුම්මා ගැනීම බොදු පිළිවෙත නොවෙයි. ඉහත මුතුවැකි සමුදාය ලියූ දියණියගේ හද සන්තානය සේ සමනල හදක සිතිවිලි ස්පර්ශ කරන්නට ගුණයෙන් වයසින් වැඩී ඇත්තෝ වග බලා ගත යුත්තේ ය. ළමා පෙළ, ළමා හද ආදරයෙන්, කරුණාවෙන් සුවපත් කරන්නට – නිවන්නට මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ඛා ගුණ සමුදායන් ළමා සිතේ පැළ පදියම් කරවන්නට වගබලා ගැනීම වයසින් ගුණයෙන්, මනසින් මුහුකුරා ගිය අයගේ වගකීමයි.

මේ සිරිපා සමයයි. එදා සිරිපා කරුණා කරන පිරිස – නඩය, තම දුෂ්කර ගමනේ වගකීම පැවරුවේ වැඩිහිටියකුට ය. නඩේගුරා ගමනේ – වන්දනාවේ වගකීම අකුරට ම ඉටු කළේ ය.

වඳින්න යන මේ නඩයට –

බුද්ධං සරණෝ සරණයි

ධම්මං සරණෝ සරණයි

වැඳලා බහින මේ පිරිසට සුමන සමන් දෙවි පිහිටයි

ඒ තුළින් ද විද්‍යමාන වනුයේ අපේකමයි.



වැඩිහිටි – අඩුහිටි සබඳතාවයි. එදා පටන් අවිච්ඡින්නව පැවැතෙන බුදුදහමේ ආභාසයයි. බුදුන් වහන්සේගේ සදුපදේශ මත, අඩිතාලම මත හැදිච්ච ජාතියේ උතුරා දෝර ගලන උතුම් මනුස්සකමයි.

ඊට පදනම වැටුණෝ ධම්ම පදය තුළිනි. ජාතක පොත් වහන්සේ තුළිනි. නළපාන ජාතකයේ වැඩිහිටි නායක වඳුරාට ගරු කිරීමෙන්, වැඩිහිටි මතයට අවනත වීමෙන් සිදුවීමට ගිය විශාල අනතුරකින් බේරීමට එදා එම වඳුරු රැළට හැකි විය.

ලේ කිරි කර පොවා දස මස කුස දරා වැදූ අම්මාට, රන් රුධිරය අම්ල දහඩිය දරුවන් වෙනුවෙන් කැප කළ, දුව පුතා මහ මිනිසුන් කරන්නට අප්‍රතිහත ධෛර්යයෙන් ක්‍රියා කළ තාත්තාට අවසන් මොහොතේ අවසන් හුස්ම පොද සැනසිල්ලේ වාතලයට මුසු කරන්නට අවැසි විය යුතු ම ය. ඒ සඳහා කායික, මානසික නිරවුල් බව සැනසිල්ල තමා හදා වඩා කරදඬු උස් මහත් කළ, තුන්වේල නොවරදවා කුසගිනි නිවූ මව්පියනට දූ දරුවෝ විසින් දානය කළ යුතු ය. එසේ නොකළ හොත් අම්මාට, තාත්තාට ඉකි බිඳ බිඳ, දුක් කඳුළු වගුරවමින් මෙලොවින් නික්ම යෑමට සිදුවනු ඇත.

මුළු දිවිය ම රටට, සමාජයට කැප කර, ආගන්තුකව මනුලොවට එන දුව පුතාට – ප්‍රසූත වේදනා බරිත ගර්භිණී මාතාවට අංගුලිමාල පිරිතෙන් ආශිර්වාද කරන, කෙනෙක් දිවියෙන් සමුගෙන කැරකෝප්පුවට යන තැන දී අනිච්ඡාවත සංඛාරා අනිත්‍ය සම්ප්‍රයුක්ත ගාථා සජ්ඣායනා කරන තැන දක්වා ගමේ පන්සලේ ලොකු හාමුදුරුවන්ගෙන් වන සේවය හදවතක් ඇති කිසිවකුට කිසිදා අමතක කළ නොහැකි ය.

සමාජයක සද්ජන සමූහයාට, ගමේ පන්සලේ වයෝවෘද්ධ, තපෝවෘද්ධ, ගුණවෘද්ධ නා සමිඳුන්ගෙන් රටට, ගමට, ලොවැට වූ ප්‍රමාණාතික්‍රාන්ත උදාර මෙහෙය අමතක කළ නොහැකි ය.

මුළු දිවි ගමන ම "උදාර බුද්ධ පුත්‍රයාණන් වහන්සේ නමකැයි" යන ගරුබුහුමන ඇතිව සුගතියට වඩින ලොකු හාමුදුරුවන්ගේ ආදර්ශ සම්පන්න දිවිපෙවෙත පොඩි හාමුදුරුවන් ද නිදසුන් කොට ගත යුතු ය. ලොකු හාමුදුරුවන් මේ උත්තම භූමියේ උත්තමයකු ලෙසින් සිතා ජීවත්ව සිටින කාලයේ දී ම කළ යුතු සියලු ඇප උපස්ථාන සිදුකොට සිත පහන් කර ගැනීමට හැකි අයුරින් ක්‍රියා කළ යුතු ය.

එවිට බෝසත් ධර්මතාවන් අපි ප්‍රගුණ කළෙමු යන හැඟුමින් පොඩි හිමිවරුන්ගේ සිත් සතන් ප්‍රසන්න වේ ද, සැබවින් ම ඒ වූකලි බෝසත් ධර්මතාවක් ප්‍රගුණ කිරීමකි.

දුරාතීතයේ දී ද වැඩිහිටි බව අදහා වැඩිහිටියනට ගරු කිරීමේ සද්චාරිත්‍ර ධර්මය පැවති බැව් ජාතක පොත් වහන්සේ තුළ එන තිත්තිර ජාතක කථාව කමනීයව විස්තර කෙරේ.

හිමාල අරණේ විසූ වඳුරෙක්, වටුවෙක් හා ඇතෙක් තම තමන් අතුරින් කවරෙක් වැඩිමහල් වේ දැයි සොයා එකිනෙකා ප්‍රශ්න නැඟුහ. දිනක් මහා වනස්පති නුග වෘක්ෂයක සෙවණ යට සිටි මේ සත්වයන් අතුරින් ඇඟින්, බඩින්, කඳින් විශාල ඇත් රජු පවසා සිටියේ මා කුඩා කල මෙතැනින් යන කල අර පෙනෙන දැවැන්ත නුග වෘක්ෂ රාජයාගේ කරටිය තමන්ගේ යටි බඩෙහි ගෑවෙන බවයි.

ඊළඟට ඉදිරියට පැමිණි වඳුරා කියා සිටියේ තමන් කුඩා කාලයේ දී මෙහි මුදුන් දලුව බෙල්ල නොඔසවා ම කඩාගෙන අනුභව කළ බවයි.

අවසානයට පැමිණි වටුකුරුල්ලා පවසා සිටියේ ඊට හාත්පසින් ම වෙනස් කථාවකි. තම මිත්‍රයන් දෙදෙනා අමතමින් "යහළුව, ඉහත අසවල් අරණේ මහා නුග වෘක්ෂයෙක් විය. මම එයින් නුග ඵලයක් අනුභව කොට මෙම ස්ථානයේ වසුරු කිරීමෙන් මේ ගස පැළ විය." ඒ බව කියත්ම සිරුරින් කුඩා වුවත් වටුවා තමන් අතුරින් වැඩිමහලු බැව් දැනගත් තැන පටන් වඳුරා හා ඇතා තමනට වඩා වැඩිමහල් වටුවාට සලකන්නට පටන් ගත්හ.

බුදුරදුන් පූජාච පූජනීයානං, පිදිය යුත්තන්ට පුදන්න යැයි මංගල සූත්‍රයේ දී දේශනා කළ සේක.

මත්වතුර, දුම්වැටි පෝලිම්වල සිට පංච දුශ්චරිතයේ යෙදී, දුරාචාර ක්‍රියාවල නියුතුව, රණ්ඩු සරුවල් කරන ස්ත්‍රී පුරුෂ වැඩිහිටියෝ අද්‍යතන යුගයේ සාරධර්ම සෝදා පාළුවට සෘජුව වගකිව යුතුව ඇත. සැබෑවටම පිදිය යුතු වන්නේ පිදිය යුතු අය ය. එහිලා බුදු, පසේබුදු මහරහත් උතුමෝ ම ප්‍රමුඛස්ථානය ගනිති.

හැදිච්චකම , මනුස්සකම, විනය, හික්මීම, හීලෑ බව මිනිසා තුළ තිබිය යුතු අත්‍යවශ්‍ය ගුණාංගයකි. මිනිසා මනසින් උසස් වන්නේ එවිට ය. තිරිසන් ගත සතා වුව හීලෑ දැමුණු සතෙකු වූ විට එම සතාගේ වටිනාකම අගය තීව්‍ර වෙයි.

සම්බුදු පියාණන් වහන්සේගේ වාම ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ පෙරහරේ වැඩමවීමට යොදා ගනුයේ මනාව දැමුණ හීලෑ හස්ති රාජයෙකි. කරඬුව තබන්නේ අශ්වයකු බඳු කලබල, අතිධාවන කාරයකු මත නොවැ, ශාන්ත දාන්ත හස්ති රාජයකු මත ය. දන්ත ධාතූන් වහන්සේ වැඩමවීමට යොදාගත්තේ රාජා හස්තියා, නැදුන්ගමුවේ හස්තියා බඳු දැමුණු, දෙවියන් සදිසි පුණ්‍යවන්ත මනුලොව හස්ති රාජයන් ය. රාජා ඇතා, නැදුන්ගමුවේ හස්තියා ඉමහත් ජන හරසර මැද මිනිසකුට කළ නොහැකි අද්විතීය අසම සම කාර්යයක නිරත වූයේ ලෝකයක් වශීකෘත කරවමිනි. තිරිසන් ගතියේ උපනත් එම හස්තියෝ ලෝකයාගේ නොමඳ සම්භාවනාවට පාත්‍ර විය.

මහ බෝසතුන් ලෙස සත්‍ය ගවේෂණ වකවානුවේ දී සිදුහත් තවුසාණෝ ආලාර කාලාම, උද්දකරාමපුත්ත යන වයෝවෘද්ධ, ගුණවෘද්ධ, උතුමන්ගේ ආභාසයෙන් ස්ව සන්තාන අභිවෘද්ධියට වීර්යයෙන් ක්‍රියා කළ සේක. බුදුරදුන් බුදුව පළමුව ලොවැට කියාදුන් පාඩම කෘතවේදී බවය. ඇසතු වෘක්ෂය දෙස සතියක් ඇසි පිය නොහෙලා බලා සිටිමින් මුළු මහත් ලෝකයාට ම කළ ගුණ සැලකීමේ අගය වදාළ සේක. ක්‍රියාවෙන් ම පෙන්වූ සේක.

යථාවාදී, තථාකාරී වූ බුදුන් වහන්සේගේ අමිල සදුප දේශයන් ගුරුකොට ගත් ජාතියක්, දේශයක්, ජනතාවක් ලෙස පෙළ ගැසෙමු. බෞද්ධයන්ගේ සැබෑ රුව ගුණ ලොවට ම පෙන්වමු.



උදම්මිට උත්තමාරාම පුරාණ විහාරයේ
**උදම්මිට ධම්මානන්ද හිමි**

**ඇසුරු කරන අයගේ ස්වභාවය අනුව මිනිසා වෙනස් වන්නේ ය**

# ගොරකාන - සීවලි මහා සෑ රදුන් ඉදිකිරීමට නියමිත පුණ්‍ය භූමියේ පූජ්‍ය වැලිමඩ සද්ධාසීල ස්වාමින්වහන්සේ සිදු කළ

## විශේෂ සුමධුර සදහම් දේශනාව සහ අෂ්ඨපරිෂ්කාර පූජා පෙරහර විශේෂ අවස්ථා



අෂ්ඨපරිෂ්කාර රැගෙන සැදැහැවතුන් පෙරහරින් පැමිණීම



අෂ්ඨපරිෂ්කාර පූජාව සහ ධර්මදේශනය ශ්‍රවණයට ගොරකාන ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරස්ථානයට පැමිණ සිටි සැදැහැවතුන් සීවලි මහා සෑය ඉදිකිරීමට යෝජිත පුණ්‍ය භූමිය අසල




වැලිමඩ සද්ධාසීල හිමියන් පෙරහරින් වැඩම කරවීම



මහමෙව්නා අසපුවෙන් පරිත්‍යාග ලෙස වැලිමඩ සද්ධාසීල හිමියන් වඩමවාගෙන එනු ලැබූ සර්වඥ ධාතූන් වහන්සේලා සහ සීවලි මහ රහත් ධාතූන් වහන්සේලා සහිත සඳුන් කරඬුව ගොරකාන - ශ්‍රී ගංගාතිලක විහාරාධිපති පූජ්‍ය ලියන්ගහවත්තේ නන්ද හිමිපාණන් ගෞරව සම්ප්‍රයුක්තව පෙරහරින් වැඩම කරවමින්

**දයක වූ ඔබ සැමට බොහෝ පිං !**

- සීවලි මහා සෑය අරමුදල මෙහෙයුම් කමිටුවේ ප්‍රාර්ථනාවයි -




**විහාරස්ථානයට පැමිණෙන ගමන් මාර්ගය.**

පාණදුර පරණ පාර (මාර්ග අංක 100 හෝ 183) බස් මාර්ගයේ පැමිණ "ගොරකාන" බස් නැවතුමෙන් බැස, ගොරකාන - 'කීල්ස්' ආයතනය අසල ඇති ශ්‍රී ධම්මානන්ද මාවතෙන් හැරී විහාරස්ථානයට පැමිණෙන්න. (පැමිණමට පෙර දුරකථන මගින් ස්වාමින්වහන්සේ වැඩසිටින වෙලාවක් ලබාගන්නේ නම් ස්තූතිවන්ත වෙමු.)

**පූජ්‍ය වැලිමඩ සද්ධාසීල හිමියන් විසින් ගොරකාන - සීවලි මහ සෑය ඉදිවන පුණ්‍යභූමියේ සිදු කළ ධර්මදේශනාව මාර්තු 11 වන දා සෙනසුරාදා රාත්‍රී 7.00 ට ශ්‍රද්ධා රූපවාහිනී නාලිකාව ඔස්සේ ඔබට නැරඹිය හැක.**

## ගොරකාන "සීවලි මහා සෑයට" ඔබත් දායක වන්න

පින්වත් ඔබගේ පුණ්‍යාධාර "සීවලි මහා සෑය අරමුදල" නමින් දක්වා ඇති බැංකු ගිණුමකට බැර කළ හැකිය. එලෙස බැංකු ගිණුමකට ඔබේ පුණ්‍යාධාරය බැර කොට ඇති බව සනාථ කිරීම පිණිස එම බැංකු ලදුපත හෝ එහි පැහැදිළි පිටපතක් සමග, ඔබේ නම, ලිපිනය සහ දුරකථන අංකය පැහැදිළි අකුරින් ලියා පහත ලිපිනයට තැපැල් කරන්න. එහි විනිවිදභාවය සඳහා පුණ්‍යානුමෝදනා පතක් තැපැල් මගින් ඔබ වෙත එවනු ලැබේ. විහාරස්ථානයට පැමිණෙන පින්වතුන් හට "සීවලි මහා සෑය අරමුදල - කායාීලයය" ට පුණ්‍යාධාර ලබාදිය හැක.

| ගිණුමේ නම : සීවලි මහා සෑය අරමුදල | | | |
|---|---|---|---|
| සම්පත් බැංකුව ගිණුම | ලංකා බැංකුව ගිණුම | මහජන බැංකුව ගිණුම | සෙලාන් බැංකුව ගිණුම |
| 1151 6100 4890 | 8 5 5 7 7 4 3 9 | 148-2-001-6-0038551 | 0400-13126762-101 |

**සියලු විමසීම් :** ගරු සභාපති, පූජ්‍ය ලියන්ගහවත්තේ නන්ද ස්ථවිර, සීවලි මහා සෑය අරමුදල, ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරය, ශ්‍රී ධම්මානන්ද මාවත, ගොරකාන, කෙහෙල්වත්ත 12550. දුරකථන - 038 22 97 914 / 071 250 44 46

# කාලයට පැරදුණොත් ජීවිතයම පරදිනවා



මහව,උඩගම ශ්‍රී ඉන්දසුමන මහ පිරිවෙන්හි ප්‍රවීණාචාර්ය
ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛන ශාස්ත්‍රී
**ගලගෙදර රතනවංස හිමි**

අපට නැති වන ඕනෑම දෙයක් නැවත ලබා ගැනීමට විවිධ ක්‍රමවේද තිබේ. වස්තුව, ධනය, ඇඳුම් – පැළඳුම්, ගෙවල් – දොරවල් වතුපිටි, හරකබාන මේ ආදි සම්පත් නැති වුවද ඒවා නැවත ගොඩනඟා ගැනීමට නැත්නම් ලබා ගැනීමට පුළුවන්කමක් ඇත. නමුදු ක්ෂය වී යන කාලය නැවත ලබා ගැනීමට නොහැකි ය. එම උතුම් වටිනා කාලය කළමනාකරණය නොකොට ගෙන ඉදිරියට යෑම නිෂ්ඵල ක්‍රියාවකි. ඒ සඳහා අපට බුද්ධ චරිතය තරම් වටිනා චරිතයක් තවත් හමු නොවනු ඇත.

උන්වහන්සේ මුළු මානව සත්ත්වයාට ම කරුණාවෙන් හා මෛත්‍රියෙන් සේවය කළ අයුරු ඉතා ප්‍රකට ය. සත්ත්වයාගේ දුකට පිහිට වුණ ලොව උතුම්ම ශාස්තෘවරයෙක් වශයෙන් උන්වහන්සේ කාල කළමනාකරණයක් තුළ ඉඳිමින් ම එම කාර්යයන්වල නිරත වූහ.

උන්වහන්සේ දවස කොටස් 5කට බෙදා ගත්හ. සැතපීම උදෙසා පැය 4ක් වැනි සුළු කාලයක් තබාගෙන අන් සියලුම කාලය ලෝක සත්ත්වයාගේ හිත සුව පිණිස, දුක නිවීම පිණිස කැප කළ අයුරු ඉතා අගනේ ය. අද වුව ද කෙනකුට කාලය අපතේ නොයවා කටයුතු කිරීමට අවශ්‍ය නම් බුද්ධ චරිතය ආදර්ශයට ගැනීම පමණක් වුව ද ප්‍රමාණවත් වේ.

බුද්ධ චරිතයෙන් නිතරම නිකුත් වුණේ "අප්පමාදො අමත පදං – පමාදො මච්චුනො පදං" යන දර්ශනයයි. නොපමා වූවෝ නොමියති. (නිවනට යති) පමාවූවෝ මරණය වැළඳගත් මළවුන් වැනි ය යනුවෙනි.

මුළු මහත් ධර්මස්කන්ධය ම අන්තර්ගත කරමින් උන්වහන්සේ නිරන්තරයෙන් දේශනා කළේ කාලය අපතේ නොයවා තම විමුක්තිය සලසා ගන්නා ලෙසයි.

අප්පමාද නම් සිහියෙන් කටයුතු කිරීමයි. එනම් නිවන් මඟෙහි ප්‍රතිපත්ති සම්පූර්ණ කරමින් එය සාක්ෂාත් කර ගැනීමට වෙහෙස දැරීමයි.

භික්ෂූන් අමතා බුදුරජාණන් වහන්සේ දේශනා කළ මුල්ම බුද්ධ වචනය වූයේ "මා ඒකේන ද්වේ අගමිත්ථ" දෙදෙනෙක් එක මඟ නොයන්න" යන්නයි. ඒ වචනය තුළ කාලය අපතේ නොයොදවන ලෙස අවධාරණය කොට ඇත.

දෙදෙනෙක් එක මඟ යෑමේ දී ඉලක්කය වැරැදීමට ද පුළුවන. එවිට එක්කෙනෙක්ගෙන් සිදු විය යුතු සේවය ප්‍රමාද වීමට ද පුළුවන. වර්තමාන සමාජය තුළ දැකගත හැක්කේ එක්කෙනෙක්, දෙදෙනෙක් කළ යුතු ක්‍රියා සමහර අවස්ථාවල දී දහදොළොස් දෙනා සිදුකරන අයුරු ය.

"හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වෝ වධයම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ" යනුවෙන් බුදුරජාණන්ගේ අන්තිම බුද්ධ වචනය තුළින් දේශනා කළේ මහණෙනි ඔබ අමතමි. හේතු ප්‍රත්‍යයෙන් හටගත් සියලු සංස්කාර ධර්මයෝ නැසෙන සුළු ය. එබැවින් අප්‍රමාදීව කුසල් දහම් සම්පාදනය කරගන්න යන්නයි.

අප්‍රමාද යන වචනය උන්වහන්සේ යොදා ගත්තේ කාලය තුළ ඇති වටිනාකම කියා දීමටයි. බුදුරදුන් පිරිනිවන් මඤ්චකයේ සිටියදී දහම් කරුණක් අසා දැන ගැනීමට පැමිණි සුභද්‍ර නම් භික්ෂුව වැළැක්වීමට හැදූ ආනන්ද හිමිට බුදු හිමි සඳහන් කළේ ඔහුට එන්න ඉඩ දෙන ලෙසයි. එයින් ද බුදු හිමි සිද්ධ කළේ එම භික්ෂුව කාලයේ වටිනාකම හඳුනාගෙන එම පුංචි කාලය තුළ වුව ද සසර ජය ගැනීමට වෙර දරන බව දැනගෙන ඒ සඳහා උදවු කිරීමයි.

එසේ නම් බුදුරදුන් ලෝක සත්ත්වයාට කියාදුන් එම උතුම් පාඩම වර්තමාන සමාජයට කොතරම් අගනේ ද යන්න සිතා බැලිය යුත්තකි. කාලය නොනැවතී ගමන් කරන බැවින් සත්ත්වයා නිරන්තරයෙන් මාරයාට ළං වෙති. ඒ අනුව සිතීමේ දී තම තමන්ගේ ජීවිත ජය ගැනීමට තම තමන්ම උත්සාහවත් වීම ප්‍රඥාගෝචර වන්නේ ය. තමන්ට පිහිට තමාම බව නිරන්තරයෙන්ම සිතිය යුතු ය.

කාලය රන් හා සමානයි යන කියමනට අනුව සිතීමේ දී අපතේ යවන කාලය අලි ඇතුන්ලවාවත් නැවත ඇද ගැනීමට අපහසු බව සිතිය යුතු ය. වටිනා ජීවිතයන් හිස් ඒවා බවට පත් වීමට ඉඩ නොදී කාලයේ වටිනාකම හැඳිනගෙන එම කාලය තුළින් ලෞකික දියුණුවත්, ලෝකෝත්තර දියුණුවත් ලබා ගැනීමට උත්සාහවත් වීම දුර්ලභව ම ලද මේ මිනිසත් බව ජය ගැනීමට එකම මඟ වන්නේ ය.



# ජීවිතය සාර්ථක කරන ඉලක්කය හා බැඳුණු උනන්දුව

**එක මොහොතක් හෝ අපතේ නොයවමින් දින චරියාවකට අනුව කටයුතු කළ බුදුරජාණන් වහන්සේ අවුරුදු හතළිස් පහක් තුළ මොනතරම් මෙහෙයක් ඉටුකර ඇත්දැයි බලන්න. අපේ රටේ සිටි ශ්‍රේෂ්ඨ වැදගත් පුද්ගලයින් ක්‍රමවත් වැඩසටහනකට අනුව දවස් ගත කළ අයුරු ඉතිහාසය අපට කියා දෙයි. දෙවන පැරකුම්බා රජු නියමිත වෙලාවට ආගමික වතාවත් ඉටු කළ අයුරුත් රාජ්‍ය පාලකයකු ලෙස තම වගකීම සඳහා දවස සැලසුම් කරගත් අයුරුත් අපට වැදගත් පාඩමකි.**

දිනය සැලසුම් කිරීමේ දී උදේ සහ සන්ධ්‍යාවෙහි සිදු කරනු ලබන ආගමික වතාවත් පිළිබඳවත්, විශේෂයෙන් පොහෝ දිනයෙහි විහාරස්ථානයට ගොස් සිදු කළ යුතු ආගමික වතාවත් ගැන ද මූලික අවධානය යොමු කරන්න.

ඉගෙන ගන්නා ශිෂ්‍යයකු වශයෙන් තම දින චරියාව සකස් කරගත යුත්තේ බොදු හැදියාව සමඟ අධ්‍යාපනික ජීවිතය ද ගොඩනැංවෙන අයුරෙනි.

අරුණට පළමු නැඟිටීමට පුරුදු වන්න. එය ප්‍රබෝධවත් ජීවිතයකට මහත් ශක්තියකි. උදේ හිරු රැස් වැදීමෙන් ගස් වැල් පවා නව පණක් ලබයි. අප කරන කාර්යයන්හි ඵලදායිත්වයට අරුණ තුළින් ලබන පිබිදීම මහත් ශක්තියකි. ඒ තුළින් දවස තුළ කළ යුතු කාර්යභාරයට සූදානම් වීමේ වටිනා අවස්ථාව උදාවනු ඇත.

එදිනෙදා ගෙදර කටයුතු ඉටු කර ගැනීමේ දී පවුලේ සමඟි සම්බන්ධතාව ඉතා වැදගත් ය. මෙහිදී සෑම කෙනෙක් ම අදාළ කාර්යයන්හි කොටස්කරුවකු වන අයුරින් බැඳී කටයුතු කරන්නේ නම්, එම නිවෙස සැනසිලිදායක තැනක් වන බව අමුතුවෙන් කිව යුතු නැත. ගෙදර හා සම්බන්ධ කාර්යභාරය තනි අයකුට කරන්නට සිදු වුවහොත් මොනතරම් කායික හා මානසික පීඩනයකට ඔහු හෝ ඇය පත්වෙනවා දැයි බලන්න.

දිනපතාම යටත් පිරිසෙන් පැයක පමණ කාලයක් වත් දරුවන් සමඟ මවුපියන් සමීපව කටයුතු කළ යුතුයි.

විවිධ ක්‍රියාකාරකම් නිසා අපහසුතාවක් ඇතිවන්නේ නම් සතියකට පැය කිහිපයක් වත් දරුවන් සමඟ ගත කිරීමට කාලය වෙන් කර ගත යුතුව ඇත. මවුපියන් දරුවන්ගේ ලෝකයෙන් දුරස් වීම සුබදායි නොවේ. දරුවන් හා මවුපියන් අතර තිබෙන බැඳීම මෙහෙකරුවකුගෙන් හෝ වෙනත් වැඩිහිටියකුගෙන් හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයකින් ලැබෙන්නේ නැත. දරුවන්ට ලැබිය යුතු මවුපිය ආදරය, සෙනෙහස රැකවරණය නොලැබෙනවා නම්, මුදල් පසුපස හඹාගොස් උපයන මුදලින් ප්‍රයෝජනයක් ඇත්දැයි සිතා බලන්න. පවුල සමාගමකට උපමා කර දැක්වූයේ නම්, එම සමාගමේ අධ්‍යක්ෂවරුන් වන්නේ සැමියා හා බිරිඳයි. එදා පැරැණි සමාජයේ ගෙදර සියලු කටයුතු කළේ බිරිඳ ය. සැමියා කුඹුරේ, හේනේ වැඩකට ගොස් එයින් ලබන ආදායම් ගෙනත් දුන්නේ බිරිඳ අතට ය. එම ආදායම, වගකීම හඳුනා ගනිමින් පවුලේ දියුණුව සඳහා සමබරව යොදාගත් අයුරු අපි දනිමු. අද දෙදෙනා ම බොහෝ විට රැකියාවක නියුක්ත ය. රැකියාවල ස්වභාවය පිළිබඳ දෙදෙනාට ම අන්‍යෝන්‍ය අවබෝධය තිබිය යුතු ය. ඒ අනුව නිවසේ කටයුතුවලට බාධාවක් නොවන අයුරින් තම තමන් සතු කාර්යභාරය කළමනාකරණය කර ගැනීම අත්‍යවශ්‍යය.

ජීවිතයක අධිෂ්ඨානයක් ඉලක්කයක් තිබිය යුතු ය. ඉලක්කය හා බැඳුණු ආශාව, උනන්දුව ජීවිතය සාර්ථක කරයි. අභියෝග, ප්‍රශ්න ගැටලු හමුවේ ඉදිරියට යෑම බුදුදහමෙහි 'සක්කෝ' ගුණය ලෙස දක්වා ඇත. බැහැ නොකිය පුළුවන් කියන අධිෂ්ඨානය අප තුළ ඇති කර ගත යුතුව ඇත. ජීවිතයේ ඉහළටම ගිය සමහර ජීවිත දෙස බලන්න.

කම්කරු ජීවිත ගත කළ සමහර අය ව්‍යාපාරික ක්ෂේත්‍රයේ උසස් ම චරිත බවට පත්වී ඇති අයුරු දැක ගන්නට පුළුවන. උනන්දුව හා අධිෂ්ඨානය තිබේ නම් ජය කණුව කරා ළං වීම අපහසු නොවනු ඇත.

තමන් කරන දේ අවංකව සෘජුව කරන්න. නිවැරැදි දේ, හරි දේ තෝරා බේරාගෙන කටයුතු කිරීම තුළින් ඔබට හැමදාම සතුටු විය හැකි ය. අයුක්ති අසාධාරණ දේ සිදු කර පසුව එහි විපාක විඳින්නට සිදු වන්නේ ඔබටම ය. එහිදී ඒ අසාධාරණ දේ කිරීමට පෙළඹවූ අය ඔබ සමඟ නැත. මේ නිසා කරන සෑම දෙයකදී ම අවංකව කාර්යභාරය ඉටුකරන්නට උත්සාහ ගන්න.

සමාජය තුළ ජීවත් වීමේ දී අපගේ වරදක් අඩුපාඩුවක් පෙන්වා දුන් විට එය පිළිගැනීමට අප සූදානම් විය යුතු ය. නොමඟ යන දරුවන් දෙස බලා මවුපියන් මොන තරම් මානසික පීඩනයකට පත්වෙනවා ද? ප්‍රේම සම්බන්ධතා මත්වතුර, මත්කුඩු, ජංගම දුරකථන ෆේස්බුක් හරහා මොනතරම් ළමා ජීවිත ආගාධයට පත්ව තිබෙනවා ද? ගෙදර සාලය තිබෙන්නේ බාර් එකක් කර ගැනීමට නොවේ. මුළු පවුලම ආගාධයට ඇද දමන මත්පැනින් වැළකීමට වර්ෂය ආරම්භයේ දී ම අධිෂ්ඨානයක් ඇති කර ගන්න.

යම් කෙනකුට මෙලොවදී ලැබිය හැකි ඉහළම ධනය සතුටයි. තමන් කරන කාර්යය දෙස බලා සතුටු විය හැකි අයුරින් වගකීම් ඉටුකරන්න. ව්‍යාපාරිකයෙක් නම් තම ව්‍යාපාරය දෙස බලා සතුටු විය හැකි ය. රැකියාවක් කරන්නේ නම් තම රාජකාරිය දෙස බලා සතුටු විය හැකි අයුරින් කටයුතු කරන්න. යුතුකම් හා වගකීම් නිසි පරිදි ඉටුකිරීම තුළින් ලබන සතුට මුදලට ගත නොහැකි ය. අවංකත්වය පැත්තකට දමා අනියම් මඟින් ලබන සතුට ඉක්මනින්ම වේදනාවක් බවට පත්වනු ඒකාන්ත ය.

නූතන තාක්ෂණික ලෝකයේ ප්‍රචාරක මාධ්‍ය තුළින් පාරිභෝගිකයා දිනා ගැනීමට ගන්නා උත්සාහය හැම පැතිකඩකින් ම දැකගත හැකි ය. මේවා ලබා ගන්නට රැකියා දෙක තුනකවත් නියැළෙන්නට සිදුවෙයි.


මේ අතෘප්තිකර තත්ත්වය මිනිසා ආතතියට පත් කරයි. මේ ප්‍රචාරණවලට වහලකු නොවී අපගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය දේ පමණක් තෝරා බේරාගෙන කටයුතු කිරීමට අප සූදානම් විය යුතු ය.

සමහර අයගේ ජීවිතය කාර්යබහුල ය. තමන්ට කරන්නට බැරි මට්ටමට ව්‍යාපාර අරඹා ඇත. තමන් කරන කුමන හෝ කාර්යයක් ඇත්නම් එය අවුලක් නොවී පහසුවෙන් හොඳට කිරීමට හැකි විය යුතු ය. අපට කරන්නට පුළුවන් මට්ටමට දිගටම කරගෙන යා හැකි අයුරින්, උසුලා ගත හැකි අයුරින් අපගේ කාර්යභාරය සීමා කර ගත යුතු ය. මෙය 'අප්පකිච්ච' නමින් සඳහන් ය.

කිසියම් ව්‍යාපාරයක් ආරම්භ කළා නම් එහි සාර්ථක මට්ටමට පැමිණි පසු ඒ හා සම්බන්ධ අනික් කොටසට අත තැබිය යුතු ය. කොයි ක්‍රමයකින් හෝ කරන්න බැරි තරමට වැඩ ගොඩක් පටලවා ගැනීම සියල්ල ම අසාර්ථක තත්ත්වයට පත්කරයි.

කාර්ය බහුල ජීවන ගමන ආතතියට මඟකි. දවස පුරාම මැෂින් එකක් සේ වැඩ කළත් සතුටක් නැත්නම් එබඳු ජීවිතයක ඇති ඵලය කුමක් ද?

ශරීරයට අනවශ්‍ය ලෙස දුක් නොදී අනවශ්‍ය සුඛෝපභෝගී ජීවිතයකටත් පත්නොවී සැහැල්ලුවෙන් මධ්‍යම ප්‍රමාණයේ ජීවිතයක් ගත කරන ආකාරය ගැන සිතන්න. ගෙවල් දොරවල්, ඇඳුම් පැළඳුම්, කෑම බීම, යානවාහන අනවශ්‍ය මට්ටමින් පරිහරණය කිරීමට නොසිතා තමන්ගේත්, පවුලේත් අවශ්‍යතා ඉටුවන අයුරින් කටයුතු කරන්නේ නම් මොනතරම් සැනසිල්ලක් ද? ඔබේ නිවසට එන අමුත්තන්ට පෙන්වීම සඳහා වටිනා භාණ්ඩවලින් ගෙය අලංකාර කර තැබීම අවශ්‍ය දැයි බලන්න. බොහෝවිට ගෙදර අය ඒවා පරිහරණය කරන්නේ නැත. ඒවා වසා පැත්තකින් තබා ඇත. එකම අරමුණ අන් අයට ප්‍රදර්ශනයයි. ඔබේ ඇස්, කන්, නාසාදී ඉන්ද්‍රියයන් අවබෝධයෙන් පරිහරණය කරන්න.



බළංගොඩ ශ්‍රී ධර්මානන්ද පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහ නා හිමි**

**තමන් හිංසා පීඩා ලැබීමට අකැමැති නම් අනුන්ට වධ හිංසා කිරීමෙන් වළකින්න**

# අභියෝග හමුවේ නොසැලෙන්න
# තැනට සුදුසු නුවණ දියුණු කර ගන්න

**ජීවිතයේ අරමුණු සපල කර ගැනුමට හිතනවා නම් එල්ල වන බාධක මැද ඉදිරියට යා යුතු වෙනවා. මෙහි දී අපි ඥානාන්විත වීමේ අවශ්‍යතාව යි ඉස්මතු වන්නේ. මෙයට තවත් දිය හැකි වචනයක් වන්නේ තැනට සුදුසු නුවණ යන්න යි. මේ කරුණ කරණීයමෙත්ත සූත්‍රයේ දී පෙන්වා දෙන්නේ"නිපකො" යන්නෙනු යි.**

එයින් ප්‍රකාශ වන්නේ ස්ථානොචිත ප්‍රඥාවෙන් යුක්ත විය යුතු ය යන මේ කියන කාරණය යි. නිපක කියන වචනයේ සාමාන්‍ය අර්ථය වන්නේ නුවණින් ක්‍රියා කළයුතු යන අදහසයි. එනම් නුවණැති බවයි. එහෙම වුණත් මෙම සූත්‍රයේ දී නිපක යන වචනයෙන් ඊටත් වඩා එහා ගිය පුළුල් අදහසක් ප්‍රකාශ වෙනවා.

එනම් යම් ක්‍රියාවක දී, වචන කථා කිරීමේ දී, සිතිවිලි ඇති කර ගැනීමේ දී ඒ ඒ අවස්ථාවට ඇතිවන ගැටලු හෝ වෙනත් බාධක අවස්ථාවන්හි දී එම බාධක මග හරවා ගෙන ඒ ඒ අවස්ථාවට සුදුසු වන ආකාරයෙන් අදාළ ප්‍රතිචාර දැක්වීමට ඇති කර ගන්නා නුවණ මෙයින් අදහස් කරනවා. එසේ වීමේ දී පුද්ගලයා වඩාත් නිවැරැදිව ස්වකීය සෑම ක්‍රියාකාරකමක්ම පවත්වනවා වගේ ම එයින් බාහිර සමාජයටත් තමන්ටත් විශාල මෙහෙවරක් ඉටු කරවා ගන්නට හැකියාව ඇති කර ගන්නවා.

කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමකගෙන් තමන්ට සුදුස කර්මස්ථානයක් ලබා ගෙන වනගතව හෝ ආරණ්‍යවාසීව සිටින භික්ෂුව තමන්ගේ කර්මස්ථානය වඩමින් සමථ හෝ විපස්සනා භාවනාවෙහි යෙදෙන විට එය සාර්ථක කර ගැනිමට අවශ්‍ය වන්නේ චතුසම්පජඤ්ඤයෙන් ක්‍රියා කිරීම යි.

සාත්ථක සම්පජඤ්ඤය, සත්ප්‍රාය සම්පජඤ්ඤය, ගොචර සම්පජඤ්ඤය හා අසම්මොහ සම්පජඤ්ඤය යන සතර ආකාර මනා වූ සිහිනුවණ පවත්වාගෙන ක්‍රියා කිරීම අදහස් වෙනවා.

සාත්ථක සම්පජඤ්ඤය කියලා කියන්නේ තමන් ගත් කමටහන අනුව එය සාර්ථකව සිදු වන්නේ ද යන නුවණින් යුක්තව ක්‍රියා කිරිම යි.

සත්ප්‍රාය සම්පජඤ්ඤය කියලා කියන්නේ තමන්ට යෝග්‍ය වූ හෙවත් ගැලපෙන කර්මස්ථානයෙහි තමා සතියෙන් පිහිටා සිටින්නේ ද යන අවදියෙන් සිටිම යි.

ගොචර සම්පජඤ්ඤය කියා කියන්නේ එම යෝගාවචර භික්ෂුව තමන්ගේ ගොදුරු තම තුළ පිඬු පිණිස හැසිරීමාදියෙහි තමන්ගේ කර්මස්ථානයට බාධක නොවන අන්දමින් එම අරමුණ සතියෙහි පිහිටුවා ගැනිම යි. අසම්මොහ සම්පජඤ්ඤය කියලා කියන්නේ යාම්, ඊම් ආදි සියලු ඉරියව් පැවැත්වීමේ දී හැම විටම නුමුළාව සිහි නුවණින් ක්‍රියා කිරිම යි.

මේ කියන චතුසම්පජඤ්ඤයෙන් යුක්තව නිපක බව දියුණු කර ගැනීමට නම්, භික්ෂුව තමන්ට අයත් වන සිවුරු මැසීම් ආදිය ගැන විමසිලිමත් විම, තමන්ගේ කර්මස්ථානය වැඩිමට අදාළ සෙනසුන් ආදිය පිළිබඳ සුදුසු නුසුදුකම් ආදිය පිළිබඳ විමසිලිමත් විම, විනය විචාරීමට අවශ්‍ය වන කාලය පිළිබඳ විමසිලිමත් වීම, යන කරුණු අත්‍යවශ්‍ය වෙනවා.

මේ අනුව බලනවිට කර්මස්ථානයක් තමන්ගේ චරිතානුකූලව ලැබුණු පසුව ඊට අනුව තමන්ගේ දිවි පැවැත්ම හැම අතින්ම පවත්වා ගෙන යාමත්, ඒ ඒ අවස්ථාවන්හි දී භාවනානුයෝගිව කටයුතු කිරීමේ දී ඒ ඒ අවස්ථාවට සුදුසු වන ආකාරයෙන් නුවණින් යුක්තව ක්‍රියා කිරිමත් අදහස් කෙරෙන බව මෙහි දී තේරුම් ගත යුතු ව පවතිනවා.

දැන් අප විසින් විමසා බලන්නට අවශ්‍ය කරන්නේ මෙම සූත්‍ර දේශනාව භික්ෂූන් වහන්සේට අදාළ වන්නක් වුවත් සාමාන්‍ය ගිහි ජීවිත ගත කරන අප සමාජයෙහි ජීවත්වන අයට මේ නිපක යන ගුණයෙන් ප්‍රායෝගිකව අත්විඳිය හැකි ඵලය කුමක් ද යන්න ගැනයි. දැන් සාමාන්‍ය ගිහි ජීවිත ගත කරන උදවිය තමන්ගේ ජීවන ගමන පිළිබඳ සැලසුමක් වගේම ඒ සැලසුම සඵල වීමෙන් තමන් අපේක්ෂා කරන ඉල්ලක්කය කුමක් ද යන්න පිළිබඳ විමසිල්ලෙන් ක්‍රියා කිරිම වැදගත් වන බව මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු වෙනවා. ඕනැම පැවිදි හෝ ගිහි ජීවිත ගත කරන හැම කෙනෙකුටම යම් ඉලක්කයක් සාධනය කර ගන්නා අයුරෙන් තමන්ගේ ජීවිතය ගොඩනඟා ගැනීම අත්‍යවශ්‍ය කරුණක්. එහි දී පළමුවෙන් ම වැදගත් වන්නේ ඊට අවශ්‍ය සැලසුම යි. එම සැලසුම කියලා කියන්නේ



මහනුවර අස්ගිරි මහා විහාරයේ කාරක සංඝසභික හා උපාධ්‍යාය ධුරන්ධර වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක මහාචාර්ය
**තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**

එහි දී ඉලක්කය කරා ළඟා විමට අවශ්‍ය ක්‍රියාකාරි වැඩපිළිවෙලයි.

සෑම ඉගෙන ගන්නා දරුවකුටමත් ඉලක්කයක් තිබෙනවා. ඉතින් නිදසුනක් ගත්තොත් පාසලේ පස්වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන ශිෂ්‍ය දරුවාගේ අද පවතින ඉලක්කය වන්නේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය සමත්වීම යි.

ඒ මොකටද? තවදුරටත් ඉහළ යැයි පිළිගත් පාසලකට ඇතුළත් වී ඉදිරි අධ්‍යාපනික ජයග්‍රහණ හිමි කර ගැනුමට යි. ඉතින් ඒ ඉල්ලක සපුරා ගැනීමට නම් දරුවා ඊට අවශ්‍ය අධ්‍යාපනික සාධනයන් ශක්තිමත් කර ගත යුතු වෙනවා. ඉතින් ඒවා සම්පූර්ණ කර ගැනීමට නොයෙක් බාධක ඉදිරිපත් වෙනවා.

> **"නිපක කියන වචනයේ සාමාන්‍ය අර්ථය වන්නේ නුවණින් ක්‍රියා කළ යුතු යන අදහසයි. එනම් නුවණැති බවයි. එහෙම වුණත් මෙම සූත්‍රයේ දී නිපක යන වචනයෙන් ඊටත් වඩා එහා ගිය පුළුල් අදහසක් ප්‍රකාශ වෙනවා."**

මෙහි දී පළමුවැනි අවශ්‍යතාව තමා, තම මව්පියන්ගේ ඉදිරිපත් වීම. ඉතින් ඒ කාර්ය සඵලවන තරමට තමා, දරුවාට පළමුවැනි බාධකය ජයග්‍රහණය කර ගත හැකි වන්නේ. ඉතින් එවැනි අවස්ථාවක දී දරුවා ඊට අවශ්‍ය වන ආකාරයෙන් ක්‍රියා කළ යුතු වෙනවා. මව්පියන්ගේ ආදරය කරුණාව දිනා ගන්නා තරමට යි දෙමාපියන් දරුවන් පිළිබඳ උනන්දු වන්නේ.

ඒ වගේම දරුවාගේ ඒ අරමුණ ඉටු කර ගැනීමේ දී වැඩිහිටි මව්පියන්ගේ ආර්ථික තත්වය ශක්තිමත් බව ද වැඩි කර ගැනීමට සිදු වෙනවා.

ඒ මොකට ද මේ දරුවන්ගේ අමතර අධ්‍යාපන වියදම් පිණිස. ඉතින් මෙවැනි අවස්ථාවල දී මව්පියන් ද ස්ථානෝචිත නුවණින් යුක්තව අවශ්‍ය කරුණු කාරණා සොයා බලා, විමසිලිමත් වී ස්ථානෝචිත ප්‍රඥාව යොදවා තමන්ගේ ආර්ථික අපහසුකම් දරුවාගේ ඉදිරි අධ්‍යාපන කටයුතුවලට බලපාන ආකාරය විමසිලිමත් වී ඊට අවශ්‍ය ආධාර උපකාර බාහිර පාර්ශ්වයන්ගෙන් ලබා ගෙන හෝ ක්‍රියා කිරීමටත්, තැනට සුදුසු නුවණ මෙහෙයවා දරුවාගේ අභිමානයට හානි නොවන ආකාරයෙන් තම ඥාති හිතෛෂීන්ගේ, පරිත්‍යාගශීලීන්ගේ උදව් උපකාර පවා පැතීමට සිදු වෙනවා.

මේ ආකාරයෙන් බොහොම හොඳ සිහියෙන් හැම ක්‍රියාමාර්ගයක් ම ගැනීමෙන් ඉලක්ක ගත ඒ අරමුණ සඵල කර ගැනීමේ හැකියාව ඇති කර ගන්නවා.

දරුවාත් විභාගයෙන් උසස් ලෙස සමත් වෙන්නට නම් වේලාවට විභාග ශාලාවට පැමිණීම, ප්‍රශ්න පත්‍රය නිවීසැනසිල්ලේ කියවා කරුණු මැනවින් තේරුම් ගෙන තැන්පත්ව, කලබල නොවී පිළිතුරු ලිවිම කළ යුතු වෙනවා.

මෙලෙස කිසියම් කාර්යයක් සඵල කර ගැනීමේ දී මනා හේතුඵල සම්බන්ධතාවක් ඇතිව මේ හැම ක්‍රියාවක් ම සිදුවනවා වගේම ඊට තැනට සුදුසු නුවණ මෙහෙයවීම නිසා විවිධ බාධක මඟහරවාගෙන ඉලක්ක සපල කර ගන්නට හැකියාව උදා කර ගන්නට පුළුවන්කම ඇති වෙනවා.

***මෙම ලිපියේ ඉතිරි කොටස මැදින් අව අටවක පෝදු (15) අන්තර්ජාල කළාපයේ පළවේ.***



බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
දුරකථන - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## මැදින් පුර පසළොස්වක 2023-03-06

# සිතන්නට නොහැකි තැන...

ළමා ලෝකය පිවිතුරු ය. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය,වෛරය, පළිගැනීම ආදී පිළිකුල් සහගත සිතිවිලිවලින් ඔවුහු ජරා ජීර්ණ නොවෙති. ළමයින් මල් වගේ යැයි කියන්නේ එහෙයිනි.

ඒ මල්වන් දරුවන් නියෝජනය කරන ඇතැම් දූ පුතුන් අතින් නොවිය යුතු දේ ද වෙන අවස්ථා දැන් දැන් සමාජය කැළඹීමට පත් කරනු පෙනේ. වැරැදිකරුවන් ලෙස ඊට වගකිවයුතු ඒ දරුවන් ම ද යන්න සාකච්ඡාවට බඳුන් විය යුතු සේ ම වරදට හේතු සොයා ඊට පිළියම් යොදන්නට මන්දගාමී වූයේ නම් ළමා පරපුරේ විනාශය ද නොවැළැක්විය හැකි තැනට වැටෙනු ඇත.

ළමයා ජීවිතය ඉගෙන ගන්නේ අනුන් දෙස බැලීමෙනි. අත්හදා බලන්නේ තම සමීපතමයන් ය. පිපෙන්නටත් පෙර ළමා ලෝකය පරව යනවා නම් ඒ, අනුකරණය කළ ආදර්ශයේ වරද නිසා ය. දරුවන් හැදෙන වැඩෙන පරිසරය නිසැකයෙන් ම යහපත් විය යුතු එහෙයිනි. යම් හෙයකින් නිවැරැදි කළ නොහැකි වරදක් වූවාට පසු ඒ ගැන එකිනෙකාට චෝදනා නැගුවාට පලක් නැත. නිවැරැදි ආකල්පවලින් පොහොසත් විය යුතු වරදින්නට පළමුව ය.

මවුපිය ගුරුවරුන් ගැන, අසරණයකු දුටු තැන, දුකකට, කරදරයකට පිහිට විය යුතු තැන සංවේදී වන තැනට, ළමා මනස ගොඩනැඟිය යුතුව තිබේ. නැතහොත් අද ද පිරිහී, හෙට ද තිරස්චීනයන් බඳු මනු සතුන් නිසා සමාජය වල්මත් වීම නොවැළැක්විය හැකි වනවාට සැකයක් නැත.

මීට දින කිහිපයකට පෙර අපට අසන්නට ලැබුණ, ළමයින් කිහිප දෙනකු එක්වී මහමඟ දී අවවාද දුන් තමන්ගේ ම පිය කෙනෙක් බඳු එක්දරු පියකුට මිය යන තුරු හිස්වැසුමකින් පහර දීමේ වේදානාබර සිදුවීම පසුපස ඇත්තේ ළමයින් අසංවේදීවීමේ, අකාරුණිකවීමේ, අඥානවීමේ භයානක ප්‍රතිවිපාකය යි.

වැඩිහිටියකුගේ අවවාදයක් පිළිගන්නට, වැඩිහිටියකුගේ බසට කීකරු වන්නට නොහැකි ළමාකම අඳුරු අනාගතයක පෙර මං සලකුණු ය.

බුද්ධියක් හදවතක් නැති තැන නොවිය යුතු දේ සිදුවීම වැළැක්විය නොහැකි ය. තමන් කරන කියන දැයෙහි විනාශය නොදකින්නේ හිතන්නට හැකියාවක් නැති තැනැත්තා ය.

පෙර බරණැස් නුවර සිටුවරයකුට දාසියක් විය. ඕ රෝහිණී නම් වූවා ය. ඇය අඥාන ය. දිනක් රෝහිණීගේ මව ඇය වී කොටමින් සිටි තැනට පැමිණ අසලින් හිඳ ගත්තී, මදුරුවන්ගෙන් ගැහැට විඳින්නට වන්නී ය. දියණිය ඇමතූ මහලු මාතාව උන් එළවන ලෙස කීවා ය. රෝහිණී ද කිහිපවරක් මැස්සන් එළවූවා ය. එහෙත් උත්සාහය නිෂ්ඵල විය.

මදුරුවෝ නැවත නැවත මවට කරදර කරන්නට විය. දැන් මහලු මව නින්දේ ය. අම්මාට කරදර කරන මදුරුවන් ගැන රෝහිණී ගේ සිත සිතෙහි තරහක් ඇතිවිය. මුන් මරා දමන්නට ඕනෑ යැයි සිතූ ඇය මදුරුවන් සිය මවගේ හිස වසන තුරු බලා සිට මෝල් ගස ඔසවා වැරෙන් පහර දුනි. මදුරුවෝ ඉගිලී ගියහ. මෝල්ගස් පහර හිසේ වැදී මහලු මව එතැනම මැරී වැටුණාය. රෝහිණී මහත් දුකින් වැළපෙන්නට වූවාය.

මේ අඥානකමේ පල ය. එය අතීතයට, වර්තමානයට, අනාගතයට කියා වෙනසක් නැත. අඥානකම සමීපයේ ම විපත ද, විනාශය ද ඇත.

අපේ ළමා පරපුර පොතපතේ දැනුමෙන් සේ ම ගුණවත්කමින් ද පොහොසත් කළ යුතු ය. ඔවුන් යාන්ත්‍රික බවින් මුදවා හිතන්නට ශක්තියක් ඇති සංවේදී පිරිසක් බවට පත් කළ යුතු ය. සමාජයට ද පිළිලයක් වී දරුවන්ගේ මුළු ජීවිතය ම වැනසී යන්නේ එසේ නො වන තැන ය.

# මරණයට නොබියව මුහුණ දෙන්න අප්‍රමාදී වන්න

සිහි නුවණින් කුසලයෙහි යෙදීම, කෙලෙස් දුරුකිරීම, නොබැඳී නොඇලී යහපත් පැවතුම් ඇතිව නිවනට මඟ සලසා ගැනීම පමා නොවීමයි. කෙලෙස් මඩින්නට නම් මුලා නොවිය යුතු ය. සිහිනුවණ උපදවා ගත යුතු ය.

ඇස, කන, නාසය, දිව, ශරීරය යන පංචේන්ද්‍රියන් පංච උපාදානස්කන්ධයන් සමඟ නිරන්තර බැඳීමකට ලක්වන අතර, මෙය මම ය මාගේ ය වශයෙන් නොගෙන අත්හැරීමට මඟ සලසා ගැනීම ම පමා නොවීමයි. එය අප ලබන උතුම් භාග්‍යය ද වේ.

පමා වූවෝ සසර සැරිසරන්නට හේතුවන බැඳීම් ඇති හෙයින් ඉපදීම් මැරීම් මූලික කොටගත් දුකින් පෙළෙන්නෝ ය. පමා වන්නෝ මරණයට බිය වෙති. අප්පමාදි වූවෝ මරණයට බිය නොවෙති.

හිරි ඔතප් ධර්මය පිළිබඳ දැන සකස් වීම අප්‍රමාදී බව වේ. පවට ඇති ලජ්ජාව, පවට ඇති බිය පිළිබඳ විමසුම් ඇසක් ගොඩනඟා ගත යුතු වේ.

පංචශීලය තුළ ශික්ෂණයක් ගොඩනැඟීම මූලිකව මේ සඳහා උපකාරී වේ. එයින් වර්ධනය වන මානසික ස්වභාවයන් තුළ අටසිල් දසසිල් දක්වා අප අපම වර්ධනය වීම හා දස කුසල්, අටමහ පින්කම් මෙන්ම දස පුණ්‍ය ක්‍රියාවල නිරතවීම ද අප්‍රමාදී බව වේ.

මේ තුළින් ලෞකික සම්මා දිට්ඨියක් ඇතිවන අතර, ලෝකෝත්තර සම්මා දිට්ඨියකට මග සකස් වීම ද සිදුවන්නේ ය.

වෙසෙසින් දැනුම ඇත්තා අප්‍රමාදී වේ. ඔහු නිවන් පසක් කරනා අයුරු ද පමා වීමෙන් මැරි මැරි සසර දුකට පත්වන අයුරු ද තතු ලෙස අවබෝධ කර ගනී. බෙහෙවින් සතුටට ද පත්වන අතර නොපමාව ගුණ රැකීමේ අගය අන් අයට කියා දෙයි. තමා ද නිරන්තරයෙන් නොපමා බව අගය කරනා සේ ම සිව්සස් අවබෝධයට අවශ්‍ය කරුණු ප්‍රගුණ කරන අතර, අන් අයට එය අවබෝධ වීමට ද ඉඩ හරිනු ලබයි.

නැඟී සිටි වීර්යයෙන් යුතුව කුසීතකම, කම්මැලිකම මැඩගෙන යහපත සඳහා කය, සිත වෙනස්වීම, පුද්ගල දියුණුව සේ ම යසස, කීර්තිය ඔප් නැංවෙන කාරණාවක් ද වේ. විශේෂයෙන් ලෞකික සිත නිතරම පැරැණි හුරු පුරුදු කරා යාම ස්වභාවික ය. සිත අලුත් මුහුණුවරකට ගෙන යාමට නම් මහත් වෙහෙසක් දැරිය යුතු වේ. ඒ ගන්නා වූ උත්සාහය "සම්මා වායාමය" වේ. "සම්මා වායාමය" නොපමා බවේ ප්‍රබලතම සාධකය වේ.

නූපන් අකුසල් නූපදවීම
උපන් අකුසල් නැති කිරීම
උපන් කුසල් වැඩි දියුණු කිරීම

ආදී මේ උත්සාහයන් තුළ කායික, වාචසික, මානසික අභිවර්ධනය සිදුවේ.

කුසල් අරමුණක් මත සිත පිහිටුවා ගැනීමට හැකියාව වර්ධනය වේ. සතිමත් බව සියලු කාරණාවෙහි යුතු අයුතු බව වටහා ගන්නා බවයි. කය අනුව බැලීම වේදනාව අනුව බැලීම, ධර්මය අනුව බැලීම සිත අනුව බැලීම විවිධ අරමුණු කෙරෙහි විසිරී ගිය සිත එකමුතු කොට සිහිය පිහිටුවා ගැනීම ම අප්‍රමාදී බව වේ.

සියලු දෙයෙහි විමසීම, හික්මුණු කය, වචනය, සිත ඇතිකර ගැනීම, දැහැමින් දිවි පවත්වා ගැනීම, ගිහියන් නම් පවින් වැළැකී වැරැදි වෙළඳාම් ආදී ජීවන ක්‍රියාවන් තුළින් ඈත්ව, පැවිද්දකු නම් ආර්ය ශීලයෙහි පිහිටා කටයුතු කිරීම ආදි ගුණාංග මත අප්‍රමාදී ගුණය නිතැතින් ම ආරක්ෂා වේ.

වර්තමාන සාමාජීය ක්‍රියාවලිය තුළ පමාවීම අප්‍රමාණ ය. විවිධ ක්‍රියාකාරකම් තුළ පමාවීම ගැන විවිධ කතිකා පවත්වන්නෙමු. දිනපතා වේලාව හඳුනා නුවණින් පරීක්ෂා කොට කළමනාකරණ න්‍යායන් ජීවිතය තුළට ඇතුළත් කොටගෙන කාලසටහන් ක්‍රියාවලියක් තුළ හා අන්‍යෝන්‍ය ළබැඳියාව සබැඳියාව තුළ කටයුතු කිරීම මඟින් පමාව පරයා නොපමාව වර්ධනය වන්නේ ය.

ශාස්ත්‍රපති
**බඩල්ගම සුමේධ හිමි**



# වරදක් සිදු වූ සැණින් සිහිය පිහිටුවාගෙන


## ආයති සංවරය ඇති කර ගන්න

**ප්‍රඥාව සීලයෙන් පිරිසුදු වේ. සීලය ප්‍රඥාවෙන් පිරිසුදු වේ. සිල් ඇති තැන ප්‍රඥාව වේ. ප්‍රඥාව ඇති තැන සිල් වේ. සිල් ඇත්තාට ප්‍රඥාව ඇත. ප්‍රඥාව ඇත්තාට සිල් ඇත.**

සීල ප්‍රඥා දෙක වනාහි ලෝකයෙහි අග්‍ර යැයි කියනු ලැබේ. සෝණදණ්ඩ සූත්‍ර දේශනාවෙහි සඳහන් මෙම විවරණය චතුරාර්ය සත්‍ය ධර්ම අවබෝධය නම් වූ සම්‍යක් ප්‍රඥාව පරිපූර්ණයේ දී අවශ්‍ය පිළිවෙළ කථාව පෙන්නුම් කෙරේ. මේ අනුව සීලය සහ සම්‍යක් ප්‍රඥාව අතර, සුවිශේෂී සම්බන්ධයක් පවතී. නිවන් මඟ නම් වූ ආර්ය අෂ්ඨාංගික මාර්ග අනුගමනය කිරීමේ දී සීල, සමාධි, ප්‍රඥා නමින් ත්‍රිශික්ෂා සම්පූර්ණ කළ යුතු ප්‍රතිපදාවක් ලෙස ද පෙන්නුම් කෙරේ.

මනාකොට සිත ක්ලේශ ධර්මයන්ගෙන් මිදෙන්නේ සම්‍යක් ප්‍රඥාව වැඩුණ කල්හි ය. ප්‍රඥාව අංග සම්පූර්ණ වන්නේ නීවරණ ධර්මයන්ගෙන්, බාධා නොවී ආනන්තරික සමෘද්ධියක් ම වීමෙනි. එනම් අකුසල ධර්මයන්ගෙන් පීඩා නොවන සිතේ සමාහිත බවයි. ඒ ආකාරයේ බලවත් වූ සමාධිය පිණිස සීලය මනා ලෙස පරිභාවිත විය යුත්තේ ය.

මේ අනුව සීලය සම්පත්තියක් ලෙස ප්‍රතිපදා මාර්ගයට එකතු කර ගත යුත්තේ ය. මෙම ප්‍රතිපදා මාර්ගයට අනුගත වන ශ්‍රාවකයා හෝ ශ්‍රාවිකාව විසින් තමා කෙරේ අවබෝධයෙන් යුතු විශ්වාසයක් ගොඩනඟා ගත යුත්තේ ය. එය අප විසින් හඳුන්වන්නේ ශ්‍රද්ධාව ලෙස ය. බුදුරජාණන් වහන්සේ, ධර්ම මාර්ගය සහ ආර්ය සංඝයා කෙරේ පැහැදීම් ගුණයට සිත අවතීර්ණ වන විට තමා කෙරේ උත්තේජනයක් ඇති වන්නේ ය. එම ශ්‍රද්ධාව නිසාම සසර පිළිබඳවත් ධර්ම සංවේගයෙන් යුතු බියක් හට ගන්නේ ය. කෙළවරක් දක්නට නැති මේ දිගු සසර ගමනේ ඇති බියකරු බව වටහා ගන්නේ ය. භාග්‍යවතුන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව තිස්එකක් සක්වල සියලු සත්වයෝ ම ඔවුන්ගේ අතීත සංසාර ගමනේ වැඩිපුරම උපත ලබා ඇත්තේ නරක, තිරිසන්, ප්‍රේත අසුර නම් වූ සතර අපායේ ය. එම සතර



බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනෙහි ප්‍රධාන අනුශාසක ආචාර්ය

**මිරිස්සේ ධම්මික නා හිමි**

අපායෙන් මිදී ලැබූ මෙම මනුෂ්‍ය ජීවිතය පිළිබඳ සැනසිල්ලක් ඇති කර ගත යුත්තේ ය. දුක් ඇති භවගාමී ජීවිතයේ මේ ලැබූ අවස්ථාව තවදුරටත් දුකට ම ඇද දමා ගන්නේ ද, දුකින් නිදහස් වීමට ප්‍රතිපදාව අනුගමනය කරන්නේ දැයි ශ්‍රාවකයා විසින් සතිය සිහිය පැවැත්විය යුතු වෙයි. මේ අවස්ථාව අවිද්‍යාවෙන් බැහැර වෙන විද්‍යාවට සමීප වීමක් ලෙස දැක්විය හැකි ය.

වර්තමාන පරිසරයේ බොහෝ පිරිසක් අවිද්‍යාවේම ගැලී සිටිනා බවක් පෙනේ. ඔවුන්ට මේ ලැබූ වටිනා අවස්ථාව පිළිබඳ සිතන්නට තරම් ඕනෑකමක් නැති බව ද පෙනේ. කල්‍යාණවන්තයන් විසින් පෙන්නුම් කොට දුන්නේ ද ඒ පිළිබද සිහිය නොපිහිටුවන බවක් ද පෙනේ.

සීල සම්පත්තිය හෙවත් සීල සම්පදාව ලෙස හඳුන්වා දෙන්නේ කුමන අර්ථයෙන් ද? සමාධි ප්‍රඥා වැඩීමට අවශ්‍ය මූලික පරිසරය සකසා ගැනීමේ දී අවබෝධයෙන් එයට අනුගත වීමයි. සම්පදාවයි. සම්පත්තියයි.

එමෙන්ම සීලය හේතුකොටගෙන කුසලාරම්මණයන් කෙරේ සිත සිහිය පිහිටුවා ගැනීමේ සමෘද්ධිමත් බවයි.

යම් අයෙක් කායික සහ වාචසික සංවර බවක් ඇති කරගත්තේ ද එය සීලමය සම්පදාවක් බවට පත්කර ගෙන නැත. එනම් සීලයෙන් ඇතිවිය යුතු සමෘද්ධිමත් බව ලබා ගෙන නැත. සීලයට සම්‍යක් ප්‍රඥාව ස්පර්ශ විය යුතු බව මුලින් දැක්වූවෙමු. ඒ අනුව මනසෙහි ඇතිවන චිත්ත පාරිශුද්ධියෙන් මෙහෙයවනු ලබන චේතනා, වචන, කායික ක්‍රියාවන් සිද්ධ විය යුත්තේ ය.

යම් කෙනෙක් සමාජය ඉදිරියේ බොරු කීමෙන් හෝ පරුෂ වචන භාවිතයෙන් වැළකුණ ද සිතෙහි දූෂ්‍ය බව රඳවා තිබෙන්නට හැකි ය. එනම්, දැඩි ආශාව, තරහව , වෛරය, පළිගැනීම, බද්ධ වෛරය, දැඩි රාගී සිතිවිලි ආදියෙහි පැවැත්මයි.

අශ්‍රැතවත් පෘථග්ජන සිත්වල මේවා හටගැනීම ස්වභාවික ය. එනමුත් එම පාපි සිතිවිලි වැඩෙන්නට නොදී අනුක්‍රමයෙන් බැහැර කිරීම ශ්‍රාවකයාගේ ප්‍රතිපදාව විය යුත්තේ ය. කුසලාරම්මණ සකස් වන සමාධියට පීඩා නොවිය යුත්තේ ය. කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක වශයෙන් සකස්වන මෙම ක්ලේශ ධර්මයෝ වැඩෙන්නට ඉඩ නොදී අවබෝධයෙන් ඒවා සිතෙන් බැහැර වීමට සිත සිහිය පිහිටුවා ගැනීම සීල සම්පදාවේ ලක්ෂණයයි.

මෙසේ සීල සම්පදාව පවත්වන්නා දුර්වලයෙක් නොවේ. ඔතෑනි, නියාලු, අදක්ෂ පුද්ගලයෙක් ද නොවේ. ඔහු හෝ ඇය මානුෂික ගුණාංග ඉදිරියේ දී ක්‍රියා සම්පන්න දක්ෂ පුද්ගලයෙකි. එනමුත් අෂ්ටලෝක ධර්මතා ඉදිරියේ දී අකම්පිත වූවෙකි. අරමුණ ඉටු කර ගැනීමේ දී තෘෂ්ණාවෙන් උද්දාමයට පත් නොවේ. තමා උසස් කොට අන් අය පහත්කොට නොසලකයි. නිසල විලක් සේ මනසෙහි ශාන්ත භාවය පවත්වන්නෙකි. සිතේ කෙලෙස් බහුලව පවත්වා ගෙන පෙනුමෙන්, වචනයෙන් සහ ක්‍රියාවෙන් මායාකාරී හෝ රැවටිලි සහිතව හැසිරෙන්නෙක් නොවේ.

අශ්‍රැතවත් පෘථග්ජන බවෙහි පැවතියත් කල්‍යාණ පෘථග්ජන නම් වූ කුසල් අකුසල් නිවැරැදිව දැන කුසල් මඟෙහි සිත පවත්වන්නෙකි. එනම් සම්මුතිය හා පරමාර්ථය යම් සේ ද ඒ අයුරින් අවබෝධ කර ගනිමින් ලෝභාදී කෙලෙසුන්හි ප්‍රහාණය පිණිස ප්‍රධන් වීර්ය වඩන්නෙකි.

මින් අනතුරුව අප විස්තර කරන ආයති සංවරය නම් කුමක්ද? වරදක් සිදුවූ විට එය ධර්ම විනයට ගළපා අවබෝධ කර ගෙන, නැවත වරද සිදු නොවෙන්නට තමා කෙරේම ආධ්‍යාත්මික පොරොන්දුවක් ඇතිකර ගැනීමයි. හැකි නම් හෝ ගුරුවරයා ගේ කල්‍යාණවන්ත සත්පුරුෂයෙක් ඉදිරියේ නිවරැදි වීමයි. මතු එම වැරැද්ද හෝ වැරැදි සිදු නොවීමට ආධ්‍යාත්මික පොරොන්දුවක් තමා කෙරේම ඇතිකර ගැනීමයි. අත්තානුවාද භය, පරානුවාද භය, දණ්ඩ භය, දුග්ගති භය වශයෙන් සලකා සිත, කය වචනයෙන් සිදුවූ හෝ සිදුවන වැරදිවලින් නිදහස් වීමට අධිෂ්ඨාන කර ගැනීමයි. නැවත එවැනි වරදක් සිදු නොවීමට චිත්ත අධිෂ්ඨානය බලවත් කර ගැනීමයි.

මෙසේ නොවීම ධර්ම විනයෙන් පිරිහීමයි. අනාගත සමාධියක් හෝ සම්‍යක් ප්‍රඥාවක් ලබන්නෙක් බවට පත් නොවීමයි.

එපමණක් ද නොවේ. මෙම බාල පුද්ගලයා විසින් වරද, වරද ලෙස දකින්නෙක් නොවේ. වරද දුටුව ද එය තම වරදක් ලෙස පිළිගන්නේ ද නැත. වරද නිවැරැදි කර ගන්නේ ද නැත. වරද පෙන්වා දෙන සත්පුරුෂයා කෙරේ දණ්ඩෙන් පහර කෑ සර්පයෙක් ලෙස කිපෙන්නේ ය. තරහවෙන් වෛරයෙන්, ක්‍රෝධයෙන් යුතුව ප්‍රතිචාර දක්වන්නේ ය. පිටෙහි ඇමිනිණු පොකුරු කටු වළල්ලක් සේ සිතිවිලි , වචන, ක්‍රියාවන් තරහව, වෛරය, පලි ගැනීමෙන් ම පවත්වා ගනිමින් සිටින්නේ ය.

මෙහිදී කල්‍යාණවන්තයාගේ සත්පුරුෂයන් විසින් එවැනි පුද්ගලයන් කෙරේ අනුකම්පාවෙන්ම නැවත නැවතත් වරදෙහි ආදීනව පෙන්වා දී ආයති සංවරයෙහි පිහිටුවීමට උත්සාහ ගත යුතු වෙයි. එයට හේතුව මේ අඥාන පුද්ගලයා නිසා ඔහුට හෝ ඇයට පමණක් නොව බොහෝ පිරිසකට අනර්ථයක් වන බැවිනි.

මේ අනුව නිවන් මඟෙහි සම්පදා සතරක් මූලික පියවරෙහි පටන් අනුගමනය කළ යුතු වෙයි. එනම් ශ්‍රද්ධා සම්පදා, සීල සම්පදා, චාග සම්පදා , පඤ්ඤා සම්පදා යනුවෙනි. වරද සිදුවූ තැන සිහිය පිහිටුවාගෙන ආයති සංවරයෙහි පිහිටිය යුතු වන්නේ ය.



**අටලෝදහම පෙරළෙන රිය සකක් වැනි බව දැන ඊට මුහුණ දෙන්න**

# ශ්‍රී ලංකා විදේශ බෞද්ධ වන්දනා ගමන් සංවිධායකයන්ගේ සංගමය

## BUDDHIST OVERSEAS PILGRIMAGE TOUR ORGANIZERS ASSOCIATION OF SRI LANKA

සමාගම් රෙජිස්ට්‍රාර් ලියාපදිංචි අංකය : S12353
(බුද්ධශාසන අමාත්‍යාංශයේ බෞ: කං:පි: දෙපාර්තමේන්තුවේ අනුමත සංවිධානයකි)
Web : www.buddhistpilgrmageassociation.com

Company Register Registration Number - S12353
(Registered by Ministry of Buddhasasana at Dept. Buddhist Affairs)
Email: organizersassociation 1994@gmail.com

### දඹදිව වන්දනාවේ යන සියලු දෙනා වෙත දැනුම් දීමයි

ශ්‍රී ලංකා විදේශ බෞද්ධ වන්දනා සංවිධායකයන්ගේ සංගමය 1994 වර්ෂයේදී බුද්ධ ශාසන අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව පිහිටුවා ගන්නා ලද සංගමයකි. අප සංගමයේ ලියාපදිංචිය ලබාගත් සංවිධානවල විස්තර මෙහි පහත සඳහන් කර ඇත. මෙම සංවිධානවලින් දඹදිව වන්දනාවේ යාමේදී විශ්වාසය හා වගකීම ඉහළම අයුරින් සැලසෙනු ඇත. පහත නම් සඳහන් සංවිධානවලින් බුද්ධභූමි වන්දනාවේ යෙදෙන ඔබට යම් ගැටලු සහගත තත්වයකට මුහුණ දීමට සිදුවුයේ නම් ඔබගේ ගැටලුවට සාධාරණ විසඳුමක් ලබා දීමට වගකිව යුතු සංගමයක් ලෙස ක්‍රියා කරමු.

ගරු ලේකම්, ශ්‍රී පඤ්ඤානන්ද පිරිවෙන, මාහරගම, ගිරිඋල්ල.

දුරකථන : 071-8391938, 077-9036364

| සංවිධායකගේ නම | සංවිධානයේ නම | ලිපිනය | දු. අංකය |
|---|---|---|---|
| සී.ඒ.ඒ. ගුණසේකර | ශ්‍රී ජයවර්ධනපුර ට්‍රැවල්ස් | 553/101, සමගි මාවත, බෝකුන්දර පාර, ඇරැව්වල. | 0112841354 |
| ඩබ්.එම්. විජයසිංහ | ශ්‍රී ලංකා භාරත සංචාරකයෝ | 317, ශාන්ත ජෝසප් වීදිය, තෙල්වත්ත හංදිය, මීගමුව. | 0777876241 |
| එන්. ජේ. ද ෆොන්සේකා | ස්කැන්වෝ ට්‍රැවල්ස් | 62/8, 04 වන පටුමග, නාගොඩ, කළුතර. | 0777390038 |
| රම්‍යා කරුණාතිලක | කේ.එස්. එන්ටප්‍රයිසස් | 70/16, සුරම්‍යා මාවත, ඇල්හේන පාර, මහරගම | 0112850620 |
| හර්බට් පරාක්‍රම විජේතුංග | ලෝටස් සංචාරකයෝ | 15/B, දේවාල පාර, පාගොඩ, නුගේගොඩ. | 0714870757 0112822076 |
| ටී. එච්. තිලකරත්න | තිලක විශ්ව ලංකා | කැකිරිස්කන්ද. | 0912238660 |
| | දඹදිව චාරිකා | කරන්දෙණිය. | |
| විමලරත්න කොහොඹන් | විමල් ට්‍රැවල්ස් | 865/2, තුසිතපුර, මාලබේ. | 0112762039 |
| එස්. සිරිපාල | සෙන්දනායක වන්දනා ගමන් සේවය | හුණුකොටුව අසල, පොල්වත්ත, මිල්ලෑව, හොරණ | 0342254275 |
| ජී. ගුණසේන | පින්සැරි දඹදිව පුණ්‍ය චාරිකා | නො. 04, ජනදහර, හොරගොල්ල, නිට්ටඹුව. | 0773135162 |
| රංජිත් ප්‍රේමලාල් චන්ද්‍රසේකර | චන්ද්‍රසේන ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් | විජයානන්ද මාවත, ආනන්ගොඩ, ගාල්ල. | 0914920744 |
| එම්. ඒ. නන්දන පෙරේරා | නන්දන ට්‍රැවල්ස් | නො. 08, කුලතුංග පාර, පානදුර. | 0382238256 |
| එල්. නිමල් බණ්ඩාර උක්වත්ත | සහන බොදු විදේශීය වන්දනා සේවය | 150/01, වෝර්ඩ් ප්ලේස්, කොළඹ 07. | 0112681714 |
| ආර්. ඒ. එම්. පෙරේරා | භාරත අශෝක වන්දනා සංවිධානය | 507/B, අනගාරික ධර්මපාල පෙදෙස, තලවතුගොඩ. | 0723895646 |
| කේ. එස්. ආර්. පෙරේරා | ජිනේන්ද්‍රාරාම දඹදිව චාරිකා | 425/2A, බෝධිය පාර, තලාහේන, මාලබේ. | 0112788440 |
| මෙත්තානන්ද කිඹිය පතිරණ | ඉමාෂා ට්‍රැවල්ස් | 61/1ඒ, කුඹල්වැල්ල, රිච්මන්ඩ් කන්ද, ගාල්ල. | 0912241998 |
| පූජ්‍ය බී. ආනන්දතිස්ස නාහිමි | සරණ දඹදිව වන්දනා චාරිකා සමිතිය | මාදම්පේ චේතියගිරි පුරාණ විහාරය, අම්බලන්ගොඩ. | 0912258037 |
| ආර්.ඒ.ඩී.කේ. ගාමිණී සිරිවර්ධන | ගැමුණු ට්‍රැවල්ස් | 240, පෙරේරා පාර, ගනේමුල්ල. | 0773517415 |
| කුමාර හෙට්ටිආරච්චි | සම්පත් දඹදිව චාරිකා | 511එෆ්, පුවක්වත්ත, පාදුක්ක පාර, ඉංගිරිය. | 0342269617 |
| පූජ්‍ය කොවුල්ගම ජිනරතන හිමි | මැදමහනුවර දඹදිව චාරිකා | ශ්‍රී ඉන්ද්‍රසාර විහාරය, කුඹුක්කඳුර, රජවැල්ල. | 0773652131 |
| යූ. ඩී. විල්මට් ධර්මසිරි පෙරේරා | සමාධි වන්දනා චාරිකා | 36/120ඒ, රුක්මල්ගම නිවාස, කොට්ටාව, පන්නිපිටිය | 0112898123 |
| බී. ගුණසෝම වික්‍රමසිංහ | නේරංජනා භාරත සංචාරකයෝ | 191/37, මලදෙල වත්ත, කඩවත. | 0112925451 |
| පූජ්‍ය පරගහඇල්ලේ ධම්මපාල නාහිමි | බදුල්ල ධම්මචක්ක | ශ්‍රී වර්ධනාරාමය, ධම්මචක්ක දඹදිව වන්දනා චාරිකා විහාරය, බදුල්ල. | 0555615490 |
| සුධර්ම ධම්සිරි හඳපාන්ගොඩ | හඳපාන්ගොඩ විදේශ වන්දනා සේවය | 133/8, බණ්ඩාරනායක මාවත, රඹුක්කන, බණ්ඩාරගම. | 0112388703 |
| චන්ද්‍රා ජයසිංහ | සමගි දඹදිව සංචාරකයෝ | 79, කැස්බෑව, පිළියන්දල. | 0112613218 |
| පූජ්‍ය මැටිකොටුමුල්ලේ පේමරතන නා හිමි | සහන ට්‍රැවල්ස් | රජමහා විහාරය, දඩගමුව, වේයන්ගොඩ. | 0776261063 |
| එම්.ඒ. බියට්‍රිස් ප්‍රනාන්දු | බුද්ධභූමි වන්දනා සංචාරකයෝ | 39/4, සුදර්මාරාම පාර, කල්දමුල්ල, මොරටුව. | 0777164544 |
| පූජ්‍ය බිබිලේ පියනන්ද හිමි | සමනල දඹදිව වන්දනා සංවිධානය | ශ්‍රී චන්ද්‍රසේකර මුදිලිඥනාරාමය, මහවල, බලන්ගොඩ. | 0776854145 |
| පූජ්‍ය පිලැස්සේ විමලධජ නා හිමි | මෛත්‍රී බුද්ධභූමි වන්දනා | භාවනා භික්ෂු මධ්‍යස්ථානය, මීගොඩ. | 0112855234 |
| පූජ්‍ය මහකුඹුක්ගොල්ලෑවේ රතනපාල නා හිමි | බුද්ධභූමි වන්දනා සංචාරකයෝ | ශ්‍රී ගුණරතනාරාමය හේනවත්ත, මීගොඩ. | 0112751040 |
| ඒ. අනෝමා ද අල්විස් | ජේ. ඒ. භාරත සංචාරකයෝ | 203, ගාලු පාර, ගල්කිස්ස. | 0112735028 |
| වසන්ති චිත්‍රානන්ද | සම්මානි චාරිකා (පුද්) සමාගම | 07/සී, 38, ජයවඩනගම, බත්තරමුල්ල. | 0115010656 |
| ඩැනියල් ඇතුල්ගම | ප්‍රබෝධා දඹදිව චාරිකා | 19/06, ශාන්ති මාවත, අළුබෝමුල්ල, පානදුර. | 0717182409 |
| රෝහිත ශ්‍රී කාන්ත සිරිවර්ධන | තිරුපති ශ්‍රී කාන්ත දඹදිව සංචාරකයෝ | 297, දකුණු බටගම, කඳාන. | 0714492282 |
| එම්. චන්දිමාලි ප්‍රනාන්දු | දයා භාරත වන්දනා චාරිකා | 14/4ඒ, මෝසස් පටුමග, කටුකුරුන්ද, මොරටුව. | 0722803454 |
| ජයසිරි කෝට්ටගොඩ | ජයසිරි සඳහම් දඹදිව චාරිකා | 29, මිනුවන්පිටිය පාර, පානදුර. | 0716288143 0740029262 |
| කේ. ඒ. එන්. ප්‍රදීපිකා වීරකෝන් | පුබුදු දඹදිව චාරිකා | 57/ඒ, කහටපිටිය, කනන්විල, හොරණ. | 0718216596 |
| පූජ්‍ය හිග්ගොඩ උදයධම්ම හිමි | සඳහම් දඹදිව / තායි / බුරුම වන්දනා චාරිකා | ශ්‍රී පියරතන බෞද්ධ මධ්‍යස්ථානය, මාහරගම, ගිරිඋල්ල. | 0779036364 |
| ආර්. එල්. සන්ධ්‍යා හේමලතා | පාරමී දඹදිව චාරිකා | 130/14ඒ, විශ්වකලාව, මාම්පේ, පිළියන්දල. | 0112615802 |
| පූජ්‍ය බුලත්ගම සුමනජෝති හිමි | වන්දනා දඹදිව චාරිකා | රජමහා විහාරය, බිබිලිඔය, නැලිගම. | 0362287606 |
| ටී. කේ. ධර්මසේන | ධර්මදීප දඹදිව වන්දනා | දෙව්මිණි, තල්පාවිල, කැකණදුර, මාතර. | 0415636563 |
| පූජ්‍ය ගිරිභාගම ධම්මරත්න හිමි | ශ්‍රාවස්ති දඹදිව චාරිකා | රාජසිංහාරාමය, කෝපිවත්ත, කුඹුරේගම. | 0812463552 |
| රන්ගනාත් කරුණාදාස | ඔරින්වේ ලෙෂ ප්‍රයිවට් ලිමිටඩ් | නො. 70/01, 31, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 08. | 0772355004 |
| කේ. එම්. ඒ. කරුණාතිලක | මෛත්‍රී ට්‍රැවල්ස් | අසංක සෙවන, රටේමුල්ල, උඩුවෙල. | 0815672459 |
| ඒ. ජේ. එම්. වනිගසිංහ | බෝසර ට්‍රැවල්ස් | 302ජී, දූපහේන පාර, රද්දොළුව, සීදූව. | 0112293739 |
| එච්.එම්. මුතුමාල් ප්‍රමිත හේරත් | මෛත්‍රී දඹදිව වන්දනා | නො. 65, වැලිවත්ත. වැලිවේරිය. | 0333688999 |
| ඩී. ඩී. ඒ. පෙරේරා | භාරත සතුට ට්‍රැවල්ස් | නො. 05, ගුඩ් හෝප්, ටවරවුම් පාර, ගුරුදෙණිය, මහනුවර. | 0812404319 |
| එච්. ඩී. ටී. පී. ප්‍රේමවර්ධන | වරණ ශ්‍රී චාරිකා | 420/49, වැලි පාර, තලවතුගොඩ. | 0112773776 |
| කේ. ජී. ඩී. එස්. බණ්ඩාර | ස්වර්ණ ට්‍රැවල්ස් | ලස්සන නිවස, ගැමුණු මාවත, වැල්මිල්ල, බණ්ඩාරගම. | 0382292290 |

### ගෞරවණීය ආරාධනයයි

බුද්ධ ශාසන අමාත්‍යාංශයේ සහ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි දශක දෙකකට වඩා වැඩි කාලයක් සාමාජිකත්වය වෙනුවෙන් කැපවූ අප සංගමය සමග මෙතෙක් එක් නොවූ සියලුම චාරිකා සංවිධාන ලියාපදිංචිය ලබාගෙන ඔබගේ ආයතනය නිත්‍යානුකූල නිවැරදි ආයතනයක් ලෙස ඉහළට ඔසවා තැබීමට ඔබටත් වටිනා අවස්ථාවක් උදවන බැවින් අප සංගමයේ ලියාපදිංචි වී වංචා දූෂණයෙන් තොර ගෞරවණීය පිරිසක් සමග එකතු වන්න.

| සංවිධායකගේ නම | සංවිධානයේ නම | ලිපිනය | දු. අංකය |
|---|---|---|---|
| එල්. කේ. මුදන්නායක | සමාධි භාරත චාරිකා | 344/4, කිරිල්ලවල, ඉඹුල්ගොඩ. | 0112971556 |
| එල්. ඒ. එස්. සම්පත් | ගෝතම බුද්ධ වන්දනා | 193/105/03, තුන්වන පටුමග, බණ්ඩාරනායක පුර, මත්තේගොඩ. | 0713643728 |
| එල්. එච්. යූ. එච්. ධර්මලාල් | පුණ්‍යභූමි දඹදිව චාරිකා | නෙක්කරු, හුනු කුඹුර, ඊතනවත්ත. | 0779319353 |
| ඊ. ඩබ්. ඒ. කේ. විජේරත්න | සරණ විදේශ චාරිකා | මාදම්පේ චේතියගිරි පුරාණ විහාරය, අම්බලන්ගොඩ. | 0912258037 |
| ඩී. කේ. පෙරේරා | පාරමිතා අධ්‍යාත්මක පදනම | 366 A/2, මහවත්ත, දෙල්ගොඩ. | 0112403450 |
| එච්. එම්. සී. ඉලංගකෝන් | පැතුම් ට්‍රැවල්ස් | සමගි ප්‍රධාන නගර මධ්‍යය, ගල්ගමුව. | 0372253306 |
| පූජ්‍ය වරාවැවේ සුධම්ම හිමි | දැක්ම දඹදිව වන්දනා සේවය | සිරිවර්ධනාරාම රජමහා විහාරය, කෝට්ටගොඩ, ගම්පහ. | 0333720990 |
| ඒ. ඒ. ඒ. මහින්ද | බුදු පියස අශෝක චාරිකා | 199, මහර නුගේගොඩ, රාගම. | 0112952201 |
| පූජ්‍ය කනත්තේවෙල සිරිනිවාස නා හිමි | සුබෝධ චාරිකා | ශ්‍රී සුබෝධාරාමය, වැලිමඩ පාර, බණ්ඩාරවෙල. | 0572222152 |
| ටී. ඩී. නිෂා මර්සි ප්‍රේමසිංහ | ශ්‍රී සුගත දඹදිව චාරිකා | 476, ඇහැළගොල්ල යාය, පන්ලියද්ද. | 0375786581 |
| එස්. එන්. රංගජීව | මෙත්සිසිල ට්‍රැවල්ස් | 295/1, දල්කඩ, පරගස්තොට, හොරණ. | 0382289880 |
| එච්. ඩී. විජිතා | වජිර සංචාරකයෝ | 21, විද්‍යාල පාර, වාද්දුව. | 0382296110 |
| පූජ්‍ය එම්. හේමාලෝක හිමි | හේමාලෝක දඹදිව වන්දනා | ශ්‍රී සීලානන්ද මහ පිරිවෙන, නාපේ, නෙළුම්දෙනිය. | 0718032321 |
| එස්. පී. සමන් ප්‍රසන්න ජයතිස්ස | ජයභූමි දඹදිව වන්දනා | 15/ඒ, උයන්දන, හිඳගොල්ල. | 0372236322<br>0718041689 |
| කේ. කේ. රොෂාන් නාමල් | බෙස්ට් ලයිෆ් වන්දනා ප්‍රයිවට් ලිමිටඩ් | නො. 343, හොරණ පාර. අලුබෝමුල්ල, පානදුර. | 0384927322<br>0753771011 |
| කේ.ඩී. අජන්තා විජේරත්න | බුදුමග වන්දනා සංවිධානය | 142, කව්ඩැල්ල, ගලගෙදර. | 072-4561598 |
| සිරි ද තාබෘෘ මහතා | ලක් භාරත ට්‍රැවල්ස් | 410/3, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. | 011-2685116 |

| සංවිධායකගේ නම | සංවිධානයේ නම | ලිපිනය | දු. අංකය |
|---|---|---|---|
| වසන්ත ද සිල්වා මහතා | පීපල්ස් ට්‍රැවල්ස් | 59, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10. | 011-4302092 |
| පූජ්‍ය විලපොල නන්දරතන හිමි එම්.ජී. මල්ලිකා මිය | සදහම් ගමගේ චාරිකා | "නන්දන" උනැල්ල, පාලටුව, මාතර. | 041-2232915 |
| පූජ්‍ය දියගම සුදස්සි හිමි | වීරපරාක්‍රම භාරත සංවිධානය | තිලකරත්නාරාමය, 3 වන පියවර, අනුරාධපුරය. | 077-4367424 |
| පූජ්‍ය පිටිපන සුමනසාර හිමි | සුමග දඹදිව වන්දනා | පුරාණ විහාරය, කිරිවත්තුඩුව. | 011-2753961 |
| පද්මා පටබැඳිගේ මිය | පද්මා භාරත වන්දනා | 27, වික්‍රමසූරිය පාර, අම්බලන්ගොඩ. | 071-8020358 |
| රසිකා දයානි ගුණසිංහ මිය | ජම්බුදීප චාරිකා සංවිධානය | 1/115, ෆෝචුන් පෙදෙස, අටුලුගම පාර, බණ්ඩාරගම. | 077-7182189 |
| වී. ජී. සෙනෙවිරත්න | කේ. එස්. එන්ටප්‍රයිසස් | 120/A, 'සෙනහස', වල්ගම්මුල්ල, කිරම. | 071-2850620 |
| එස්.ඒ.පී.එස්. ආරච්චි | ජෙම්සිරි දඹදිව/නේපාල වන්දනා චාරිකා | බුලුගහපිටිය, ඇහැලියගොඩ. | 0362259729 |
| ජී.එම්.එස්. කුමාරිහාමි | සුදර්මානි දඹදිව වන්දනා | 07බී, හැරණියාවත්ත, කිරිඇල්ල. | 045-2265298 |
| ආර්.ඩබ්ලිව්.පී.එස්. රාජපක්ෂ | එන්.ඇන්ඩ්.ආර්. ට්‍රැවල්ස් | 37/1, හොලීපිටිය, කහංගම, රත්නපුර. | 071-8842454 |
| එච්.කේ. චිත්‍රා නිල්මිණී | වර්ල්ඩ් වේ ටුවර්ස් | 297, දකුණු බටගම, කඳාන. | 077-1712157 |
| පූජ්‍ය අයගම සුගුණ මෛත්‍රී හිමි | රුහුණුපුර දඹදිව වන්දනා | ශ්‍රී අභිනවාරාමය, අකාඩේගොඩ, මහ ඉඳුරුව. | 071-8284470 |
| පූජ්‍ය හේනේපොල සිරි සුමංගල තිස්ස අධිකරණ නාහිමි | සද්භාෂි බුද්ධභූමි වන්දනා | ශ්‍රී සුබෝදාරාමය, කරුක්කුව, මාදම්පේ. | 032-2247877 |
| පී.බී. සජීවා සුභාෂිණී | සුභාෂි බුද්ධභූමි වන්දනා | 527-A, කැල්ලපත, අමුගොඩ. | 077-5894635 |
| පී. වී. ප්‍රදීප් | බෙත්රුවි වන්දනා පුද්ගලික සමාගම | 14/5, බාලසූරිය මාවත, කඳාන. | 077-3776020 |
| ඩී.එල්. ලලිත් ප්‍රේමවංශ | පාරමී ටුවර්ස් ඇන්ඩ් ටුවර්ස් | 251/H, බූසා බදුගේ කුරුඳුවත්ත, මාගල්කන්ද, මග්ගොන. | 034-2279159 |

# ශ්‍රී ලංකා විදේශ බෞද්ධ ගමන් සංවිධායකයන්ගේ සංගමයේ විධායක සභාව

**ගරු ප්‍රධාන පැවිදි අනුශාසක**
දක්ෂිණ ලංකාවේ
ප්‍රධාන සංඝනායක
පූජ්‍ය කිරම විමලජෝති නායක ස්වාමීන් වහන්සේ

**ගරු ගිහි අනුශාසක**
ගම්පහ දිස්ත්‍රික්
පාර්ලිමේන්තු මන්ත්‍රී
සිසිර ජයකොඩි මැතිතුමා

**ගරු සභාපති**
රෝහිත සිරිවර්ධන මහත්මා
071-4492282 / 0112240747

**ගරු ලේකම්**
ශාස්ත්‍රපති පණ්ඩිත
පූජ්‍ය හිග්ගොඩ උදයධම්ම හිමි
0718391938 / 0779036364

**ගරු භාණ්ඩාගාරික**
ජයසිරි කෝට්ටගොඩ මහත්මා
071-6288143 / 074-0029262

**ගරු ප්‍රධාන සංවිධායක**
හර්බට් විජේතුංග මහත්මා
071-3366535

**ගරු උප සභාපති**
පූජ්‍ය බම්බලපිටියේ ආනන්ද තිස්ස නාහිමි
077-6263886

**ගරු උප සභාපති**
වී. කේ. දීපක් වසන්ත මහත්මා
0714723883

**ගරු උප ලේකම්**
නිමල් බණ්ඩාර මහත්මා
072-2152525 / 011-2895909

**ගරු උප භාණ්ඩාගාරික**
එම්. චන්දිමාලි ප්‍රනාන්දු මහත්මිය
072-2803454 / 071-2632025

**ගරු ප්‍රචාරක ලේකම්**
එම්. වී. පී. රංගනාත් කරුණාදස මහත්මා
0772355004

**ගරු ගිණුම් පරීක්ෂක**
එන්. ජේ. ද ෆොන්සේකා මහත්මා
077-7390038

**කාරක සභාව**
පූජ්‍ය පිලැස්සේ විමලධජ නාහිමි
011-2855234
පූජ්‍ය විලපොල නන්ද රතන හිමි
011-2251690
ඊ. ඩබ්. අසංක කුමාර විජේරත්න මයා
0767883213
කේ. කේ. රොෂාන් නාමල් මයා
0777937343
එච්.එම්. චන්ද්‍රරත්න ඉලංගකෝන් මයා
0712001610
සිරිපාල සෙනෙවිරත්න මයා
034-2254275
චන්ද්‍ර ජයසිංහ මයා
011-2613218
ආර්. පී. චන්ද්‍රසේකර මයා
091-4920744
කේ.ජී.සී.එස්. බණ්ඩාර මයා
0719774643
ඒ. ඒ. අශෝක මහින්ද මයා
071-8026176
ශාස්ත්‍රපති විමලරත්න කොහොඹත් මයා
077-0185807

# තාවකාලික ධනය අතර සදාකාලික සප්ත ආර්ය ධනය

**ධනය යන වචනය ඇසූ සැණින් ම අප මතකයට නැඟෙනුයේ මිල මුදල් හා ඒවා භාවිතයෙන් ලබා ගන්නා නිවාස, ඉඩකඩම්, යාන වාහන ආදී දේ පිළිබඳව යි. ලෞකික හෙවත් මෙලොව ජීවිතයට පමණක් අයත් වන මේ සියල්ල තාවකාලික ය.**

ඇතැම් ඒවා ඉතා සුළු මොහොතකින් පවා විනාශ වී යා හැකි ය. ගින්නෙන්, ජලයෙන් සොරසතුරන් අතට පත්වීමෙන්, රජයට අයත්වීමෙන් සහ වියදම් වීමෙන් යනාදී වශයෙන් මේවා විනාශ වීමට ඇති අවස්ථා බොහෝ ය.

සුනාමි වැනි ව්‍යසනයන් හි දී මොහොතින් විනාශයට පත් වූයේ වටිනා මිනිස් ජීවිත සේ මිනිසුන් ජීවිත කාලය පුරාවට ම දුක් මහන්සි වී උපයාගත් ලෞකික ජීවිතයට අයත් දේ ය. තව ද අගනා පොළී අනුපාතයන් ලබා දෙන බව පවසමින් ජනතාවගේ මුදල් අධික වශයෙන් ලබාගත් අය පිළිබඳ ඉකුත් සමයේ අසන්නට ලැබුණි. අවසානයේ සිදුවූයේ එම මුදල් ඒ ඒ පුද්ගලයන් සමඟම අතුරුදහන්වීම යි. එම හේතුවෙන් තමා සන්තක ධනය අහිමි වූ ඇතැම්හු බලවත් චිත්ත පීඩනයට පත් ව ජීවිත හානිකර ගැනීමට පවා පෙළඹුණාහ.

මෙම ලෞකික ධනය ඉහත කී සෑම ව්‍යසනයකින් ම මැනවින් ආරක්ෂා කරගෙන සිටිය ද අවසානයේ පුද්ගලයා ජීවිතයෙන් සමුගන්නා මොහොතේ දී සිදුවන්නේ කුමක් ද? ඒ සියල්ල හැර දමා හිස් අතින් පරලොව යාම යි. එනයින් බැලූ කල ද ලෞකික ධනයෙහි තාවකාලික ස්වභාවය වටහා ගැන්ම අපහසු නොවෙයි. මෙහි දී බුදු දහමේ ඉගැන්වෙන සප්ත ආර්ය ධනය පිළිබඳ අවධානය යොමු කිරීම ඉතා වැදගත් ය. ඒ පිළිබඳ ඉගැන්වෙන්නේ අංගුත්තර නිකායේ සත්තක නිපාතයේ සංඛිත්ත ධන සූත්‍රයෙහි ය.

ලෞකික ධනයත්, සප්ත ආර්ය ධනයත් අතර පවත්නා වෙනස හඳුනාගෙන සිටීම ජීවිතයට ඉතා වැදගත් ය. පළමුව සප්ත ආර්ය ධනය යනු කුමක් දැයි, වටහා ගෙන සිටිමු.

සද්ධාව, සීලය, ලජ්ජාව, භය, ශ්‍රැතිය, පරිත්‍යාගය, ප්‍රඥාව යන මේවා සප්ත ආර්ය ධනය නම් වේ.

මෙම ධන සම්පත්තීන් කිසියම් ස්ත්‍රියක් තුළ හෝ පුරුෂයෙක් තුළ පිහිටා තිබෙත් ද ඔවුහු දිළින්දෝ නො වෙති. ඔවුන ගේ ජීවිත හිස් ජීවිත නොවෙති.

මෙහි දී මිල මුදල් යනාදී ලෞකික ධනය අනවශ්‍ය යැයි කිසි විටෙක තේරුම් නොගත යුතු ය. එහෙත් ලෞකික ධනයෙහි පවත්නා තාවකාලික ස්වභාවය වටහා නො ගෙන ඒවා ම රැස් කරමින් මෙම ආර්ය හෙවත් උසස් ධන සම්පත්තීන් සත පිළිබඳ අනවබෝධයෙන් ක්‍රියා කිරීම මෙලොව පරලොව ජීවිතයට කිසිසේත් ම හිතකර නොවේ.

ලෞකික ධනයත්, ආර්ය ධනයත් යන දෙක සමබරව රැස්කර ගැනීම ජීවිතයට වඩාත් ම උචිත ක්‍රියා පිළිවෙත යි. අප කෙතෙක් ආශාවෙන් රැස් කළ ද ලෞකික ධනය තාවකාලික දෙයක් බවත්, සප්ත ආර්ය ධනය තාවකාලික නොවන නිවන දක්වාම අඛණ්ඩව ගමන් කරන ස්ථිර ධනයක් බවත් අප තේරුම්ගත යුතු ය. දැන් ඒ එකින් එක පිළිබඳ විමසා බලමු.

## සංඛිත්ත ධන සූත්‍රය

### බෞද්ධ ජීවිතයේ පදනම

තෙරුවන් කෙරෙහි සිතෙහි ඇතිකර ගන්නා පැහැදීම සද්ධාව ලෙස කෙටියෙන් අර්ථ දැක්විය හැකි ය. පුහුදුන් අප සිත් තුළ පවත්නේ ලෞකික සද්ධාව යි. සෝවාන් ආදී මාර්ගඵලලාභී උතුමන් තුළ පවත්නේ ලෝකෝත්තර සද්ධාව යි. ලෞකික වූ අපේ සද්ධාව "චල" සද්ධාව ලෙස දැක්වේ. චල යනු සෙලවීම යි. එනම් අප පුහුදුන් පුද්ගලයන් ගේ සද්ධාව විටෙක ඉතා ඉහළ මට්ටමක ද, විටෙක මධ්‍යස්ථව ද, විටෙක ඉතා අඩුවෙන් ද පිහිටා තිබීමට අවකාශය තිබීම යි. එහෙත් ලෝකෝත්තර සද්ධාව අචල සද්ධාවකි. එය කිසිදාක නොසෙල් වී පවතියි.

භක්තියට වඩා හරවත් දාර්ශනික පදනමක් බෞද්ධ සද්ධා සංකල්පය තුළ ගැබ්ව පවතියි. යම් දෙයක් පිළිබඳ ඇදහීමක් හෙවත් භක්තියක් අවශ්‍ය වන්නේ දැකීමක් නොමැති වූ විට ය. යමක් දැකීමෙන් පසු ඒ ගැන ඇදහීම හෝ භක්තිය පිළිබඳ ගැටලුවක් ඇති නොවේ. බුදු සමයෙහි මුල්තැන ලැබෙන්නේ භක්තියට නොව අවබෝධයට යි.

### හික්මීම

කය වචනය දෙක සංවර කර ගැනීම සීලය ලෙස හඳුන්වා දිය හැකි ය. ගිහි බෞද්ධයා ගේ නිත්‍ය සීලය පංච සීලය යි. විශේෂ අවස්ථාවන් හි දී සමාදන් වන අෂ්ටාංග සීලය, දස සීලය ආදී සීල ප්‍රතිපදාවන් ද පවතියි. එහෙත් නිරන්තරයෙන් ම ආරක්ෂා කළ යුතු සීලය පංච සීලය යි. එය එකකට එකක් ඒකාබද්ධව පවතියි.


එක් සිල් පදයකට හානි පමුණුවා ගැනීම ඉතිරි සියල්ල ම හෝ කිහිපයකට හානි පමුණුවා ගැනීමක් වනු ඇත.

උදාහරණයක් ලෙස යමකු අතින් පළමු සිල් පදය වන දැන දැන සත්ත්වයකු ගේ දිවි තොර කිරීමේ අකුසලය සිදු වූයේ යැයි සිතමු. ඒ සමගම දෙවැනි සිල් පදය ද අභෝසි වී යයි. එයට හේතුව කාලයක් ජීවත්වීමට අවස්ථාව තිබූ ජීවියකු ගේ වටිනා ජීවිතයක් සොරකම් කිරීම යි. එය බරපතළ සොරකමකි.

ඒ සමගම තෙවැනි සිල් පදයට ද හානිකර ගනියි. එයින් කියැවෙන්නේ වැරැදි කාම සේවනයහි හැසිරීම ගැනයි. ප්‍රාණඝාතය යනු වැරැදි කාම සේවනයෙහි හැසිරීම නොවුණත් මෙලොව ජීවිතයේ සිදු කරන බරපතල වැරැදි හැසිරීමකි.

සිව්වැනි සිල් පදයෙන් කියවෙන්නේ බොරු කීම ගැන යි. තමා ජීවිතයට ඇලුම් කරන බවත්, තම ජීවිතයට කිසිවකු අඩුම තරමේ සීරීමක්වත් සිදු කරනවාට තමා අකැමැති බවත් ඕනෑ ම පුද්ගලයකුට වැටහෙන සත්‍යයකි. බෞද්ධයකු නම් මෙම සත්‍යය වඩාත් හොඳින් දනියි. එසේ නම් ප්‍රාණඝාතයෙන් සිදු කරන්නේ දැන දැන බොරුවක් කිරීමයි.

පස්වැනි සිල් පදයෙන් උගන්වන්නේ ශරීර මදයට හා ප්‍රමාදයට හේතුවන මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම සම්බන්ධවයි.



ඌරුගමුවේ අස්සජී හිමි

ප්‍රාණඝාතය ශරීර මදයට හේතු නොවූවත් උපරිම ලෙස ප්‍රමාදයට හේතු වෙයි. එනම් සසර ගමන අප්‍රමාණ වූ දුක්වලට භාජනය වෙමින් උපරිම ලෙස ප්‍රමාද කිරීම යි. පන්සිල් එකකට එකක් ඒකාබද්ධව පවත්නා බව මේ අනුව පැහැදිලි ය. එය නිරන්තරයෙන් ආරක්ෂා කළ යුතු සීලය බවට පත්වන්නේ එබැවිනි.

### ලජ්ජාව සහ බිය

සප්ත ආර්ය ධනය අතර හිරි යනු ලජ්ජාව යි. අකුසලයට ලජ්ජාවීම මෙමඟින් අදහස් වෙයි.

ඔත්තප්ප ධනය යනුවෙන් අදහස් කොට ඇත්තේ භය යි. එනම් පවට බිය වීම යි. එයට කරුණු සතරක් ද පදනම් කරගත හැකි ය.

අත්තානුවාදභය - අකුසල් කළහොත් තම සිත තමාට ම දොස් නඟන්නේ ය, යන බිය

පරානුවාදභය - අන්‍යයන්ගෙන් තමාට චෝදනා ලැබෙන්නේ ය, යන බිය

දණ්ඩභය - දඬුවමට ඇති බිය හා

දුග්ගතිභය - දුගතියට ඇති බියයි.

ශ්‍රැතිය යනු ශ්‍රවණය කිරීම යි. "සුස්සූතා ලභතේ පඤ්ඤං" යන පාඨයට අනුව ප්‍රඥාව දියුණු වන්නේ වැඩිපුර දේ ශ්‍රවණය කළ විට යි. පුරාතනයේ අප ගේ අධ්‍යාපන මාධ්‍යය වූයේ ද ශ්‍රැතිය යි. එමඟින් බිහිවූවෝ බහුශ්‍රැතයෝ නම් වූ හ.

රැස් කිරීම වෙනුවට තමා සන්තකව තිබෙන දෙයක් අත්හැරීමේ චේතනාවෙන් යුක්තව අන්‍යයන්ට දීමේ දී සිතේ ඇතිවන්නේ චාග චේතනාව යි. දන්දීම යනු ද එය යි. රැස්කිරීම වෙනුවට අත්හැරීම ජීවිතයේ ප්‍රායෝගික ක්‍රියා පිළිවෙතක් බවට පත්කර ගත යුතු ය.

විදර්ශනා ඥාණය දියුණු කර ගැනීමේ ක්‍රියා මාර්ගය ප්‍රඥා ධනයෙන් අදහස් වෙයි. සසර දුක් ක්ෂය කිරීමෙන් නිවන ලැබිය හැකි වන්නේ විදර්ශනා ඥාණය කෙමෙන් කෙමෙන් ප්‍රගුණ කර ගැනීමෙනි.

එබැවින් නුවණ දියුණු කරවීම ද සප්ත ආර්ය ධනයට අයත් එකකි. මෙම සප්ත ආර්ය ධනයෙන් යුක්ත වූ යමෙක් වෙත් නම් ඔවුන්ගේ ජීවිත කිසිදා හිස් ජීවිත නො වෙයි. මෙලොව හා පරලොව ජීවිත තුළ ඔවුහු දිළින්දෝ නොවෙති. එබැවින් මෙම සප්ත ආර්ය ධනය එදිනෙදා ජීවිතයට ප්‍රායෝගිකව ම එක් කරගත යුතු ය.

# ඉවසීම පුරුදු කළා නම් මෙහෙම වෙන්නේ නැහැ

"ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය - මහමෙර උසුලනා මිහිකතටත් වැඩි ය." යන්න අප කාටත් හුරු පුරුදු කවි දෙපදයකි. එදා අපේ පැරැන්නෝ කවියෙන්, ගීතයෙන්, කතාන්දරවලින්, බණදහමින්, පාසලෙන්, දහම් පාසලෙන් මෙන් ම නිවෙසින් ඉවසීම ගැන කියා දුන්හ. ඉවසීම හුරු පුරුදු කළහ.

බුදුරජාණන් වහන්සේ දවස විසූ සුනාපරන්තවාසී පුණ්ණ තෙරුන් වහන්සේගේ කතා පුවත ඔබ අසා ඇති. තමාට බැන්නොත් ගැහුවේ නෑ කියා ඉවසනවා. අතින් පයින් ගැහුවොත් කැට කැබිලිතිවලින් ගැහුවේ නැහැ කියා ඉවසනවා. කැට කැබිලිතිවලින් ගැහුවොත් දඬුමුගුරුවලින් ගැසුවේ නැතැයි කියා ඉවසනවා. දඬුමුගුරුවලින් ගැසුවොත් අවිආයුධවලින් ගැසුවේ නැතැයි ඉවසනවා. අවිආයුධවලින් ගැසුවොත් මැරුවේ නැතැයි කියා ඉවසනවා. මැරීමට සැරසුණොත් බොහෝ අය සියදිවි හානි කරගන්න උත්සාහ කරනවා. මට මරණයට පත්වීමට අවස්ථාවක් ලැබුණේ යැයි කියා ඉවසනවා. යනාදි වශයෙන් ඉවසන්න උත්සාහ කරන ආකාරය මනාව දක්වා ඇත.

ධම්මපදයේ දී බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ යම් කිසිවෙක් තමාගේ වරදක් දැක පෙන්වා දෙන්නේ නම් ඒ තැනැත්තා නිධානයක් පෙන්වා දෙනවා මෙන් සිතන ලෙසයි. නින්දා කොට හෝ වරද පෙන්වා දුන්නත් එවැනි අය ඇසුරු කරන ලෙසත්, එයින් තමාට යහපතක් මිස අයහපතක් නොවන බව පෙන්වා දුන් සේක.

මෙම බණ පදය මෙසේ ලිවීමට සිත් වූයේ පසුගිය දා අපරටේ සිදු වූ ශෝචනීය සිදුවීමක් නිසයි.

පාසල් ගුරුවරයකු පාරේ යන තම සිසුන් තිදෙනකු දැක අවවාදයක් කළේ ය. ඒ හිසේ දමාගෙන යා යුතු හිස්වැසුම් අතේ දමාගෙන යතුරුපැදියකින් ගමන් කරන දැරුවන්ට එසේ නොයන ලෙසයි. එම අවවාදය පිළිගැනීමට තරම් කීකරු නොවූ සිසුන් තිදෙනා ඉන් කිපී ගුරුවරයාට පහර දීමෙන් ගුරුවරයා මිය ගියේ ය. දරුවෝ තිදෙනා වසර 30කට සිර ගතවූහ. ඒ වයස අවුරුදු 15, 16 වසසේ දරුවන් ය.

අපට කීමට ඇත්තේ මව්පියන්, ගුරුවරුන් දරුවන්ට ඉවසීම පුරුදු කළේ නම් මෙසේ නොවන්න තිබුණා යන්නයි.



මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
**කොටනෙළුවේ පුඤ්ඤනන්ද හිමි**

# ඇසින් දුටු දෙයත් වරදින්නට පුළුවන්

**උක්දිව එක් ආරාමයක වාසය කළා තෙරුන් වහන්සේ දෙනමක්. එක් නමක් ආගන්තුක යි. අනෙක් තෙරුන් වහන්සේ විහාරයේ කලක් වැඩ සිටි තෙරුන් වහන්සේ නමක්. දෙදෙනා වහන්සේ ම පිණ්ඩපාතයේ වැඩම කළත් එකම මාර්ගයේ ගමන් කරන්නේ නෑ.**

දිනක් ආගන්තුක තෙරුන් වහන්සේ පාන්දරින් ම පිණ්ඩපාත චාරිකාවේ යෙදුණා. ගෙපිළිවලින් වැඩම කරන උන්වහන්සේට මුණගැහුණා ඉතාම ශ්‍රද්ධා සම්පන්න උපාසිකාවක්. ගෙදරට වැඩම කරවාගෙන ගෙපිලෙහි ආසනයක් පනවා දුන්නා. පාත්‍රය අරගෙන බත් පිනිවලින් පුරවා පූජා කළා. තෙරුන් වහන්සේත් උපාසිකාවගේ ඉල්ලීම අනුව එතැන දී ම වළඳන්න පටන් ගත්තා. ඒ මොහොතේ එතැනට පැමිණියා වංසවත්, ධනවත් කාන්තාවක්. ඇය තෙරුන් වහන්සේ වැඩ සිටින පිලේ ම මිටි ආසනයක හිඳගත්තා. දුර සිටින කෙනකුට පෙනෙන්නේ දෙදෙනා ම එක ආසනයක ඉඳගෙන ඉන්න ආකාරයක්.


මදක් ප්‍රමාද වී පිණ්ඩපාතයේ වැඩම කළ විහාරවාසී තෙරුන් වහන්සේට මෙය දකින්න ලැබුණා. 'විහාරයේ දී නම් මේ පාංශුකූලික භික්ෂුව සන්සුන්. ඒත් පිණ්ඩපාතයේ ඇවිත් උපාසිකාවන් සමඟ එකම අසුනේ ඉඳගන්නවා. මේක භික්ෂුවකට ගැළපෙන දෙයක් නම් නෙවෙයි. අදම පන්සලෙන් එලවලා දාන්න ඕන. මේ වගේ කෙනෙක් තවදුරත් මේ විහාරයේ හිටියොත් විපතක් සිදු වෙන්න පුළුවන්' යැයි සිතමින් පිණ්ඩපාතයේ යෙදී විහාරයට වැඩම කළා.

පාංශුකූලික තෙරුන් වහන්සේත් පිණ්ඩපාතය නිමවා වැඩම කරනවා. උන්වහන්සේ සන්සුන් ගමනින් වැඩම කර තමන් වහන්සේ වැඩ සිටි කුටියට පිවිසුණා. විහාරවාසී තෙරුන් වහන්සේ කෝපයෙන් රත්වෙලා. ආගන්තුක භික්ෂුවට දොස් කියන්න, චෝදනා එල්ල කරන්න, අපහාස කරන්න, පරිභව කරන්න අවස්ථාව එනකම් බලන් හිටියා.

පිණ්ඩපාතික තෙරුන් වහන්සේ කාමරයට පිවිසුණා පමණයි නැවත එළියට එන බවක් පෙනෙන්න ඇත්තේ නෑ. දැන් විහාරවාසී භික්ෂුවගේ කෝපය එන්න එන්නම වැඩි වෙනවා. ඉවසන්න බැරිම තැන ගියා ආගන්තුක භික්ෂුව වැඩ සිටින කුටිය ඉස්සරහට. කුටියට ඇතුල් වන කොට පා සෝදා ගන්න වතුර කළයක් තබා තිබුණා. එයින් කෝප්පයකට ජලය පුරවාගෙන මහ සද්දයෙන් පා දෙක සෝදන්න පටන් ගත්තා. පාංශුකූලික තෙරුන් වහන්සේ සොයා බැලුවා මහත් සද්දයෙන් පා සෝදන අසංවර තැනැත්තා කවුද කියලා. උන්වහන්සේට කරුණු සියල්ල හොඳින්ම වැටහුණා.

'මුන්වහන්සේ සිත දූෂ්‍ය කරගෙන ඉන්නේ. මම පිණ්ඩපාතය ගත් අවස්ථාවේ ඉඳගෙන හිටිය ආකාරය හරියට දකින්න නැතිවයි මේ විදිහට හැසිරෙන්නේ. තව දුරටත් මෙහෙම හැසිරුණොත් රහතන් වහන්සේ නමක් කෙරෙහි කෝප ගෙන බොහෝ අකුසල් රැස් කර ගන්නවා. ඒ නිසා උන්වහන්සේගේ සැකය දැන්ම නැති කරන්න ඕන යැයි කල්පනා කරලා එවලේ ම භාවනාවට සමවැදිලා කුටියේ කැණිමඬල සමීපයේ පළක් බැඳගෙන වැඩ සිටියා.

නේවාසික භික්ෂුව කෝපයෙන් කාමරයට ඇතුළු වුණා. දොර මුල්ලේ, ඇඳ යට, මේස යට හැම තැන ම පරීක්ෂා කර බැලුවා. පාංශුකූලික තෙරුන් වහන්සේ



දකින්න ලැබුණේ නෑ. 'මොහොතකට පෙර හිටිය මේ භික්ෂුව එක වරම අතුරුදහන් වෙලා. එළියටවත් යන්න ඇති. මම නොදකින විදිහට'යි කල්පනා කරලා කාමරයෙන් එළියට යන්න හදන විට අහසේ පලක් බැඳගෙන භාවනාවේ යෙදෙමින් සිටි ආගන්තුක භික්ෂුව උගුර පාදා තමන් වහන්සේ කාමරයේ වැඩ සිටින බව ඇඟ වූවා. ඒ මොහොතේ හඬ ආපු දිශාව පරීක්ෂා කරන විට අහසේ පලක් බැඳගෙන වැඩ සිටින ආගන්තුක භික්ෂුව දැක

'ආයුෂ්මතුනි, ඔබ වහන්සේ පාංශුකූලික යි. සංවර යි. ඒ සියල්ල ම පෙන්වන්නේ විහාරයේ දී විතරයි. ගම ඇතුළට ගියහම අසංවරව හැසිරෙනවා. අද මගේ ඇස් දෙකින්ම ඒක දැක්කා. කාන්තාවක් සමඟ එකම ආසනයේ ඉඳගෙන කතා කරමින් හිටියා. ඒවගේ දේවල් භික්ෂුවකට තහනම් බව බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියනවා. විනය නීති නොසලකා කටයුතු කළ ඔබට මෙතරම් ආනුභාවයක් කොයින් ද? යනුවෙන් ප්‍රශ්න කර සිටියා. එම අවස්ථාවේ දී පාංශුකූලික වූ රහතන් වහන්සේ

'ස්වාමිනී, පැවිද්දෝ නම් කවරාකාරයකින්වත් ස්ත්‍රීන් සමඟ එකම යහනේ ඉඳගන්නේ නෑ. මම ඒ බව හොඳින් දන්නවා. ඔබ මා වැඩ සිටි ආකාරය හරියට දකින්නේ නැතිවයි මේ චෝදනා එල්ල කරන්නේ. මට වඩා කුඩා ආසනයකයි උපාසිකාව ඉඳගෙන සිටියේ. රහතන් වහන්සේලා එසේ කරන්නේ නෑ'යි පවසමින් තමන් වහන්සේ අර්හත්භාවය ලබා සිටින බවත්, වැරැදි දැකීමකින්, වැරැදි වැටහීමක් සිතේ ඇති වන බවත් පවසමින් කරුණු පහදා දී සංසාර ගමනින් උන්වහන්සේ ගලවා ගත්තා'යි කතා පුවතක් මජ්ඣිම නිකාය අටුවාවේ විමංසක සූත්‍ර වර්ණනාවේ සඳහන් වෙනවා.

යමක් දුටු පමණින් හා පුද්ගලයකුගේ බාහිර හැසිරීම හෝ පෙනීම මත තීරණ ගැනීම සුදුසු නැති බව මේ කතා පුවත උපදෙස් ලබා දෙනවා.

බිරිඳ සැමියා කෙරෙහිත්, සැමියා බිරිඳ කෙරෙහිත්, දෙමාපියන් දරුවන් කෙරෙහිත්, දරුවන් දෙමාපියන් කෙරෙහිත් මේ ආදී වශයෙන් සමස්ත සමාජය ම කටයුතු කිරීමේ දී බාහිර දර්ශනයෙන් හෝ යමක් ඇසූ පමණින් හෝ තීරණවලට එළැඹීම මෙලොවත්, පරලොවත් අසාර්ථක වීමට හේතුවක් වෙනවා.



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

**පවෙහි විපාක කවදා හෝ තමන් පසුපස එන බව සිතට ගන්න**

# විවාහය බිඳවන්නට අසත්පුරුෂයන් එදිරිවාදිකම් කරනවා ද?

**සාර්ථක යුගදිවියක් පවත්වා ගැනීම සඳහා අන්‍යෝන්‍ය විශ්වාසය ඉතා අවශ්‍ය වෙනවා. සමාජයේ බොහෝ යුග ජීවිත ගත කරන්නන් අසහනයෙන් හා පීඩනයෙන් ගත කරන්නේ විශ්වාසය නොමැති නිසා ය.**



**රැකී රක්ෂා කටයුතු වගේ ම ගේ දෙර කටයුතුවලදීත්, සමාජ කටයුතුවලදීත් එක් කෙනෙකුට සියල්ල පවරා අනෙක් කෙනා නිදහස් වෙන්න කල්පනා කළොත් සමබර යුගදිවියක් ගෙවන්න බැහැ. ඒ නිසා හැම කටයුත්තක් වෙනුවෙන් ම දෙදෙනාම ලොකු කැපකිරීම් කළ යුතු වෙනවා**

සමහර වේලාවට හොඳින් ජීවත්වන දෙන්නෙක් දිහා බලා අසත්පුරුෂයන් ඊර්ෂ්‍යා කරනවා. ඊට පස්සේ ඒ ජීවිත දෙක කඩාකප්පල් කරලීම සඳහා කුමන්ත්‍රණ කරන්නත් පටන් ගන්නවා. විශේෂයෙන් දුරකතන ආදිය ඔස්සේ වැරැදි ආරංචි පතුරවනවා. එක්කෝ අභූත චෝදනා ඇතුළත් කොට කැලෑපත්තර ලියා එහාට මෙහාට තැපැල් කරනවා.

ඉතින් මේ වගේ වේලාවට අන්‍යොන්‍ය විශ්වාසය දෙදෙනා තුළ ගොඩනඟාගෙන නොතිබුණොත් සැක සංකා ඇති කර ගෙන යුගදිවිය අර්බුදයක් බවට පත් කර ගන්නවා. ඒ නිසා විශ්වාසය විවාහ දිවියේ බැඳීම ඇති කරවන ප්‍රධාන බලවේගයක්.

## සංසිඳීම ඕනෑ

ඊළඟ කාරණය වන්නේ දෙදෙනා තුළ ශීලය සමානව පිහිටිය යුතු බවයි. ශීලය කියන්නේ සංසිඳුණු බවයි. එහෙම නැත්නම් හික්මුණු බවයි. ඊට විරුද්ධ පැත්ත නොහික්මුණු බවයි.

නොහික්මුණු දෙන්නෙක්ගේ විවාහය තිරිසන් දෙදෙනකු එකතු කළා වගෙයි. දෙන්නාම නැත්නම් එක් කෙනෙක් වුණත් අසංවර නම්, හික්මීමක් නැත්නම්, කතා කරන්නවත් දන්නේ නැත්නම්, කටට ආ දේ හැම වෙලාවෙම කෝප ගින්දර අවුලනවා නම් එතැන කොහොමද ලස්සන යුගදිවියක් තිබෙන්නේ.

ආවේගශීලිව හැසිරෙන, කුඩා දේකට හෝ ඉවසීමක් නැති කෙනා මහා නොහික්මුණු කෙනෙක්. එවැනි අයට යුගදිවිය සතුටින් ගෙවන්න බැහැ. ඒ නිසා විවාහ වෙන්න සූදානම් වන විට දෙදෙනා තුළ ශීලාචාර ගති පැවතුම් ගොඩනඟා ගැනීම අත්‍යවශ්‍ය වෙනවා.

## කැපවීමට වගවීම

ඊළඟ කාරණාව සම චාගා, ඒ කියන්නේ පරිත්‍යාගය සමාන වෙන්න අවශ්‍යයි. මෙහිදී යමක් පරිත්‍යාග කරන කොට එක් හිතක් පවතිනවා කියන එක මතුපිටින් පෙනෙන අර්ථය වුණත්, ඊටත් වැඩි දෙයක් තියෙනවා. ඒ කියන්නේ යුගදිවිය පවත්වා ගැනීම සඳහා දෙන්නාගේ ම කැපවීම අවශ්‍ය වන බවයි.

මෙහිදී රැකී රක්ෂා කටයුතු වගේ ම ගේ දොර කටයුතුවලදීත්, සමාජ කටයුතු වලදීත් එක් කෙනෙකුට සියල්ල පවරා අනෙක් කෙනා නිදහස් වෙන්න කල්පනා කළොත් සමබර යුගදිවියක් ගෙවන්න බැහැ. ඒ නිසා හැම කටයුත්තක් වෙනුවෙන් ම දෙදෙනාම ලොකු කැපකිරීම් කළ යුතු වෙනවා.

## අනෙකාගේ මතයටත් ඉඩ දෙන්න

සම ප්‍රඥා යනුවෙන් හතරවෙනුව දැක්වෙනුයේ තීරණ ගැනීමේ දී දෙදෙනාගේ ම අදහස් සැලකිල්ලට ගෙන නිවැරැදි දේ තෝරා ගැනීමට කල්පනා කළ යුතු බවයි. සමහර වෙලාවට එක් කෙනකුගේ ම මතයක් ක්‍රියාත්මක කරන්න තරම් සැහැසි වෙලා කොච්චර අර්බුද හදා ගන්නවා දැයි බලන්න. ඒ නිසා ආදිපත්‍යකාමී බවින් මිදී දෙදෙනාට ම එකඟ විය හැකි තීරණ ගෙන කටයුතු කරනවා නම් පවුල් ජීවිතයේ බොහෝ අවුල් නිරාකරණය කර ගන්න හැකි වෙනවා.

යුග ජීවිත ගොඩනඟා ගැනීමේ දී විශේෂයෙන් භාර්යාවන් පිළිබඳ බුදුරජාණන් වහන්සේ වැදගත් දේශනාවක් කළා.

එනම් භාර්යාව තුළ පැවතිය යුතු ගුණයි. එයින් කියැවෙන්නේ භාර්යාවන් අම්මා කෙනෙකුගේ ගුණයෙන් යුතු වෙන්න ඕනෑ. (මාතු භාරියා) එමෙන්ම සහෝදරියක් වගේ වෙන්න ඕනෑ. (භගිනි භාර්යා) එමෙන්ම යහළුවෙක් වගේ වෙන්න ඕනෑ (සඛී භාර්යා) ඇතැම් වේලාවක මෙහෙකාරියගේ කාර්යභාරයත් ඉටු කළ යුතු වෙනවා. එවැනි තැනෙක ස්වාමියා මොන තරම් සැනසිල්ලක් ලබනවා දැයි බලන්න. එවිට ඒ ස්වාමිපුත්‍රයා තම භාර්යාව කෙරෙහි ඉතා ආදරයෙන් කටයුතු කරනවා නොවේ ද?

## දෙවියෙක් හා දෙවඟනක්

එමෙන්ම භාර්යාව පමණක් නොව ස්වාමියා ද මේ ගුණවලින් යුතුවීම අවශ්‍ය වෙනවා. පියකු වගේ, යහළුවකු වගේ, සහෝදරයකු වගේ, මෙහෙකරුවකු වගේ ස්වාමියා කටයුතු කරනවා නම්, භාර්යාවගේ ආදරය දිනා ගන්න පහසු වෙනවා නොවේ ද? තවත් ආකාරයකින් බුදුරජාණන් වහන්සේ වදාළේ යුගදිවි ගත කරන්නන් අතර පැවතිය යුතු සබඳතාව දෙවියෙක් හා දෙවඟනක් සමඟ එක්ව කරන වාසය හා සමාන විය යුතු බවයි. (දේවො දෙවියා සද්ධිං සංවසති)

මේ අනුව භාර්යාව දෙවඟනක් නම් ඇය ගෙදර ශ්‍රියා කාන්තාව බවට පත්වෙනවා නොවේද? ශ්‍රියා කාන්තාව ජීවත්වන නිවසක් සියලු සම්පත්වලින් සපිරෙනවා. යන එන අයට ඉතා ප්‍රියමනාප වෙනවා. එතැන ප්‍රේතයන් භූතයන් හෝ අමනුෂ්‍යයන් වසන්නේ නැහැ.

මෙලෙස ස්වාමි භාර්යාවරුන් දෙවියන් දෙවඟනන් වගේ වසන නිවසක දූ දරුවන් දෙවියන් වගේ වෙනවා. ගුණවත් සිල්වත් දරුවන්ගෙන් සමාජය යහපත් වෙනවා.

අපේ බෝසතාණන් වහන්සේ උපදින්නට හොඳ අම්ම කෙනෙක් සොයද්දී මහාමායා දෙව්දුව හමු වුණේ ඇයගේ සිල්වත් ජීවිතය නිසයි. ඒ වගේ යහපත් දරුවන් උපදින්නට හොඳ මව්වරුන් සොයාගෙන එනවා. ඒ අනුව බෝසත් දරුවන් ලබන්නට අම්මලා තාත්තලා ගුණවන්ත විය යුතු බව මේ අනුව අපට පේනවා.

## නිතර අඬදබර කළොත්...

ගෙදර පරිසරය අයහපත් වුණොත්, ස්වාමි භාර්යාවන් යක්ෂ යක්ෂණීන් ලෙස ජීවත් වුණොත් ඒ අය ළඟ උපදින්න සොයාගෙන එන්නේ යක්ෂ දරුවන්.

අම්මාගේ මානසික ක්‍රියාකාරකම් දරුවාට ද බලපානවා. අම්මා තාත්තා නිතර නිතර අඬදබර කර ගන්නා විට දරුවන්ගේ මානසිකත්වයත් එලෙසම වැඩෙනවා. එබැවින් සමාජයත් යහපත් කර ගැනීමට යුගදිවි ගෙවන දෙමහල්ලන්ට පැවරී ඇති වගකීම කෙතරම්'දැයි කල්පනා කර බලන්න.

සෝමතිලක ජයමහ ගයන මේ ගීතය අපේ යුගදිවි ගෙවන තරුණ තරුණියන්ගේ අවධානයට ලක්විය යුතු විශිෂ්ට කලා නිර්මාණයක්.

**පොඩි දුවගේ සිනා වැලයි**
**පොඩි පුතුගේ කතා පෙළයි**
**ප්‍රිය බිරිඳගේ සෙනෙහෙ විලයි**
**මගේ නිවන මගේ පැල්පතයි**

**කටු මැටි ගෑ බිත්ති පුරා**
**පළිඟු මැණික් එළිය දිලේ**
**ගොම මැටි ගෑ ගෙබිම මගේ**
**පියවිලි බුමුතුරුණු වගේ**

**ලබන නමුත් දුක් පීඩා**
**කුඩු වුණොත් පුංචි පැලේ**
**අඹුදරුවන් අතරතුරේ**
**මට නිමි නැති සුවය දැනේ**



මොරටුව ලුනාව උයන පාරේ
බෝධිරාජාරාමාධිපති
කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය
**අගලකඩ සිරිසුමන හිමි**

**අධ්‍යාපනය යනු දැනුම කුසලතා සේ ම ආකල්පයන්ගේ ද දියුණුව බව සිතට ගන්න**

## දඹදිව බුද්ධගයාවේ වෙසක් පෝය ඇතුළුව දින 04ක දාන, ශීල, භාවනා වැඩසටහන් වලට සහභාගී වීමට මෙත් සිතින් ආරාධනා!

අප මහා බෝසතාණන් වහන්සේ උතුම් සම්බුදු බව ලැබූ බුද්ධගයාවේ වජ්‍රාසනය අසල වෙසක් පොහොය දිනයේ සිල් සමාදන් වී දින 04ක් දානමය ශීලමය පිංකම් රැසකට දායක වීමට අප හා එක්වන්න.
බියකරු බව දකිමින් නිමක් නොදැක යන මේ සංසාර ගමනේ අති දුර්ලභ වූ පුණ්‍ය කර්මයකට උරුමකම් කියන්නට ඔබටත් අනගි අවස්ථාවක්...

**පිටත්වීම අප්‍රේල් 26**

- බුද්ධගයාවේ රාත්‍රී 04 ක්
- සිල් සමාදන් වීම
- දාන, ශීල, භාවනා සහ බෝධි පූජා ඇතුළු පිංකම් රැසක්
  - දුම්රිය ගමන් නොමැත. සම්පූර්ණ අයකිරීම රු. 235,000/=
- වන්දනා ස්ථාන

බරණැස ඉසිපතන මිගදාය, බුද්ධගයාව, රජගහ නුවර, විශාලා මහනුවර, කුසිනාරාව,ලුම්බිණිය, කපිලවස්තු පුරය, සංකස්ස, කොසඹෑ නුවර, දිල්ලිය

**දඹදිව චාරිකා**
අගෝස්තු, සැප්තැම්බර්, නොවැම්බර් - දින 14
සාංචිය ඇතුලත් - දින 20

මියන්මාර චාරිකාව - **ජූනි සහ දෙසැම්බර් - දින 10**
තායිලන්ත චාරිකාව - **දින 05**
මැලේසියා සහ සංගප්පූරු චාරිකා - **දින 06**

**සංවිධානය**
වසර 30කට අධික කාලයක් චාරිකා සංවිධානය කළ බුද්ධ ශාසන අමාත්‍යංශයේ ලියාපදිංචි

**තිරුපති ශ්‍රී කාන්ත දඹදිව සංචාරකයෝ**
නො . 297, දකුණු බටගම, කඳාන
දු.ක. 011-5629514 / 071-4492282 / 076-3844378 / 076-6258221 / 075-7231919



## දයාභාරත දඹදිව චාරිකා - මොරටුව

ඉන්දියාව, නේපාලය, තායිලන්තය, බුරුම, සිංගප්පූරුව, මැලේසියාව, වියට්නාමය, ඩුබායි

**දඹදිව චාරිකා පිටත්වීම**
**2023 පෙබරවාරි, මාර්තු, අගෝස්තු, ඔක්තෝම්බර්, නොවැම්බර්**

බුද්ධගයාව, බරණැස, රජගහනුවර, විශාලාමහනුවර, කුසිනාරානුවර, ලුම්බිණිය කපිලවස්තු, කොසඹෑ නුවර, සැවැත්නුවර, සංකස්ස, දිල්ලි ඇතුළු අනු ස්ථාන 100 වැඩි ප්‍රමාණයක් වන්දනා කෙරේ.

- → දින 13 චාරිකාව රු. 235000.00 (දුම්රියේ ගමන් නැත)
- → දින 16 චාරිකාව රු. 210000.00 (දුම්රියේ ගමන් වාර 2ක් සහ සාංචි ඇතුලත්ව)
- → දින 15 චාරිකාව රු. 235000.00 (කොළඹ-චෙන්නයි , දිල්ලි-කොළඹ සාංචි ඇතුලත්ව)
- → තායිලන්ත චාරිකාව පිටත්වීම 2023 අප්‍රියෙල් රු. 300000.00
- → බුරුම චාරිකාව පිටත්වීම 2023 ජූනි
- → මැලේසියා/සිංගප්පූරු චාරිකාව 2023 මාර්තු රු. 400000.00
- → තිරුපති චාරිකාව දින 03 පිටත්වීම 2023 අප්‍රේල් රු. 140000.00

**නැගෙනහිර ඉන්දියාව සහ එයින් එහා බුද්ධ භූමි වන්දනාව**
පිටත්වීම 2023 (දින 11) සම්පූර්ණ ගාස්තුව රු. 220000.00
සාම්ප්‍රදායික දඹදිව වන්දනා ක්‍රම වලින් බැහැරව මහා භාරතයේ නැගෙනහිර ඉන්දියාව, මධ්‍ය ඉන්දියාව සහ බටහිර ඉන්දියාවේ සුප්‍රකට ඓතිහාසික බෞද්ධ වන්දනා භූමි දැකබලා ගැනීම සඳහා
අජන්තා, එල්ලෝරා බෞද්ධ ලෙන් විහාර, අමරාවතී බුද්ධ ප්‍රතිමා හා කලා නිර්මාණ, නාගර්ජුන කොණ්ඩා, සචීචබද්ධ(තිරුපති), සාංචි සහ චෙන්නායි සාප්පු සවාරි ඇතුලත්ව

**දකුණු ඉන්දියානු චාරිකාව**
පිටත්වීම 2023 (දින 07/රාත්‍රී 06) සම්පූර්ණ ගාස්තුව රු. 200000.00
තිරුපති, බැංගලූර්, මයිසූර්, ඌටි සහ චෙන්නායි සාප්පු සවාරි ඇතුලත්ව

**වැඩි විස්තර සඳහා,**
ප්‍රධාන සංවිධායිකා : එම්. චන්දිමාලි ප්‍රනාන්දු
072 2803454 / 075 6343377 / 071 0632025
011 2657222 /077 7425726 / 077 7307851
0777413031

**නො. 14/4A, මෝසස් පටුමග, කටුකුරුන්ද, මොරටුව**


## බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඇති සිල්පද වළගම්බා රජ සමයේ භාවිතයෙන් ඉවත් කිරීම.

වළගම්බා රජ, රජ කරන අවධිය වූ ක්‍රිස්තු පූර්ව 88 සහ 76 අතර බැමිණිතියා සාගතය අවසන් කාලයේ ස්වාමින් වහන්සේලා කල්ලා ගම ජනපදයේ මණ්ඩලාරාමයට රැස්ව ශාසනයේ මූලය පරියාප්තියද නැතහොත් ප්‍රතිපත්තිය දැයි කියා විමසීමට වාදයක් විය. වළගම්බා රජු ස්වාමින් වහන්සේලාට ඉඩකඩම්, වතුපිටි, පන්සල්, විහාරාරාම සාදා දීමත් එසේම අභයගිරි පාක්ෂිකයන්ට වැටුප් ලැබෙන ක්‍රමයක්ද ඇති කරන ලදී. රජතුමාත්, ඇමතිවරුත් තමතමන් විහාර ඉඳි කරවා තිස්ස තෙරුන් වෙත ගොස් විහාර උන්වහන්සේට පූජා කරන ලදී. රජතුමාද ඇමතියෝද තම තමන්ගේ විහාරවල වාසය කරන භික්ෂූන්ට නානා ප්‍රකාර වස්තූද පූජා කළහ. රජතුමා සහ ඇමතිවරු කර ඇත්තේ දුක නැති කිරීම සඳහා කටයුතු කිරීම නොව තව තවත් දුකෙහිම නියළෙන්නට තණ්හාව වැඩෙන ලෙස කටයුතු කිරීමය.

වාදයේදී වැඩි ඡන්දයෙන් පාංශුකූල හිමිවරුන්ගේ ප්‍රතිපත්ති රැකීම පරදා ධර්ම කථික හිමිවරුන්ගේ පරියාප්තිය ජය ගන්නා ලදී. එදා සිට වචනය සංවර කරන සිල්පද හතරත් කය සංවර කරන සිල්පද තුනත් වන සිල්පද හත භාවිතයෙන් ඉවත් විය.

ධර්ම කථික හිමිවරු ජයගත් අතර පාංශුකූල හිමිවරු පරාජය විය. එදා සිට බුදුරජාණන් වහන්සේ දේශනා කළ ප්‍රතිපත්ති නැති වී ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සිල්පද භාවිතයෙන් ඉවත් වී ඒ වෙනුවට සිදුහත් කුමාරයා උපදින්නටත් පළමු භාවිතා කළ පන්සිල්, අටසිල්, දසසිල් භාවිතයට ගෙන අද දක්වා එය භාවිතා වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඇති ප්‍රතිපදා ගැන දැනුමක් මෙන්ම භාවිතයක් නැති බැවින් කුසල් අකුසල්, පින් පව් දෙක හඳුනන්නේ නැත.

පින් යනු කය හා වචනින් කරන යහපත් ක්‍රියා. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ තුන්වන ප්‍රතිපදාවේ දේශනා කර ඇති සිල් පදවන බොරු නොකීම, කේලාම් නොකීම, පරුෂ වචන නොකීම, හිස් වචන නොකීම වචනින් සිදු කරන පින් හතර සහ හතරවන ප්‍රතිපදාවේ කයෙන් සිදු කරන පින් තුන සතුන් නොමැරීම, සොරකම් නොකිරීම, කාමයෙහි වරදවා නොහැසිරීම.

පව් යනු කය හා වචනින් කරන නරක අයහපත් ක්‍රියාවේ. වචනින් කරන පව් හතරකි. බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස්වචන කීමයි. කයෙන් කරන පව් තුනකි. එනම් සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීමයි. මෙම හත කය හා වචනින් කරන පව් හතයි.

කුසල් යනු සිතේ ඇතිවන යහපත් සිතිවිලි වන කරුණාව, මෛත්‍රිය, දයාව පරාර්ථකාමී වැනි සිතිවිලියි. අකුසල් යනු සිතින් සිතන සිතේ ඇතිවන නරක සිතිවිලි වන තණ්හාව, ඊර්ෂ්‍යාව, ක්‍රෝධ, වෛර ආත්මාර්ථකාමී සිතිවිලි වැනි සිතේ ඇතිවන නරක සිතිවිලියි.

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දේශනා කර ඇති පින් හත හෝ පව් හත අනුව කිසිම පවක් හෝ පිනක් සිතින් කිරීමට නොහැක.

එහෙත් සිතින් පින් පව් කිරීමට සිතිය හැකිය. එහෙත් සිතින් පින් පව් කිරීමට නොහැක.

කය හා වචනින් කිසිවෙකුටත් කුසල් අකුසල් කිරීමට නොහැක. කරුණාව, මෛත්‍රිය, දයාව පරාර්ථකාමී සිතිවිලි වන කුසල් කයට හා වචනයට ඇති කර ගැනීමට නොහැකිය. එසේම තණ්හා, ඊර්ෂ්‍යා, ක්‍රෝධය, වෛර හෝ ආත්මාර්ථකාමී සිතිවිලි වන අකුසල් කයට හා වචනයට ඇති කරගැනීමට නොහැක.

කය හා වචනින් කළහැක්කේ පින් පව් පමණි. සිතින් කළහැක්කේ කුසල් අකුසල් පමණි. දැන්වත් ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කර සිත - කය - වචනය පිරිසිදු කරගෙන නිවන් මඟ අවබෝධ කර ගැනීමට බලනු මැනවි.


**ත්‍රිපිටකය හැදෑරීමට ඒ. පී. ද. සොයිසා මහතා සරල බසට නැගූ ත්‍රිපිටකය කියවන්න.**

- පින් සහ පව් කුසල් සහ අකුසල් - 120/-
- චිත්ත නියාම ධර්ම - 125/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දැනුම - 125/-
- සිත මනස සහ ආගම් 80/-
- පින සහ කුසලය දෙකක්ද? එකක්ද? - 200/-
- සිතිවිලි සහ සිතින් සිතීම - 150/-
- කය වචන දෙකින් පින් - පව්, සිතින් කුසල් - අකුසල් 250/-
- පංච උපාදානස්කන්ධය 250/-
- බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය - 350/-
- සිත සහ මනසින් කුසල් අකුසල් - කය සහ වචනින් පින් පව් - 100/-
- සිල්වතෙකු වී දහම අවබෝධ කරගන්න - 300/-
- සිල්වතෙකු වී දහම අවබෝධ කරගන්න - 300/-
- සිතෙහි සතුට ඇතිකර ගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න - 125/-


**සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම**
661, 665, 675 පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10. දුරකථන: (011) 2685369, 2686925 ෆැක්ස්: 2674187

දවසක් බුදු රජාණන් වහන්සේ හමුවට පැමිණි දෙවියකු උන්වහන්සේගෙන් මෙසේ ඇසීය.

"බුදුරජාණන් වහන්ස ලෝකය තුළ වසන සත්වයෝ අතර කවරකු නිදා සිටින්නේ ද ? කවරකු අවදිව සිටින්නේ ද ? කුමක් හේතු කොට ගෙන කෙනකු පිරිසිදු වන්නේ ද ? අපිරිසුදු වන්නේ ද ? ඊට පිළිතුරු දුන් බුදු රජාණන් වහන්සේ".

"දේවතාවනි පස්දෙනකු නිදා සිටින අතර, පස් දෙනකු අවදියෙන් සිටියි. පස් දෙනකු අවදියෙන් සිටින අතර පස්දෙනකු නිදා සිටියි. පස්වැදෑරුම් කාරණා මත අපිරිසිදු බවට පත් වේ."

# පස්කම් සුව නිසා නිවන් මඟ ඇහිරීම වළකා ගන්නේ මෙලෙසයි



මෙම කරුණුවල තේරුම කුමක්දැයි විමසා බැලීම ඉතා වැදගත් වේ.

කිසිදු ප්‍රයෝජනයක්, ඵලක් නැති කටයුත්තක යෙදීම නිදාගැනීම යි. ඇස, කන, නාසය, දිව, ශරීරය නින්දේ දී වැසී පවතී. සිතේ ඇතුළත නොබිඳී ඉදිරියට ගලා යයි. බාහිර කාරණා නිසා සිතිවිලි කැළඹීමට පත් නොවේ. එබැවින් මනසේ ක්‍රියාකාරීත්වය ව්‍යාකූල නොවේ.

නින්දෙන් අවදි වූ පසු රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ක්‍රියාත්මක වනු ඇත. ඉන් සුඛ, දුක්ඛ වශයෙන් අරමුණු ලබා ගැනීම සිදු වේ. හැම අරමුණකම ගැටේ. ප්‍රතිපලය අරමුණු ක්‍රියා කරවීම නිසා ප්‍රතික්‍රියා වශයෙන් විපාක ලැබෙණු ඇත.

එසේම පුද්ගලයා සතුටු නොවන, තෘප්තියට පත් නොවන දෙයින් ඈත් වේ. පංච ඉන්ද්‍රියන් තුළින් ලබන සතුටු අරමුණු නිසා තෘප්තියට පත්වේ. දැඩි ලෙස තව තවත් එහි ඇලීම් ඇති වේ. ආශා කරයි. ඒ තුළින් විවිධ වින්දනයන් ලබයි. නින්දේ සිට ඇවිදින අයකු යම් සේ ද, එසේ ම සිත උම්මත්තක වී, උමතු වී සිටින අයකු යම් දේකට පෙළඹේ ද එසේ සිදුවන වැරැදි මෙසේ සලකනු ඇත.

ධර්මානුකූල ප්‍රතිපදා තුළ නැති අවුල් වූ, ව්‍යාකූල වූ සියලු දෙනා බුදු රජාණන් වහන්සේ දකින්නේ අවදියෙන් සිටින අය නිදා සිටින ආකාරයයි.

"සබ්බේ පුථුජ්ජනා උම්මත්තකා" යනුවෙන් ප්‍රකාශ කළේ එයයි. මනා සිහියෙන් සීල, සමාධි, ප්‍රඥා වඩනු ලබන ධර්මානු ධර්ම ප්‍රතිපත්ති අනුගමනය කරන පුද්ගලයා, නිර්වාණ මාර්ගයට පිලිපන් පුද්ගලයා නිතරම අවදියෙන් සිටින, අවබෝධයෙන් සිටින අයකු ලෙස බුදු රජාණන් වහන්සේ පෙන්වා දී ඇත.

නිර්වාණ මාර්ගය පිළිබඳ සිත් වූ පුද්ගලයා පංච නීවරණයෙන් සිදු වන්නා වූ ජීවිත ආගාධය අවබෝධ කරගෙන, සිත වසා ඇති අඳුර පිළිබඳ මනා අවබෝධයෙන්, පංච කාම සම්පත්තීන් පිළිබඳ ඇලී ගැලී නොසිට කටයුතු කරයි.

පංච කාම සම්පත්තීන්වල ඇලී සිටීමේ දැඩි ආශාව "කාමච්ඡන්දය" ලෙස පෙන්වා දිය හැක. එසේම වස්තු කාමය, ක්ලේශ කාමය වශයෙන් කාරණා දෙකක් පෙන්වා දිය හැකි ය.

ඉන්ද්‍රියයන් පිනවීමට ඇති කෑදර ආශාව වස්තු කාමය වේ. තමාගේ අයිතිවාසිකම් දේපළ, ධනය, බලය, මුදල් මත ඇලී ගැලී කටයුතු කිරීම වස්තු කාමයයි.

ක්ලේශ කාමය යනු පහත් වූ ආශාවන් සන්තර්පණය කිරීම, ඒ සඳහා ඇලී කටයුතු කිරීම, සිත සිතා ගැටීම වශයෙන් හඳුන්වාදිය හැකි ය.

මේ ඇලීම, ගැටීම නිසා පුද්ගලයා සමාජ වටපිටාව තුළ ඇසුරු කරන අය අතර පිරිහීමට පත් වේ. අධාර්මික, ගුණ ධර්ම පිරිහුණ අශීලාචාර පුද්ගලයකු වශයෙන් විදහා පෙනේ. අඥාන, අශිෂ්ඨයකු ලෙස බලන්නා, දකින්නා පිළිකුල් කරයි. නින්දා කරයි. ගැරහීමට බඳුන් වේ.

එසේම බොහෝ දෙනා භාවනාව සඳහා යොමු වන්නේ ඉහත නීවරණයි. ධර්ම ක්ෂය කිරීම පිණිස සිත පාලනය කර ගැනීම සඳහායි. එහෙත් පිළිකුල් භාවනාව වැඩීම පිණිස යොමුවූවත් ආශා මැඩීම එතරම් පහසු කටයුත්තක් නොවෙයි. මන් ද ඒ ලෝකෝත්තර මාර්ගයට අයත් එකකි. තාවකාලික මැඩීමක් සිදුවුව ද සම්පූර්ණ නොවෙයි.

විදර්ශනා වඩන්නා තුළ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලක්ෂණ දැකිය හැක. ඒ තුළින් කාමච්ඡන්දය යටපත් වේ.

තමාගේ හිතේ තවත් අයකු කෙරේ තරහක් නිසා ගැටීම ඇති වේ. ඒ තුළින් අයහපත් දේ සිදු වේ. පළිගැනීම ඇති වේ. ඇති වන්නා වූ කෝපය ව්‍යාපදය යැයි හඳුනාගත යුතු ය.

සමහරු සමාජයේ විවිධ හේතු කාරණා නිසා තම අදහස් ඉදිරිපත් කරමින් තමා ඉස්මතුවීමටත් අනෙකා පහත් කිරීමටත්, ධනය, බලය, නිලය තමාට වඩා අනෙකාට ලැබෙන්නේ නම් ඔහුට හෝ ඇයට විවිධ බාධා පැමිණවීමටත් කටයුතු කරයි. ඒ තුළින් සතුරන් ඇතිවෙයි. එවන් වටපිටාවක නොගැටී, නොඇලී සිට සිත භාවනාවේ යොදන්නට හැකි වේ නම් ලෞකික වශයෙන් ජය ලබා ගත හැකිවන අතර. ලෝකෝත්තර වශයෙන් නීවරණයන්ගෙන් මිදී ජය ගත හැක.

එසේම ව්‍යාපාදය නිසා පුද්ගලයකුගේ නියම පැහැපත් බව පවා නැතිවෙයි. සිත චංචල වේ. හිතේ අසතුට නිතර ඇතිවේ. වේදනාකාරී මානසික මට්ටම වැඩි වේ. නිතර බියෙන් සැකයෙන් වාසය කිරීමට සිදු වේ. මේ තත්වය මෝඩයාට, අනුවණයාට නොදැනේ. නොපෙනේ.

එසේම අකැමැති අප්‍රිය වූ අරමුණු නිසා තරහා ව, ක්‍රෝධය ඇතිවේ. සිතේ තැන්පත්ව ඇති ක්ලේශය යටපත් කර සිටියත්, විටක නිදා සිට අවදී වූ කොටියකු ලෙස යටපත් කරගෙන සිටි ක්‍රෝධය ඉස්මතු වේ. ඒ තුළින් ප්‍රාණඝාතය සිදු වේ. පරුෂ වචන පිට වේ. අනුසය, විතික්ඛම, පර්යුට්ඨාන වශයෙන් මේවා ධර්මානුකූලව විස්තර වේ.

කෝපය නිසා ඇතිවන්නා වූ ක්ලේෂය දැවී අළු වී ගිය ලැව් ගින්නකට මැදි වූ වනයක් නැවත ගින්නකින් අළු නොවන්නා සේ සකෘදාගාමී, අනාගාමී වූ මාර්ගපල ලාභියාගේ සිත්හි හට නොගනී. සෝකය, සන්තාපය ඇති නොවේ. සදාකාලික සුවය, ප්‍රීතිය, සතුට ළං වී නිවන ජය ගනු ලැබේ. තමා ඉදිරියේ තමා කැඩපතක් වී යථාර්ථය දැකීමට හැකිවන්නේ නම් ගිහි, පැවිදි ලෝක සත්වයාට පස්කම් සැපයෙන් නිවන් මග අහුරා තැබීම වළකා ගත හැකි වේ.



වාද්දුව මොල්ලිගොඩ දෙගම්බද මහා විහාරවාසී
ශාස්ත්‍රවේදී
**වැලිපත ධම්මාරාම හිමි**

# මං මුළාවී සසර කතරේ



කොතැන සිට මම ආවෙද
යන්නෙ කොතැනද නොදනිමි
කවුරුදෝ මම කවුරුදෝ
මං මුළා වී භව මගේ

මගේ සම්බුදු සමිඳුණේ
දහම හැර විසඳුම් නැතේ

ආ තැනක් ගැන නොසොයමි
යන තැනක් ගැන නොසිතමී
සැපය කියලා වැළඳ ගත්තේ
දැවෙන ගිනි කන්දකි මෙමා

මගේ සම්බුදු සමිඳුණේ
දහම හැර විසඳුම් නැතේ

සසරෙ ගිනි දැල් නිවාගත් දා
සදාතන සුවයකි ලැබෙන්නේ
නිවී සැනසුන සිතෙහි ඇත්තේ
නිවන් පුරයේ අමා සිසිලයි

මගේ සම්බුදු සමිඳුණේ
දහම හැර විසඳුම් නැතේ

ආචාර්ය
රත්නපාල වික්‍රමසිංහ

## පැවිදිවීමට

වැදගත් පවුලක, ගොවි විශ්‍රාම වැටුපක් හිමි මාතාවකට පැවිදි වීමට බස්නාහිර/ වයඹ පළාතින් නිදහස් තැනක ආරාමයක් සොයයි.

071- 5989399

---

**තායිලන්තයෙන් ගෙන්වන ලද**

අඩි 3 උස අඩි 2 පළල පිත්තල ඉදි පිළිමය හා අඩි 1 1/2 ක් උස අඩියක් පළල පිත්තල ඉදිපිළිම හා අඩි 4 1/2 දිග අඩි 2 1/2 පළල ශ්‍රී පතුල විකිණීමට.

0718071009

---

## ශ්‍රී විසුද්ධාරාම භික්ෂුණී ආරාමයේ

තාප්පය හා වැසිකිළිය සාදා දීමට උදව් උපකාර කළ හැකි අය විමසන්න.

**0779565802 / 0729133594**

---

**වයඹ පළාතේ රාමඤ්ඤ නිකායට අයත් පන්සල් දෙකක් සාමණේර ආයතනයකට හෝ ආරණ්‍යවාසී හිමි නමකට පවරා දෙමි.**

**විමසන්න : 0718106710**

---

අලුතින් ඉදිවෙමින් පවතින චෛත්‍යයකට චූඩා මාණික්‍යයක් සහ කොතක් මිලදී ගැනීමට අවශ්‍යයි.

**මොරටුව**

**0777777987**

---

අවු. 30 ක්, වයසැති මාස 4 ක දරුවකු සිටින මවකගේ වකුගඩු දෙකම නරක් වී ඇත. A නෙගෙටිව්, O නොගෙටිව්, හෝ A පොසිටිව්, O පොසිටිව් වකුගඩුවක් පරිත්‍යාගශීලියකු වේ නම් 077-2584890 හෝ 077-6601719 යන අංකයට දන්වන ලෙස ඉතාම කාරුණිකව ඉල්ලා සිටිමි. මුදල් පරිත්‍යාගයක්ද කිරීමටද කැමතියි.

---

## උපසම්පදා ස්වාමීන් වහන්සේ නමක් විවේකීව වැඩ සිටීම සඳහා ස්ථානයක් සොයයි.

උගත් තරුණ භාවනා යෝගී ස්වාමීන් වහන්සේලා දෙනමක් සඳහා විවේකීව සිටිනු පිණිස නිවන් අවබෝධ කරනු කැමති පිරිසකට භාවනා මෙන්ම තථාගතයන් වහන්සේගේ ධර්මය විස්තර වශයෙන් කියා දීමටත් සුදුසු ජල පහසුකම්, විදුලිය ඇති විවේකීව ස්ථානයක් සොයයි. අතහැර දැමූ නිවසක් හෝ පන්සලක් (ලියාපදිංචි නොකළ) ඊට සුදුසු වනගත ඉඩමක් හෝ කම්නැත. සැදැහැති ධානපති පිංවතෙකුට මහගු අවස්ථාවකි. බුදු සසුනේ උන්නතිය සඳහා අත දෙන්න.

**ස්වාමීන් වහන්සේගේ දු. අ. 0743408510 / 0717510325**

---

## සෙනෙහස වැඩිහිටි නිවාසය - හොරණ

**අසරණ වැඩිහිටියන් සඳහා නොමිලේ නේවාසික පහසුකම් ඇත.**

**දානමය කටයුතු සහ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ආධාර අවශ්‍යයි.**

**සෙනෙහස සමාජ සත්කාරක පදනම, කොමර්ෂල් බැංකුව - තලවතුගොඩ ශාඛාව**

**ගිණුම් අංක - 8008371245**

**විමසන්න - 071 - 8011656**

---

## විහාර ගොඩනැගිලි, බෝධි ප්‍රාකාර, චෛත්‍ය නිර්මාණ හා ප්‍රතිසංස්කරණය

0761103131

0715925103

---

## විහාරස්ථානයක පැවිදි වීමට

**අවුරුදු 9-20 අතර සැදැහැවත් කුල දරුවනට අවස්ථාව.**

**සියලුම අධ්‍යාපන කටයුතු සඳහා උපරිම සහයෝගය.**

අමතන්න :

**0710-338440**

---

**මෙහෙණි සසුනට ඇතුළත් වීමට ආරාධනා !**

මේ ආරාධනය පරම පවිත්‍ර චේතනාවෙන් සසර ගමන අවසන් කොට මගඵල නිවන් අවබෝධ කර ගැනීමට බලාපොරොත්තු වන නිවුණු මනසක් ඇති, වයස අවුරුදු 40 හෝ ඊට අඩු, යම් අධ්‍යාපන සුදුසුකමක් ඇති කාන්තාවන්/ මෙහෙණින් වහන්සේ සඳහායි. නුදුරේම ආරම්භ කිරීමට කටයුතු සූදානම් කොට ඇති මෙහෙණි ආරාමයක පරම පවිත්‍ර සිරි සද්ධර්මය පරිශීරනය කර පසක් කොට අවබෝධය ලැබ, තම ජීවිතයේ ඉදිරි කාලය සසුන් ගත වී මග වැඩීමට අධිෂ්ඨානය ඔබ සතු නම්, කරුණාකර සියලු අත්‍යවශ්‍ය විස්තර සහිතව ලියමනක් අපගේ ලිපිනයට ඉදිරිපත් කරන්න. හැකි අය ඊ-මේල් කරන්න.

ලිපිනය
ලේඛකාධිකාරී,
නොම්මර 28
සිද්ධාර්ථ පැසේජ් කොළඹ 05

ඊ-මේල්
boossa.monastery@gmail.com

---

## උතුරු පළාතේ පිහිටි දුෂ්කර ගමක පිහිටි අප විහාරස්ථානයේ

12 නමක් වැඩ ඉන්නා අතර, ඉතා අඩුපාඩු මැද්දේ පවත්වාගෙන යන විහාරස්ථානයකි. භික්ෂූන් වහන්සේලාගේ සිව්පසය ද හරි අමාරුවෙන් පවත්වාගෙන යන අතර,

**අපට දාන ශාලාවක්, ධාතු මන්දිරයක්, වගේම මෙවර වස් කාලයේ කඨිනය භාරගෙන පැවැත්වීමට මෙන්ම භික්ෂූන් වහන්සේලාගේ ඉගෙනීමට පොත්පත් සහ වියළි සලාක කටයුතු කරන්නේ නම් අගනේය.**

**මෙයට විහාරාධිපති හිමි : 0714-259956.**

---

වයස්ගත එක් ස්වාමීන් වහන්සේ නමක් පමණක් සිටින විහාරස්ථානයක දියුණුවට වැඩ කිරීමට කැමැත්තෙමි.

**අමතන්න : 0782948176**

---

## පෝය දින විශේෂ භාවනා වැඩසටහනක්

**ඕනෑම අයෙකුට සහභාගි විය හැකියි.**

(පෙ.ව. 8.30 සිට ප.ව. 2.30 දක්වා)

ධර්ම පාඨමාලාව සති අන්තයේ පැවැත්වේ.

**මනෝදය භාවනා අසපුව**

**සිරිවර්ධනාරාමය, පන්සල පටුමග, කොල්ලුපිටිය.**

**විමසීම් : 077-9260912**

---

**රත්නදීප සංචාරකයෝ**

**ලාඕස් - සිංගප්පූරු**
**දින 10 - රු. 554,000**

**කාම්බෝජියා - වියට්නාම්**
**දින 10 - රු. 527,000**

**තායිලන්ත - සිංගප්පූරු**
**දින 08 - රු. 482,000**

**බුරුම**
**දින 10 - රු. 499,000**

**විමසීම් : 077 245 9637 / 011 280 7374**
**327/1, 1/1, නාවල පාර, නාවල.**

රජයේ ලියාපදිංචි අංකය : W/202063

---

**රාමඤ්ඤ නිකායට අයත් පන්සලක**

**පැවිදි වීමෙන් පසු පවරා දෙමි. ඕනෑම වයස් සීමාවක අය පැවිදිකර අධ්‍යාපනයට යොමු කරමි. භේද නැත.**

**රියදුරු වැඩට සහ වතාවත් සඳහාද අයෙක් අවශ්‍යව ඇත.**

**විමසන්න : 0773355222**

---

## පානදුර අළුබෝමුල්ල පවත්වාගෙන ගිය අංග සම්පූර්ණ වැඩිහිටි නිවාසයක්, වෙන්ව පවතින කුඩා නිවසක් සහ ආදායම් ලබන පොල්, කුරුඳු, ගම්මිරිස් සහිත පර්. 215 ක ඉඩම විකිණීමට.

0777-756191

---

## කාරුණික ආයාචනයයි

අප කොළඹ දිස්ත්‍රික්කයේ ජීවත් වෙමි. ආර්ථික දුෂ්කරතා මැද ජීවත් වීමට අසීරු තත්වයක සිටින බැවින් නිවසක් ලබා දීමට හැකි දානපතියෙක් සිටී නම් මෙම අංකයට කථාකරන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

**077-1186525**

---

## ස්විස් ලංකා සදහම් සෙවන අබ්බලයාය - කටාන

## සිව්දින නේවාසික භාවනා වැඩසටහන

**මාර්තු - 20 - 24 දක්වා පැවැත්වේ**

**නේවාසික පහසුකම් ඇත.**

**(මාර්තු 19 වැනිදා සවස පැමිණෙන්න)**

**විමසීම් :**

031-2246636,077- 6104263,071 - 5284392

---

## රංගිරිලෙන් ධම්මකායි මෙත්තා භාවනා සෙනසුන

**පැවිදිව භාවනායෝගීව වාසය කිරීමට කැමැති ගිහි(පිරිමි) පිංවතුන්ට අවස්ථාව ලබාදීමට හැකිය.**

වගකීම් හා බැඳීම් වලින් තොර පිංවතුන් විමසන්න.

**විමසීම් : ධම්මානන්ද ස්ථවිර : 072-3031742, 077-1480591**
**ධම්මජෝති ස්ථවිර : 071-8364600**
**සීලානන්ද ස්ථවිර : 071-6052811**
**(පෙ.ව. 8.00 සිට ප.ව. 6.00 දක්වා)**

---

## වස් විසීමට ආරාධනා

**නිකවැරටියට ආසන්න විහාරස්ථානයක වස් විසීම සඳහා සියම් නිකායික දැන උගත් මධ්‍යම වයසේ හිමිනමකට ආරාධනා.**

**විවේකීව බණ භාවනාවල යෙදීමට පහසුකම් ඇත.**

**077-6112512**

# අනුරාධපුර ඓතිහාසික ලංකාරාම පුණ්‍ය භූමියේ දී

ත්‍රිපිටකාචාර්ය රාජකීය පණ්ඩිත

## පූජ්‍ය බළන්ගොඩ රාධ ස්වාමීන් වහන්සේගේ

## විචිත්‍ර බුදුගුණ ධර්ම දේශනාව

2023 මාර්තු 11 සෙනසුරාදා

සවස 04.00 සිට



රළපනාවේ ධම්මජෝති නා හිමි
අනුරාධපුර ලංකාරාමාධිකාරී,
උතුරු මධ්‍යම දෙදිසාවේ ප්‍රධාන අධිකරණ සංඝනායක.

අනුරාධපුර අටමස්ථාන පූජා භූමියේ පිහිටි ලංකාරාම පුද බිමට ක්‍රිස්තු පූර්ව පළමු සියවස දක්වා ඉතිහාසයක් උරුම ව ඇත. පරසතුරන් පරාජය කළ වලගම්බා රජු,තමාගේත් රටේත් ආරක්ෂාව වෙනුවෙන් ජීවිතය කැප කළ සෝමා දේවිය වෙනුවෙන් ඉදි කළ මෙම පුද බිම සෝමාරාමය යනුවෙන් හැඳින් වූ බවත් ඉතිහාස තොරතුරු අතර වෙයි. සෝමා දේවියගේ කනකර ආභරණ නිදන් කළ පසු මෙය මනි සෝමාරාම යනුවෙන් ද හඳුන්වා ඇත. පවුරක් සේ රට රැක ගත් හෙයින් පසු කලෙක 'ලංකාරාමය' යනුවෙන් ව්‍යවහාරයට එක්ව ඇත. කලින් කලට කුමන නමකින් හැඳින් වුව ද මෙම පුද බිමේ ඓතිහාසික වටිනාකමට හා පූජනීයත්වයට හිමි වනුයේ අද්විතීය තැනකි.

අභයගිරිය ව්‍යාපෘතිය යටතේ සිදු කළ කැණීම් තුළින් මෙහි පෞරාණික බව හා මේ වටා බැඳුණු ඓතිහාසික තොරතුරු රැසක් තහවුරු කර ගැනීමට හැකි වුණි. මුල් යුගයේ මධ්‍යම ප්‍රමාණයේ චෛත්‍යයක් වූ සෝමාරාම වෙහෙර වටා වටදාගෙයක් තිබූ බව ද තහවුරු වී ඇත. සෙසු කැණීම් තුළින් පැරණි බෝධිඝරයක්, බුද්ධ ප්‍රතිමාවක් හා ගල්ලිඳක් ඇතුළු ආරාම සංකීර්ණයක තොරතුරු රැසක් සොයා ගෙන ඇත. අතීතයේ මෙම පුද බිමෙහි රහතුන් වහන්සේලා හා රහත් මෙහෙණින් වහන්සේලා වැඩ සිටි බවට මෙම තොරතුරු සාක්ෂි සපය යි.

අද කැණීම් තුළින් අපට තහවුරු වන මෙහි තිබූ අතීත ශ්‍රී විභූතිය පසු කලෙක අහිමි ව තිබුණේ කාලයාගේ ඇවෑමෙනි. පරසතුරු ආක්‍රමණ ද එයට හේතු වන්නට ඇත.

**වර්ෂ 1991 දී අප මෙම පුද බිමට වැඩම වීමත් සමග මෙහි නව ප්‍රතිසංස්කරණ කටයුතු ඇරඹීමට මුල පිරුණි. ඒ යටතේ මේ වන විට බුද්ධ මන්දිරයක් හා සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් ඉදි කර ඇත. එයට සමගාමීව ලංකාරාම චෛත්‍ය මළුව සුදු වැලි අතුරා චිත්තාකර්ෂණීය ලෙස සකස් කරමින් දිවා රෑ පින් වැඩෙන පින්කමක් සිදු කරන්නට ලැබීම අප සියලු දෙනා ලැබූ භාග්‍යයකි. මේ සියලු කටයුතු සඳහා අටමස්ථානාධිපති අති පූජ්‍ය පල්ලේගම හේමරතන නාහිමියන්ගේ අනුශාසකත්වය හැමවිටම ආශිර්වාදයක්ම වූ බව ගෞරවයෙන් සිහිපත් කරමි.**

මුල් යුගයේ 'ශිලා සොබ්බ කණ්ඨක' හෙවත් 'ගල හෙබ කඩ' ලෙස හැඳින් වූ ලංකාරාම පුදබිම මෙම පින්කම් පෙළත් සමඟ පුනර්ජීවයක් ලබා ඇත. විශේෂයෙන් ඉංග්‍රීසි පාලන සමයේ මෙම පුදබිමේ චෛත්‍ය මළුවට සමීපව සකස් කර තිබූ මාර්ගය වෙනස් කරමින් අංග සම්පූර්ණ ව චෛත්‍ය මළුව ප්‍රතිසංස්කරණය කරන්නට හැකියාව ලැබුණි. එසේ ම ශත වර්ෂ ගණනාවක් ප්‍රදේශයේ ජනතාව භාවිත කළ මාර්ගය පුදබිමට බාධාවක් නොවන්නට ඉදිකිරීමට හැකි වීම ද සතුට ට කරුණකි.

ලංකාරාම චෛත්‍ය මළුව සුදු වැලි අතුරා ප්‍රතිසංස්කරණය කරන්නට කලක පටන් අප තුළ තිබූ උවමනාව ඉටු කරන්නට භූ විද්‍යා හා පතල් කාර්යංශයේ අප හිතවත් සජ්ජන ද සිල්වා මැතිතුමන් ප්‍රධාන පින්වත් පිරිස මුල්වීම අපට මහත් ශක්තියකි. මා පෙර සඳහන් කළ පරිදි මංපෙත් කර වීම, සෑ මළු ඉදිකිරීම මතු ආත්මවල දී නොමඳ ප්‍රඥාව ලැබීමට හේතු වන බලවත් කුසලයක් බව බුද්ධ දේශනාව යි.

මෙම ශාසනික මෙහෙවරට සමඟාමීව අතිපූජනීය පින්වත් බළන්ගොඩ රාධ ස්වාමීන් වහන්සේගේ වැඩම වීමෙන් පින්කම් පෙළහරක් සිදු කරන්නට ලැබීම ද අප සැම ලද භාග්‍යයකි. මෙම මාහැඟි පින්කම් සඳහා දායකත්වය දැක් වූ සියලු දෙනාටත් සදේවක ලෝකයාටත් පින්පෙත් අනුමෝදන් වේවා. අනන්ත බුදු ගුණ බලයෙන් දැවී තැලෙන සිත් සුවපත් වෙත්වා.!





සධාතුක කරඬුව තැන්පත් කිරීම, බුද්ධ මන්දිරය නිර්මාණය කිරීම, බුද්ධ ප්‍රතිමාව ඉදිකිරීම, අග්‍රශ්‍රාවක ප්‍රතිමා ඉදි කිරීම හා චෛත්‍ය මළුවේ සුදුවැලි ඇතිර වීම නිමිත්තෙන් පවත්වන සුමධුර ධර්ම දේශනාව හා කප්රුක් පූජාව සමඟ බෝධි පූජාව

අනුශාසකත්වය : අනුරාධපුර ලංකාරාමාධිකාරී උතුරු මධ්‍යම දෙදිසාවේ ප්‍රධාන අධිකරණ සංඝනායක

**පූජ්‍ය රළපනාවේ ධම්මජෝති ස්වාමීන් වහන්සේ.**

සජීවී විකාශය අමා දොර YouTube f LIVE

ඔබ සැමට මෙත් සිතින් ආරාධනා...

පිංකම අවසානයේ පවත්වනු ලබන රාත්‍රී ආහාර දන්සල සඳහා ද සහභාගී වන්නට සැමට ආරාධනා

# බුද්ධානුභාවයෙන් සෙත සැලසෙන බෝධි පූජාවක අරුත දැනගනිමු

**බෝ හෙවත් බෝධි යනුවෙන් අප හඳුන්වන්නේ අස්වත්ථ වෘක්ෂයයි. බෝධි යන්නෙහි අර්ථ හතරකි. එනම් සර්වඥතා ඥානය, ආර්ය මාර්ගය, පැනවිම සහ ඇසතු රුක යන තේරුම් ය.**

ඇසතු රුකට ආයු කාලය බොහෝ ය. ගෞතම බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වූයේ ඇසතු වෘක්ෂයක සෙවණේ ය. මෙනිසා බුද්ධානුස්මෘතිය උපදවා ගැනීමේ සජීවී සංකේතයක් හැටියට බෞද්ධයෝ සමස්ත ඇසතු රුක්ෂයන්ට ගරු බුහුමන් කරති.

බුදුන් වහන්සේගේ ත්‍රිවිධ චෛත්‍ය අතර බෝධිය පාරිභෝගික චෛත්‍ය අතරට වැටේ. ගෞතම බුදුන්ගේ බුද්ධත්වයට පෙර දීත් බෝධි වෘක්ෂය ඉන්දියාවේ ප්‍රභූන්ගේ පවා පූජාවන්ට ලක්ව තිබේ.

සුජාතා සිටු දියණිය කිරිපිඬු පූජාව සූදානම් කළේ සිදුහත් තාපසයන් බුදුවීමට පෙර දිනයේ ය. ඇය එම දානය සූදානම් කළේ බුදුරදුන් උදෙසා නොව එම වෘක්ෂයේ අධිගෘහිත දෙවියන් උදෙසා ය. බුදුරදුන් ද ඇසතු වෘක්ෂ ය ආශ්‍රය කරගෙන පහල වූ බැවින් ඉන්දීය සමාජයේ එම වෘක්ෂය වඩාත් වන්දනාමානයට පාත්‍ර විය. අශ්වත්ථ වෘක්ෂය විෂ්ණු ප්‍රතිමූර්තියකි. එමෙන්ම බෝධිය නමින් එය බුදුන්ගේ ප්‍රතිමූර්තිය බවට පත්විය. මෙම සංකල්ප දෙකම හින්දු හා බෞද්ධ සංකල්පවල සම්මිශ්‍රණයකි.

බෝධි කතා පුවතින් බුදුරදුන් ජීවමාන සමයේ දී ම ඇසතු රුක පූජනීය වස්තුවක් බවට පත්වූ බව කියැවේ. බුදුරදුන් පිදීමට දෙව්රම් වෙහෙරට සැදැහැවතුන් නිරතුරුව පැමිණෙන අතර, ඔවුහු බුදුරදුන් නොමැති විට පූජා ද්‍රව්‍ය ඉවතලා කණස්සළු සිතින් යන අයුරු අනේපිඬු සිටු තුමා ආනන්ද තෙරණුවන්ට සැළකර තිබේ. මේ සඳහා ප්‍රතිකර්මයක් ලෙස බුදුරදුන් නොමැති විට බුදුරදුන්ගේ සංකේතයක් නියම කරන ලෙස ආනන්ද හිමි බුදුහිමියන්ගෙන් විමසා සිටියේ ය. එවිට බුදුරදුන් දෙසා ඇත්තේ උන්වහන්සේ විසින් ප්‍රයෝජන ලැබූ බෝධිය තමන් වහන්සේ නොමැති වූ විට බුදුරජාණන් හා සමාන වන බවයි. එවිට ජය ශ්‍රී මහා බෝධියේ බීජයක් දෙව්රම් වෙහෙරේ රෝපණය කිරීමට ආනන්ද තෙරණුවෝ බුදුරජාණන් වහන්සේගෙන් අවසර ඉල්ලූහ. එහි දී බුදුරජාණන් වහන්සේ පිළිතුරු දුන්නේ එය රෝපණය කළ විට තථාගතයන් වහන්සේ දෙව්රම් වෙහෙරේ නිරතුරු වැඩවසන්නාක් මෙන් වන බවයි. ආනන්ද බෝධිය වූයේ එම බෝධියයි.

බෝධීන් වහන්සේට පූජා පැවැත්විය යුතු ආකාරය කාලිංග ජාතකයෙහි මෙලෙස සඳහන් ය.

සුවඳ පැනින් බෝධිය නෑවීම, මල් පහන් සුවඳ දුම් පිදීම, මල්දම් එල්ලීම, ධජ පතාකවලින් බෝධිය සැරසීම, පුන්කලස් තැබීම, ප්‍රාකාර දොරටු සහ වේදිකා ඉදිකිරීම, බෝ මළුවේ රන්වන් , රිදීවන් වැලි ඉසීම, තූර්ය වාදනය, ප්‍රදක්ෂිණා කිරීම හා සාධුකාරදීම සහ වන්දනය යන ආකාරයෙනි.

බෝධි පූජාව සංවිධානාත්මකව පවත්වන්නේ ද පළමුවෙන් ම බෝධිය නැහැවීමෙනි. ඇසතු වෘක්ෂය ඝර්ම කලාපීය වෘක්ෂයක් වන බැවින් එහි පැවැත්මට ජලය අවශ්‍ය ය. එසේ ගසේ පැවැත්මට අවශ්‍ය ජලය පිදීමෙන් ඊට උපකාර කර පිහිටක් ඉල්ලීම මෙහි හරයයි.

කල් යාමේ දී දේව පූජාවක දී කරනු ලබන සියලු වතාවත් බෝධි පූජාවේ චාරිත්‍රවලට ද එක්ව තිබේ. බෝධිය නැහැවීම පුරාණ සිංහල රජ දරුවන් විසින් ද ඉටුකළ චාරිත්‍රයකි.



ක්‍රිස්තු පූර්ව එක්වැනි සියවසේ රජ පැමිණි භාතිය රජතුමා එබඳු පූජාවක් පවත්වා ඇති බව ඉතිහාසයේ සඳහන් ය. එය බෝධි සිනාන පූජාව ලෙස හඳුන්වා ඇත. ඉන් පසු රජවරුන් ද බෝධිය නැහැවීමේ චාරිත්‍රය පවත්වා ඇත.


ප්‍රාග් බෞද්ධ යුගයේ ද පෞද්ගලික අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා ඇසතු, නුග වැනි වනස්පතී වෘක්ෂයන්ට පුද පූජා පැවැත්වීම චාරිත්‍රයක් විය. එසේ ජනයා හුරු පුරුදුවී සිටි පුද පූජා බෝධියට කළ හැකි වූයෙන් සාම්ප්‍රදායික වෘක්ෂ වන්දනා ක්‍රමය බෞද්ධයන් අතරින් ඈත්විය. එසේ වුවත් බෝධි වන්දනයෙන් අත්වන පිනෙන් ඔවුන්ගේ අභිමතාර්ථ සාර්ථක වන විශ්වාසය ඇත. අභිමතාර්ථ සාධනය වූ විට තවත් එවැනි පින්කම් කර කෘතවේදීත්වය පළ කිරීමටත් බෞද්ධයින් පෙළඹිණි. එයට මූල පාදක වී ඇත්තේ, ඉතිහාසයේ මුල්ම බෝධී පූජාව වූ බුදුන් වහන්සේගේ සත් සතියේ දී අනිමිස ලෝචන පූජාව පැවැත්වීම ය.

එම ආනුභාවයෙන් පුද්ගලයින්ගේ අපල උපද්‍රව දුරුකිරීම, ලෙඩදුක් නිවාරණය, වසංගත රෝග දුරුකිරීම, දෛනික ජීවිතයේ කටයුතු සාර්ථක කර ගැනීම, ආරක්ෂාව, සශ්‍රිකත්වය, දරු සම්පත් ප්‍රාර්ථනා කිරීම, විභාග සමත්වීම හා රැකී රක්ෂා තනතුරු ආදිය ලබා ගැනීම ආදී විවිධාකාර අරමුණු ඉටුකර ගැනීම සඳහා ජනතාව බෝධී පූජාවේ පිහිට පතයි.

ඊටත් අමතරව වැසි වස්සවා ගැනීම, විවාහ සහකරු හෝ සහකාරිය සොයා ගැනීම හා ගම්බිම්වල ආරක්ෂාව ආදී විශේෂිත කාර්යයන් සඵලවීමට ද බෝධී පූජා පවත්වනු ඇත.

අනුරාධපුර වැඩ හිඳින ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ මේ සියලු ප්‍රාර්ථනාවන් ඉටුකරන බව ලෝකයට ම පසක් වූ කරුණකි. දිනපතා එම පින්බිමට ඇදී එන දහස් සංඛ්‍යාත ජනකාය ම ඊට සාක්කි දරයි.


එලෙසම සෑම විහාරස්ථානයක ම අනිවාර්ය අංගයක් ලෙස වඩා ඉඳුවා ඇති බෝධීන් වහන්සේ ද මේ ආනුභාවය දරයි. මල්මාලා එල්ලීමෙන්, ප්‍රාර්ථනා වැකි ලියා හෝ නොලියා හෝ කොඩිවැල් හෝ ලෙස ධජ එල්ලීමෙන්, බෝ මළුව අමැදීමෙන්, මළුවට සුදුවැලි ඉසීමෙන්, පහන් දැල්වීමෙන්, පැන් වත්කිරීමෙන් , බෝධි වර්ණනා කවි කීමෙන්, පිරිත් කීමෙන් හා බෝධීන් වහන්සේට අධිගෘහිතව වැඩවසන දෙවි දේවාතවුන්ට පින්දීමෙන් බැතිමත්හු ඒ හැම බෝධියකින් ම සෙත් ශාන්ති ලබති.



බෝධි පූජාව සංවිධානය කරනු ලබන අරමුණ, කාල වේලාව, ස්ථානය, ප්‍රාදේශීය සම්ප්‍රදායන් හෝ ඒ ඒ ස්ථානවල ආවතේව විධි අනුව මෙම පූජාවන් පවත්වන ක්‍රම අතර වෙනස්කම් තිබිය හැකි ය. එහෙත් සමස්ත බෝධිපූජාවේ හරය මෙය ය.

බෝරුක අධික වශයෙන් ඔක්සිජන් නිපදවන ශාඛයක් බැවින් මාරාන්තික පිළිකා රෝග , දියවැඩියාව, ආදි ලෙඩ සුව කිරීමට බෝ සෙවණේ භාවනා කිරීම හොඳම පිළියමක් ලෙස බටහිර වෛද්‍යවරු ද විශ්වාස කරති. බුද්ධ ආනුභාවය සපිරි බෝධියට පූජා පැවැත්වීම බුදුරදුන් උදෙසා කරන පූජාවක් ලෙස ජනයා අදත් විශ්වාස කරන්නේ එනිසයි.

ඔබ සැමට බෝ සමිඳු පිහිටයි !



අනුරාධපුර ලංකාරාමාධිකාරී, උතුරුමැද පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක
**රැළපනාවේ ධම්මජෝති නාහිමි**

**සියලු දෙනාට ආචාර සම්පන්න වන්න. සියලු දෙනා ඔබට ආචාර සම්පන්න වනු ඇත**

# භාවනා කරනවා කියන්නේ සැමදේම අතහැර කටුක ජීවිතයක් ගෙවීම නොවෙයි



**මනො පුබ්බංගමා ධම්මා**
**මනො සෙට්ඨා මනොමයා**
**මනසා චෙ පසන්නේන**
**භාසති වා කරොති වා**
**තතො නං සුඛමන්වෙති**
**ඡායා ච අනපායිනි**

"මනස" සෑම ක්‍රියාවටකට ම පෙරටුව ගමන් කරයි. පූර්වාංගම වෙයි. යම් කෙනෙක් පහන් වූ සිතින් යමක් කරන්නේ ද, කියන්නේ ද සැප ය ඔහු පසුපස ම එයි. තමන් අත්හැර නොයන සෙවණැල්ල මෙනි.

බුදුරජාණන් වහන්සේ දේශිත ශ්‍රී සද්ධර්මයේ ප්‍රධාන පෙන්වාදීම යහපත් මනසක් පවත්වා ගැනීමයි. මනසේ ප්‍රසාද බව, පිරිසුදු බව ඇති කර ගැනීමට උපකාර වන කරුණු අතර දානය, සීලය ප්‍රධාන වේ. මනසේ ගැඹුරට ම පාරිශුද්ධ ස්වභාවය ඇති කර ගැනීමට නම් අප භාවනාව සඳහා යොමු විය යුතුයි.

දන්දීමෙන් සිතේ සංවර බව, සැහැල්ලු බව ඇති කරනවා. යම් දෙයක් ලෝභ සිතින් අල්ලාගෙන සිටිනවාට වඩා එය සතුටු සිතින් යම් කෙනකුට දන් දී සතුටු වන්නට හැකි නම් එය එක් පැත්තකින් අත්හැරීමක්. ඒ වගේ ම අත්හැරීමෙන් ලබන සතුටක් බවට ද පත්වෙනවා.

යමක් දන් දී ඒ දේ පිළිබඳ සිතා සතුටුවීම, එය අනුස්සතියක් හැටියට වැඩීම චාගානුස්සති භාවනාව ලෙසින් බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළා.

"අප සාමාන්‍ය යෙන් යම් දෙයක් දෙනවා. ඒත් දුන් ප්‍රමාණය ගැන මතකයක් නැහැ. දීම ගැන ලොකු කල්පනාවකුත් නැහැ. එහෙත් අපට පුළුවන් යම් කිසි කෙනකුට යමක් දීමට පෙරත්, හොඳින් සිතා බලා සතුටු වන්න. දන් දෙන අවස්ථාවේදීත් ඉතා සතුටින් දෙන්න. දීමෙන් පසුවත් සතුටට පත්වෙන්න. ඒ ගැන යළි යළිත් මෙනෙහි කරන්න. එය සතුටු සිතින් වඩන්න පුළුවන්. ඒ මෙනෙහි කිරීම භාවනාවක් අතරට ගන්නේ නම්, එය චාගානුස්සති භාවනාව නමින් හඳුන්වනවා.

භාවනාව යැයි කී පමණින් බොහෝ දෙනකුට තිබෙන්නේ මේ සෑම දේ ම අතහැර, වනගතව ගල්ලෙනක මහා කටුක ජීවිතයක් ගෙවනවා කියන ආකල්පයයි. නැහැ. අපිට එදිනෙදා ජීවිතයේ දී ත් මනසේ පාරිශුද්ධ භාවයක් ඇති කර ගන්න පුළුවන්. අප කරන ක්‍රියාව, කතා කරන වචනය පවා අප කෙරෙහි ඉතා බලවත්ව හිතෛෂීවන්තව පවතිනවා. යහපත් වචනයකින් හෝ ක්‍රියාවකින් වරදක් වන්නේ නැහැ. බෞද්ධයයන් වශයෙන් දන් දීම කියූ විට විවිධයි. එය අප සවසට බුදුරජාණන් වහන්සේට පූජා කරන මල් වට්ටිය, පහන් ආලෝකය, පෙරවරුවේ තබන බුද්ධ පූජාව විය හැකියි. මේ පූජාවන් පිළිබඳ පවා මනසේ ඇති කර ගත් සංයමයෙන් දානය පිළිබඳ, පූජාව පිළිබඳ මහත් වූ ප්‍රසාද සිතක් ඇති කරගෙන යළි යළිත් ඒ පිළිබඳ මෙනෙහි කරන්න. ඒ චාගය පිළිබඳ යළි යළිත් මනසිකාරය කරමින් සතුටු වෙන්න. සිත ඒකාග්‍ර කර ගන්න. එවිට අපිට චාගානුස්සති භාවනාව වැඩෙනවා. මනසේ සුවපත් භාවය ඇති වෙනවා. පීඩාකාරී මානසික බවෙන් ඈත්වෙනවා. එවිට නිරවුල් මනසින් එදිනෙදා වැඩ කටයුතුවල යෙදෙන්න පුළුවනි.

දිනක් මට යම් පුද්ගලයෙක් හමුවුණා. ඔහු



පේරාදෙණිය හිඳගල මහ කන්දේ ධම්මචේතිය ශ්‍රී සමාධි භාවනා පුහුණු මධ්‍යස්ථානයේ අනුශාසක සහ දීපව්‍යාප්ත ධම්මචේතිය භාවනා සංවිධානයේ අනුශාසක, ශ්‍රී ජයවර්ධනපුර සිළුමිණි විහාරාධිපති කම්මට්ඨානාචාර්ය
**මහමෙවුනාවේ මංගල හිමි**

> **භාවනාව යැයි කී පමණින් බොහෝ දෙනකුට තිබෙන්නේ මේ සෑම දේ ම අතහැර, වනගතව ගල්ලෙනක මහා කටුක ජීවිතයක් ගෙවනවා කියන ආකල්පයයි. නැහැ. අපිට එදිනෙදා ජීවිතයේ දී ත් මනසේ පාරිශුද්ධ භාවයක් ඇති කර ගන්න පුළුවන්. අප කරන ක්‍රියාව කතා කරන වචනය පවා අප කෙරෙහි ඉතා බලවත්ව හිතෛෂීවන්තව පවතිනවා. වචනයකින් හෝ ක්‍රියාවකින් වරදක් වන්නේ නැහැ**

බෞද්ධයෙක් නොවෙයි. බෞද්ධ පරිසරයක් නැති රටකයි ජීවත් වෙන්නේ. ඔහු තමන්ගේ ජීවිතයට සිදු වූ බොහොම කටුක අද්දැකීමක්, මෙනෙහි කරමින් ඉන්න පුරුදු වුණා. අපි වුවත් ප්‍රශ්නයක් ආවොත්, දිවා රෑ නොතකා ඒ පිළිබඳව ම කල්පනා කරනවා නේද? මට මෙහෙම සිද්ධ වුණා. මම මෙහෙම කටයුතු කළා යනුවෙන්.

මේ පුද්ගලයාට මුණ ගැසුණා හිතවතෙක්. ඔහුත් බෞද්ධයෙක් නොවෙයි. ඔහු තම හිතවතාට සිතේ පීඩාකාරී බව දුරු කර ගන්න, සිත නිදහස් කර ගන්න ක්‍රමයක් කියා දෙනවා. ඒ පාන්දරම කුරුල්ලන්ට කෑම ටිකක් දීල, කුරුල්ලන් ඒ කෑම කන දෙස බලන් ඉන්න කියා.

කුරුල්ලන්ට කෑම දෙන්න සුදුසු තැනක් සුදුසු ලෙසින් භාජනයක් සකස් කරගෙන උදේ ම කෑම ටිකක් තබා විනාඩි පහක් දහයක් විතර කුරුල්ලන්ගේ හැසිරීම බලා සිටියා. කුරුලු මව්පියන් දරුවන් සමඟ, කෑමට එනවා. විවිධ පක්ෂීන් එනවා. ඔහුට ම සිතා වතුර ටිකකුත් කුරුල්ලන්ට බීමට තබනවා. මේ කුරුල්ලන්ගේ හැසිරීම බලා සිටීමත් සමඟ ඔහුගේ මනසේ තිබූ ගැටලුකාරී බව, පීඩනය පහව ගියා. මනස නිදහස් වුණා. නිරවුල් බවට පත්වුණා. ඔහු මට කියනවා

"හාමුදුරුවනේ, මනසේ නිරවුල් බව හේතුවෙන් මගේ රැකියාව පවා හොඳින් කර ගැනීමට පුළුවන් වුණා. ඒ හේතුවෙන් මට රැකියාවේ ඉහළ තනතුරකුත්, වගකීමකුත් ලැබුණා. " කියා.

ඕනෑම කෙනකුට පීඩාකාරී ස්වභාවයක් ඇතිවීම ස්වභාවිකයි. සමහර විට අසල්වැසියන් නිසා, අපේ මනස පීඩාකාරී බවට පත්වෙනවා. සමහර කාර්යාල කටුතුවල දී තමන්ට අප්‍රසන්න අය නිසා, කටයුතුවල පීඩාකාරී බවක් ඇතිවෙනවා. ඒ වගේ ම ගේ - දොර ගත්විට, දරුවෝ හිතුවක්කාරයි. ස්වාමියා බිරිඳට අවනත නැහැ. බිරිඳ - ස්වාමියාට අවනත නැහැ. ඥතීන්ගෙන් ඇතිවන කරදර හේතුවෙන් තමන්ගේ මනසට දැඩි පීඩාකාරී තත්වයක් ඇතිවිය හැකියි. මේ ලෝකයේ සිදුවන දේ අපට නවත්වන්න බැහැ. ඒ වගේ ම අසල්වැසියන් හෝ සමාජයේ අන්‍යයන් හදන්නත් බැහැ. සංසාරගත අකුසල කර්මයකට හෝ දරුවෝ නොමඟ යනවා නම් ඒ අය හදන්නත් බැහැ. බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළේ පළමුව තමන්ගේ මානසික සුවපත් භාවය මෙන් ම මානසික ශක්තිය, මානසික උතුම්භාවය ඇති කර ගන්නා ලෙසයි. ඒ ආකාරයෙන් අපේ මනස සකස් වූ විට ජීවිතයට එන සෑම ප්‍රශ්නයකට ම නිරවුල් මනසින් මුහුණ දිය හැකිවේවි. ඒ නිසා සෑම කෙනකු ම තමන්ට හැකි පමණ භාවනාවක් පුරුදු පුහුණු කර ගන්න.

අර පුද්ගලයා කුරුල්ලන්ට කෑම දීල සතුටුවෙන්න, මනස නිරවුල් කර ගන්න ඉගෙන ගත්තෙ බෞද්ධයකු නොවන අන්‍යාගමික පුද්ගලයකුගෙන්. එහෙත් නොදැනීම ඔහු තුළ වැඩුණේ කුමක් ද? චාගය නමැති චාගානුස්සති භාවනාවයි. එසේ නම් නිරන්තරයෙන් දන් දෙන අපි ඒ දානය දීම පිළිබඳ නිතර, නිතර මෙනෙහි කරනවා නම්, නිතර නිතර සතුටු වෙනවා නම්, කතා කරනවා නම් අපේ මනසේ චාගානුස්සති භාවනාවෙන් ඇතිවෙන සංසිඳීම ඇතිවීම ආරම්භ වෙනවා. පීඩාකාරී මනස බැහැරව නිරවුල් මනසක් ඇතිවෙනවා. මෙම භාවනාව ගැඹුරට වැඩිය හැකි භාවනාවක්.

අපි මෙසේ සිතමු. බෞද්ධ අපේ නිවෙස්වල සාමාන්‍යයෙන් උදේ, සවස බුදුන් වැඳ පන්සිල් සමාදන් වෙනවා. පන්සිල් සමාදන් වූ ව ද, සමාදන් වූ සීලය කොපමණ දුරට ආරක්ෂා කරනවා ද? කියන කාරණය පිළිබඳ ගැටලුවක් පවතිනවා.

***මෙම ලිපියේ ඉතිරි කොටස මැදින් අව අටවක පෝද (15) අන්තර්ජාල කළාපයේ පළවේ.***

**දීපා පෙරේරා**

**අනුවණයාට තමා අනුවණ යැයි හැඟේ නම් එකරුණින් පවා ඔහු පණ්ඩිතයෙක් වේ**

# පාපය අළු යට සැඟවුණු ගිනි පුපුරක් වගෙයි

# සැඟවී සිට විපාක දෙනවා



**බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි පින යනු සැපයම වන්නේ ය. මේ ජීවිතයේ කවුරුන් හෝ සැප විඳිනවා යනු ඒ පෙර කරන ලද පිනෙහි ඵලයන් ම ය. පෙර පින් කළ අය මේ ජීවිතයේ කුමන තරාතිරමක උපත ලබා සිටිය ද සැපය උදකරමින් පින සෙවණැල්ල සේ ඔහු පසුපස හඹා එනවා. ඒ සැපයට තව කෙනෙක් ඊර්ෂ්‍යා කිරීමෙන් එය වළකන්නට බැරි වන්නා සේ ම තමා සතුකර ගන්නට ද නොහැකියි.**

ඒ පිළිබඳ කඩවත මාවරමණ්ඩිය සිරි ගෞතම විහාරයේ ප්‍රධාන අනුශාසක, හිටපු විශ්වවිද්‍යාල කථිකාචාර්ය, ශාස්ත්‍රපති පොල්පිටිමූකලානේ පඤ්ඤසිරි හිමියන් පළ කළ අදහස් ය.

### ස්වාමීන් වහන්ස, ඉපදෙමින් මැරෙමින් යන සසර ගමනක් උරුම වූ සත්වයාගේ සැප දුක තීරණය වන්නේ කෙසේ ද?

අපේ ජීවිත දවසින් දවස ගෙවෙමින් යනවා. මොහොතින් මොහොත වියැකෙමින් යනවා කාලය වේගයෙන් දිව යනවා. ආයුෂයට නැවතුමක් නම් නැහැ. අපේ ජීවිත මේ රැල්ලට හසු වී ගසාගෙන යනවා. ළදරු විය, තරුණ විය කරා යනවා. තාරුණ්‍යය මහලු විය කරා යනවා. මහලු විය මරණය කරා යනවා. ලොව පහළ වූ බුදුරජාණන් වහන්සේලාගේ පටන් සියලු සත්වයින්ගේ ඉරණම මෙයයි. මෙවන් ඉරණමක් ළඟ හඬා දොඩා පසුතැවෙන්නට සිදු නොවන ජීවිතයක් සාදාගත් අය සැබෑම පින්වතුන්. ඒ නිසා නොපමාව පින් රැස්කර ගත යුතු වෙනවා.

අපට මේ සඳහා බොහෝ කල් තියෙනවද? නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙන්නේ හුස්ම පොදක් ඉහළට අරගෙන පහළට ගෙන ආපසු ඉහළට ගන්න කලින් අපි මැරෙන්න පුළුවන් කියලා. ඒ නිසා නොපමාව පින් කරගන්න කිව්වා. ලෝවැඩ සඟරාව දෙස බැලීමේදී මේ බව හොඳින් වටහා ගන්නට පුළුවන්. එදා බුදුරජාණන් වහන්සේ ගද්‍යයෙන් වදාළ දේ වීදාගම මහා මෛත්‍රය හිමියන් ලෝවැඩ සඟරාවේ මෙසේ පද්‍යයෙන් ප්‍රකාශ කර තිබෙනවා.

**අද අද එයි මරු පින් කර ගන්නේ**
**කෙලෙස ද හෙට මරු නේති සිතන්නේ**
**කිකල ද මහසෙන් මරු ඇප වන්නේ**
**කුමට ද කුසලට කම්මැලි වන්නේ**

අද අදම මාරයා පැමිණෙතැයි සිතා පින් කළ යුතු ය. හෙට මරු නොඑන්නේ දැයි කෙලෙස සිතන්නද? මහා සේනාවක් ඇති මාරයාට කවර නම් කාලය ඇප වෙන්නද? එබැවින් කුසල් කිරීමට කුමක් හෙයින් කම්මැලි වන්නේ ද?

### මිනිසත් බව ලැබීමත් පිනක් නේ ද?

මේ වන විට ලෝක ජනගහනය බිලියන අටක් පමණ වන බව කියන්නට දත්ත තිබෙනවා. නමුත් අපා, දෙපා, සිවුපා , බහුපා සතුන් කොපමණ ජීවත් වනවාද යන්න කෙසේවත් ගණනකින් දක්වන්නට බැහැ.

ඔබේ නිවස පිහිටා ඇති පර්චස් කිහිපයක ප්‍රමාණයකින් යුතු ඉඩමේ සතුන් කොපමණ ජීවත් වෙනවාද? එය ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් වන්නට පුළුවන්. උපතින් සත්වයාට ඒ සා සුවිසල් උප්පත්ති ස්ථාන සංඛ්‍යාවක් තිබියදී අප මිනිස් ලොව උපදින්නේ ඇයි? පින නිසා

එපමණක් නොවෙයි, නිරයේ ද අසුර අපායේ ද, ප්‍රේත ලෝකයේ ද ගණනින් කිව නොහැකි තරම් ප්‍රාණීන් ඉපිද සිටින බව බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙනවා. ඒ ඕනෑම තැනක ඉපදීමට අපට ද අවස්ථාව තිබියදී අප මේ මිනිස් ලොව උපදින්නේ ඇයි? පින නිසා

මේ ස්ථාන අප විසින් හෝ අපගේ මව්පියන් විසින් හෝ තෝරාගත්තේ නැහැ. කොහේ කොතැන හිඳ කොහොම මරණයට පත්වූවා දැයි නොදන්නා අප මරණින් මතු මව්කුස පිළිසිඳගෙන තිබෙනවා. මව්කුසක් තිබෙන්නේ මිනිස් ලොව මව්වරුන්ට පමණද? නැහැ. දහස් ගණනින් බොහෝ වූ මව් කුසවල් සෙසු ලෝකවල තිබියදී අප මිනිස් මව්කුසක් කරාම පැමිණියේ ඇයි? පින නිසා

අප උපන් මේ බිම ලොව පුණ්‍යවන්තම භූමියක්. ඇත්තෙන්ම අප හුදෙක් මිනිස් ලොව උපත ලැබීමට සීමා නොවී බුදුරජාණන් වහන්සේගේ සරණ යන්නටත් අවස්ථාව ලැබිලා. තථාගත ශ්‍රී සද්ධර්මය සරණ යන්නට අවස්ථාව ලැබිලා. පින් දහම් කර ගන්නට අවස්ථාව ලැබිලා. ඒ පින පොඩි පිනක් නම් නොවෙයි. අතිශය වටිනා පුණ්‍ය විපාකයක්.

### ජීවත්ව ඉන්නා කාලයේ කාල බීල සතුටින් හිටියාම ඇති. පින්කරන්න අවශ්‍ය නෑ කියලත් ඇතැම් අය කියනවා

අපේ සංසාරික පින බොහෝ සෙයින් ගෙවී ගිහින්." යන්න නිතර සිහි කරන්නට ඕනෑ.

අපේ පින ගෙවී ගියා යන්නෙන් නොනැවතී, පිනෙන් බලවත් ව, වැඩි යා හැකි පරිදි මේ බුද්ධ ශාසනය තුළ පින් රැස් කිරීමට අපත් බුද්ධිමත් වන්නට ඕනෑ. දක්ෂ වෙන්නට ඕනෑ. එසේ නොවුණොත් මේ පින ගෙවී අවසන් වෙද්දී අප වැටෙන්නේත් බොහොම දුක්ඛිත ඉරණමකටයි.

මහත් වූ පුණ්‍ය සම්භාරයක් විය පැහැදම් කර සම්බුද්ධ ශාසනයක ලද මේ මිනිස් ජීවිතය තුළ පින නහගන්න කෙනෙක් නම් වෙන්න එපා. ඉන්න ටිකේ කාලා බීලා සතුටින් හිටියාම ඇති. අමුතුවෙන් පින් කරන්න දෙයක් නෑ." කිය කියා පිනට ගරහන්න එපා. වියදම් කරන්න දෙයක් අලුතින් නූපදවා ගත්තොත් ව්‍යාපාරයක් වුණත් බංකොලොත් වෙනවා.

බුදුරදුන්ට එරෙහිව ගිය දේවදත්ත අද ඉන්නේ නිරයේ. තමන් කරන ලද අකුසල කර්මය අළුයට සැඟවුණු ගිනි පුපුරක් වගේ සැඟවිලා ඉඳලා විපාක දෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළා. පුංචිම පිනක් වුණත් පින් රැස් වෙනවා ය යන ධර්මතාව විශ්වාස කරමින් පින් රැස් කරන්නට අපි පුරුදු වෙන්නට ඕනෑ. වැස්ස වෙලාවක කළගෙඩියක කට ඇරල තිබ්බට පස්සේ බිංදුව බිංදුව වැටිල කළගෙඩිය පිරිල ඉතිරිල යනව වගේ උත්සාහවත් පුද්ගලයා ටිකෙන් ටික පිනෙන් ඉතිරිලා යනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළා.

### ධර්මයෙහි පින අර්ථ ගන්වන්නේ කෙසේ ද?

මහණෙනි පිනට බිය වන්නට එපා. පින යනු සැපයට කියන තවත් නමකි. ඉෂ්ඨ වූ, කාන්ත වූ, මනාප වූ ප්‍රිය වූ, දෙයට කියන තවත් නමකි.

බුදුරජාණන් වහන්සේ යහපත සැපත සලසන පින් රැස් කර ගැනීමට ශ්‍රාවකයන්ව නිරන්තරයෙන් ම උනන්දු කර වදාළා.

යම්කිසි පුද්ගලයෙක් ශ්‍රද්ධාවෙන් යුක්තව සිත, කය, වචනය යන තිදොරින් පින් කළොත්, නැවත නැවතත් කර ගන්න ඕනෑ වෙන්නේ ඒ පිනමයි. පින් කිරීම ගැනමයි හිතේ කැමැත්ත ඇති කර ගන්න ඕනෑ. සැප කියා කියන්නේ පිනටමයි.

### වත්මන් සමාජයේ මිත්‍යා දෘෂ්ටික මතවාදයක් පැතිර යනවා" පින් කරන්න හොඳ නැහැ. පින් කිරීමෙන් සසර දිගු වෙනවා, පිනට කැමැති වීමත් තණ්හාවක් නේද? ආදී වශයෙන්

මෙවැනි මිත්‍යා දෘෂ්ඨික ප්‍රකාශ කරන පුද්ගලයන් ආහාර අනුභව කරන්නේ නැද්ද? ඇඳුම් අඳින්නේ නැද්ද? එහෙම නම් ආහාරයටත් තණ්හාවක් තියෙනවානේ. ඇඳුම් අඳින්නත් තණ්හාවක් තියෙනවානේ. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ දුක් ඇතිවීමට හේතුව තමයි තණ්හාව.

මොකක්ද ඒ තණ්හාව. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වශයෙන් ත්‍රිවිධ වූ මේ තණ්හාවට දුක්ඛ සමුදය ආර්ය සත්‍ය යැයි කියනවා. මෙහි තණ්හාව දුක ඉපදීමේ සැබෑ හේතුව ම බව දේශනා කර තිබෙනවා.

මෙවැනි මිත්‍යා දෘෂ්ටික මතයන්ගෙන් සැපය වනසා ගන්නවුන්ගේ අවාසනාවට වාසනාව දෙන්නට බැහැ. පව්කාර දිවියක්ම උරුම කර පැමිණි අය එයින් ම වැනසී යාම පව් විපාක දීමේ ස්වභාවයයි.

### ස්වාමීන් වහන්ස, අපේ රටේ උදේ සිට රෑ වන තුරු විද්‍යුත් මාධ්‍ය ඔස්සේ, ධර්මය රැව් පිළිරැව් දුන්නත් අසන්නට ලැබෙන්නේ හද කම්පා කරවන සිදුවීම්. ඇයි එහෙම වෙන්නේ ?

උදේ පාන්දර ඉඳන්ම ගමක් ගානේ, පන්සලක් ගානේ මෙන්ම ටීවී, රේඩියෝ මාධ්‍ය ඔස්සේ ද ධර්මය රැව් පිළිරැව් දුන්න ද ඒවායින් ඵල ලැබගන්නේ සුළු පිරිසක්. බහුතරයකට ධර්මය ඇසෙන විට කන් අගුළු වැටෙනවා.

ඉපදීම, ලෙඩවීම, ජරාවට පත්වීම, මරණය යනු දුකක් ලෙස දකින්නට සිත් සංවේදී නොවන තාක් මිනිසුන් සිටින්නේ ධර්මයට බොහෝ ඈතින්. අද බොහෝ දෙනෙක් කාර්යබහුලයි. වැඩ රාජකාරි වගකීම්වලින් හෙම්බත්වෙලා. විවේකයක් ඇත්තේම නැහැ. ඔවුන් හති වැටෙනා තුරුම, හැට පනින තුරුම කාර්ය බහුලයි. ඉඳගන්නා හිටගන්නවත් වාරුවක් නැතිදාට පින්කම් කරන්නට මතක් වෙනවා. හනි හනිකට පින්කම් ගොඩක් කරගන්නට පෙර නොතිබුණු හදිස්සිය තිබුණාට එදාට ප්‍රමාදයම පසුතැවීමට හේතුවෙනවා.

දානය නම් වූ අත්හැරීමෙන් ලබන පිනට වඩා සීලය ආරක්ෂා කිරීමෙන් රැස්වන පින මහත් ඵල යි. සිල් ආරක්ෂා කිරීමෙන් රැස් වන පිනට වඩා භාවනා කිරීමෙන් රැස්වන පින මහත්ඵල මහානිශංස යි. මේ උතුම් ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන් තුළින් ජීවිතයට පින් රැස් කර ගනිමින්, කුසල් වඩමින් උතුම් නිවන් සැප ලබා ගැනීමට උත්සාහවන්ත වෙමු.

අයන්ති විතාන

# යටිවාවල ශ්‍රී රාජසිංහාරාම පුරාණ විහාරය



මහනුවර බෞද්ධයන්ගේ මුදුන්මල්කඩ වන ශ්‍රී දළදා වහන්සේ විරාජමාන වන දළදා මාළිගය පිහිටි ඓතිහාසික පුරවරය වන අතර, ඒ අවට ගම්නියම්ගම් පුරා ඉතිහාසගත වටිනාකම් සහිත බෞද්ධ වෙහෙර විහාර රාශියක් පිහිටා ඇත.

ඒ අතරින් හාරිස්පත්තුව ප්‍රදේශයේ ස්ථාපිත වී ඇති පුරාණ වෙහෙර විහාර අතර, කටුගස්තොට යටිවාවල ශ්‍රී රාජසිංහාරාම පුරාණ විහාරය පිහිටි බිමේ ඇති බෝධීන් වහන්සේ ක්‍රි.ව. 1600 පමණ ඈත ඉතිහාසයක් ඇති බව ඓතිහාසික මූලාශ්‍ර පෙන්වා දෙයි. රාජසිංහ රජ සමය යුගයේ ස්ථාපිත බෞද්ධ විහාරස්ථානයක් ලෙස රාජසිංහාරාමය හඳුන්වා දිය හැකිය.

උඩුගොඩ ශීලානන්ද සහ වළල විමලරත්න නාහිමිවරු මෑත ඉතිහාසයේ යටිවාවල රාජසිංහාරාමයේ විහාරාධිපතිත්වය දරා ඇති අතර, වළල විමලරතන නාහිමියන්ගෙන් පසුව විහාර අධිපතිත්වයට පත් වූයේ පූලියද්දේ ඥානාලෝක වත්මන් නාහිමියන් වහන්සේ ය.



පූලියද්දේ ඥානාලෝක නාහිමි

මෙම විහාරස්ථානයේ වර්තමාන සංවර්ධනයේ පෙරගමන්කරුවා වන්නේ උන්වහන්සේ ය.

මනරම් බුදු මැදුරක්, දාගැබක්, ධර්ම ශාලාවක්, සංඝාවාසයක්, බෝධි ප්‍රාකාරයක් සහිතව සංවර්ධනය වී ඇති රාජසිංහාරාමයේ ඇතුළුවන දොරටුව අලංකාර මකර තොරණකින් සමන්විත ය.

කන්ද උඩරට පැරැණි වෙද පරපුරක් වන පූලියද්දේ පරපුරේ සාමාජිකයකු වන වත්මන් නාහිමිගේ මඟ පෙන්වීම යටතේ ඉපැරැණි ආයුර්වේද පොත්පත්, වෙදකමට පරිශීලනය කළ පැරැණි උපකරණ සහිත පුස්තකාල කෞතුකාගාරයක් ද මෙහි අභිනවයෙන් ස්ථාපනය කර ඇත.

**ගාමිණී චන්ද්‍රසේන**

බුද්ධ ප්‍රතිමා/ දේව ප්‍රතිමා/ චිත්‍ර, මූර්ති/ දිය ඇලි, පොකුණු/ උද්‍යාන අලංකරණය ඇතුළු සියලු කලා නිර්මාණ කටයුතු
අමතන්න
T.P. චන්දන ශාන්ත
(කලාභූෂණ, කලාකීර්ති, කලාමාන්‍ය, දේශබන්දු)
077-5888992

අප රජයේ ලියාපදිංචි වැඩිහිටි නිවාසයට රෝගී, නිරෝගී දෙමාපියන් බඳවා ගැනේ.
බාහිර කරදරවලින් තොර පාලිකාවක්ද අවශ්‍යයි.
0778703064, 0718827089

මම ගුරුවරයෙක්මි වැඩිහිටි නිවාසයක් නිර්මාණය කිරීමට සහය වීමට කැමති හා මාගේ මව බලා ගැනීමට කැමති අයෙක් විමසන්න.
වේතනයක් දෙනු ලැබේ.
076-8468303

පැවිදි කිරීමට කුල දරුවෙක් අවශ්‍යයි
036-3364903

නිවසේ නැවතී වැඩිහිටි කාන්තාවක් බලාගැනීමට කාන්තාවක් සොයයි.
0112792201
0771972278

උපස්ථායකයෙකු සහ පැවිදි වීමට අය අවශ්‍යයි.
ගාල්ල දිස්ත්‍රික්කයේ විවේකී ආරණ්‍ය සෙනසුනකට 60 ට අඩු.
077-0244515

තෙරුවන් සරණයි!
මෙහෙණි ආරාමයක පැවැදිවීමට කැමති අවුරුදු 5ත් 60ත් අතර පිංවතියන් අමතන්න.
070-5543344/ 077 - 2539612
පූජනී ධම්සරණීන් මෙහෙණින් වහන්සේ

සැමදා නොමිලේ
ඝාතනය කර ලබාගත් මස්මාංශ, කරවල, බිත්තර කෑමේ මහා පාප කර්මයෙන් අතමිදී නිර්මාංශිකයෙකුවීමේ මහා සූපින්බර සීල ගුණයට ඔබත් අවතීර්ණව දෙලොව සැනසිල්ල උදාකර ගන්න. නිවන්මගට පිවිසෙන්න.
සිරිලක මහා අවිහිංසා දහම් පදනම, ශ්‍රී ගුණරතනාරාම මහා විහාරය, අම්තිරිගල.
071-7679254

රත්නපුර
උපසපන් භික්ෂූන් වහන්සේ නමකට ගුරුන් වහන්සේ කෙනෙක් යටතේ ස්වාධීනව වැඩ කළ හැකි විහාරස්ථානයක් සොයමි.
077 - 0181353, 071 - 4211236

රජයේ සේවයේ විශ්‍රාමික නිදහස් උපාසකයෙකුට භාවනා කුටියකට සුදුසු කුඩාම නිවසක් මිලදී ගැනීමට.
072-8477540

මෙවර කඨින මහා පිංකම සඳහා අප දුෂ්කර විහාරස්ථානයට අනුග්‍රාහක පිංවතුන් අවශ්‍යයි.
0778325775

ගම්පහ
අස්ගිරිවල්පොල මෙහෙණින් වහන්සේ නමකට කුටියක් තනාගැනීමට ඉඩමක් හෝ උදව් උපකාර අවශ්‍යයි.
071-1570207

ස්වාමින් වහන්සේ නමකට වැඩ සිටීමට ස්වාමින් වහන්සේ නමක් නොමැති විහාරස්ථානයක් සොයයි.
076-8468303

රත්නපුර/කුරුවිට/කළුතර හිමි නමක් සඳහා
ඉඩම් කැබැල්ලක් හෝ පැරණි නිවසක් ලබා දිය හැකි ධානපතියෙක් අමතන්න.
071 - 8466872
071 - 2761474

වෛද්‍ය වෘත්තිකයකුට වැඩිදුර අධ්‍යාපනය සඳහා උපකාර කළ හැකි මහත්මයකුගේ, මහත්මියකගේ උදව් උපකාර අවශ්‍යයි.
0771893001

වකුගඩුවක් අවශ්‍යයි
O නෙගටිව් වර්ගයේ වකුගඩුවක් ඉතා ඉක්මණින් අවශ්‍යකර තිබේ.
අමතන්න : තිලක්
0760848641

ස්ථිර ගුරුවරු බඳවා ගැනීම
තිකවැරටිය මහ පිරිවෙනක් සඳහා පාලි/ සංස්කෘත/ ත්‍රිපිටක ධර්මය දේශපාලන විද්‍යාව සමගිත් වෛකල්පිත භූගෝල විද්‍යාව/ සමාජ විද්‍යාව/ඉතිහාසය / ගිහි පැවිදි ගුරුවරුන් ඉක්මන් බඳවා ගැනීමට
071 - 6432057, 077 - 6112512
077 - 2623753

පිණ්ඩපාතය පවා හිඟ බැවින් දන් පැන් සැපයීමට හැකි පිංවතුන් අමතන්න.
0778325775

කවිබණ, ධර්ම දේශනා විරිඳු, පිරිත්
අඩුම මිලට Recordings කරනු ලැබේ.
ස්වර්ණ මධුරාගී :
077-3253010

සබරගමුව පළාතේ, ආරණ්‍යයකට බාහිර ප්‍රශ්නවලින් තොර, පිංතකා වැඩ කිරීමට කැමති, උපස්ථායක මහත්මයකු අවශ්‍යයි.
ජයසිංහ - 071-6508227

උපාධිධාරී ගුරු ස්වාමීන් වහන්සේ නමකට වැඩවාසය කිරීම සඳහා
විහාරස්ථානයක්, ආවාසයක්, ස්ථානයක් සොයනු ලැබේ.
විමසීම් :
0773247396, 0712815759
0763497206

මාතලේ උකුවෙල දොඹගොඩ විහාරස්ථානයක ස්වාමින් වහන්සේ නමකට උපස්ථාන කළ හැකි කෙනෙක් සොයයි.
077-5495865

නොමිලේ
බුද්ධ ශාසනයට අනුපමේය සේවයක් කළ අපවත්වී වදාළ අතිපූජනීය නාඋයනේ අරියධම්ම මහා ස්වාමින්වහන්සේ දේශනා කළ පටිච්ච සමුප්පාද ධර්මග්‍රන්ථය ලබා ගැනීමට ඔබගේ නම ලිපිනය පැහැදිලිව පහත සඳහන් ලිපිනයට ලැබීමට සලස්වන්න.
සුමනදාස සෙන්දනායක
17/14, ගාමිණී මාවත, මතුගම.

සැඳෑ සමය දැහැමින් ගෙවන්න
වැඩිහිටි මාපියන්ට නේවාසික පහසුකම්
0712550599
0342296400

"බුද්ධ දේශය දැකීම - බුදුන් දුටුවා වැනිය"

1994 සිට 2020 වසරේ කොරෝනා උවදුර දක්වා දඹදිව වන්දනා චාරිකා 142 ක් ඉතා සාර්ථකව සංවිධානය කර බැතිමතුනගේ ප්‍රසාදය දිනා ගෞරව සම්මාන අටකින් පිදුම් ලත් විජයසිංහ වත්තේවැව මහතා මෙහෙයවන 2023 වසරේ ඉදිරි චාරිකා සඳහා සහභාගිවී දානමාන, ශීල, බණ, භාවනා, බෝධි පූජා සහ ආලෝක පූජා ආදී පුණ්‍ය වතාවත් රිසිසේ සහ තිසිසේ ඉටුකර නිවන් අවබෝධ කර ගන්න.

"දැක පුදා දඹදිව - මෙනෙහි කර අප බුදුරුව
ලැබ කුසල් නොඅඩු ව - අරිමු නිවනෙහි රුවන් දොරටුව"

ඉදිරි චාරිකා : අංක 143, සැප්. 08 සහ අංක - 144 ඔක්. 20 ආරම්භ කෙරේ.



ශ්‍රී ලංකා භාරත සංචාරකයෝ,
තෙල්වත්ත හන්දිය, මීගමුව සහ
53/ඒ, ගොඩගේ මාවත, අනුරාධපුර.
ටෙලි : 0777876241 / 0703829009 / 0252222392



පානදුරේ විජිතනන්ද හිමි

# පාණදුර වලාන ශ්‍රී විජය සෞගත විද්‍යාලය මහ පිරිවෙන සියවසක අභිමානය සනිටුහන් කළ වගයි

**පාණදුර වලාන ශ්‍රී විජය සෞගත විද්‍යාලය මහ පිරිවෙන ආරම්භ කර මෙම 08 දිනට වසර සියයක් සැපිරේ.**

19 වැනි සියවසේ මුල් භාගය වන විට අතිශයින් ම පරිහානිකර තත්ත්වයක පැවති ගිහි බෞද්ධ අධ්‍යාපනය සහ ආරාමික භික්ෂු අධ්‍යාපනය නඟා සිටුවීමට දරන ලද උත්කෘෂ්ට ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස වලාන ශ්‍රී විජය සෞගත විද්‍යාලය හඳුන්වාදිය හැකි ය.

ආදි කාර්තෘ වලානේ ශ්‍රී විජයානන්ද අධිකරණ නායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් 1923 මාර්තු 08 දින වලාන සරණපාලාරාම මහා විහාරය කේන්ද්‍ර කොට ගෙන ශ්‍රී විජය සෞගත විද්‍යාලය නමින් මෙම ආයතනය ආරම්භ කරන ලදී.

එවකට පාණදුර ප්‍රදේශයේ වැඩ සිටි යතිවරුන් අතර බහුශ්‍රැත පණ්ඩිවරයකු වූ උන්වහන්සේ භාෂා ශාස්ත්‍ර මෙන් ම ත්‍රිපිටක ධර්මය පිළිබඳව ද ප්‍රාමාණික දැනුමකින් හෙබිව විශාල ගිහි පැවිදි ශිෂ්‍ය පිරිසකට උන්වහන්සේ සතු එම දැනුම් සම්භාරය නිස්සරණාධ්‍යාශයෙන් ඉගැන්වීම් කළහ.

සිල් ගුණ සපිරි කරුණා ගුණෝපේත මහ තෙර නමක ලෙස ස්ථිර අධිෂ්ඨානයෙන් ක්‍රියා කළ විජයනන්ද නා හිමියන්ගේ බුද්ධි ප්‍රභාව පැතිර යාමෙන් ශ්‍රී විජය සෞගත විද්‍යාලය කරා දිවයිනේ විවිධ පළාත්වලින් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ විශාල පිරිසක් පැමිණෙන්නට වූහ. මේ හේතුවෙන් ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය පිණිස වෙන් වූ ආයතනයක් ගොඩනැංවීමේ අවශ්‍යතාව පැන නැඟුණි.

අඩු පහසුකම් හා විවිධ දුෂ්කරතා මධ්‍යයේ ක්‍රියාත්මක වූ ශ්‍රී විජය සෞගත පිරිවෙන අනාගත ශාසනික මෙහෙවරට තෝතැන්නක් වන බව දුර දක්නා නුවණින් දුටු එවකට වලාන ෆාම් ග්‍රෝව්හි පදිංචිව සිටි සී.පී. ද ෆොන්සේකා දොස්තර මැතිනිය විසින් වෙනම භූමි භාගයක් නා හිමියන් වෙත පූජා කරන ලදී. එම භූමි භාගයේ අලංකාර ගොඩනැඟිල්ලක් සාදවා පිරිවෙන් ආයතනය එහි ස්ථානගත කිරීමට දායකත්වය ලබා දී ඇත්තේ ප්‍රසිද්ධ වෙළඳ ව්‍යාපාරික ඇම්.සී. ප්‍රනාන්දු මැතිතුමා විසිනි.

1957 වර්ෂයේ දී විජයනන්ද නා හිමියන් අපවත් වීමෙන් අනතුරුව විජය සෞගත විද්‍යාලයේ ආධිපත්‍යයට පත් වූ මාදුපිටියේ ශ්‍රී මේධානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ලක්දිව ගිහි පැවිදි කා අතරත් ප්‍රකටව වැඩ සිටි චිර ප්‍රසිද්ධ ධර්ම දේශකයාණන් වහන්සේ නමකි. දුහී පැලේ සිට රජ මැදුර දක්වා බණ කියූ උන්වහන්සේ හැට, හැත්තෑව දසකවල වඩාත් ප්‍රසිද්ධ ගුවන්විදුලි ධර්ම දේශකයාණන් වහන්සේ වූහ. ව්‍යක්ත, විශාරද හා බහුශ්‍රැත පණ්ඩිවරයකු වූ උන්වහන්සේ සිංහල, පාලි, සංස්කෘත හා ඉංග්‍රීසි භාෂාවන් පිළිබඳ මෙන් ම ත්‍රිපිටක ධර්මය පිළිබඳ ද හසල දැනුමකින් හෙබි යතිවරයකු වූහ. දේශනයෙන් මෙන්ම ලේඛනයෙන් ද දක්ෂතා දැක්වූ උන්වහන්සේ විවිධ දහම් පොත පත හා ශාස්ත්‍රීය ලිපි ලේඛන ලියා පළකරමින් පුළුල් ධර්ම ශාස්ත්‍රීය මෙහෙවරක නිරත වූහ.

ශ්‍රී විජය සෞගත විද්‍යාලය රටට හඳුන්වාදුන් යතිවරයාණන් වහන්සේ ලෙස මාදුපිටියේ නා හිමියන් හැඳින්විය හැකි ය. මේධානන්ද නාහිමියන් වැඩ සිටි යුගයේ උන්වහන්සේගේ අන්තේවාසික ගිහි පැවිදි විශාල පිරිසක් ලංකාවේ විවිධ පළාත්වල අදට ද සේවයේ යෙදී සිටිති. ශ්‍රී විජය සෞගත විද්‍යාලයේ ධර්ම ශාස්ත්‍රීය මෙහෙවර වසර 32 පමණ කාලයක් සජීවිකරණයට ලක් කළ උන්වහන්සේ 1989 දී අපවත් වී වදාළහ.

ශ්‍රී විජය සෞගත විද්‍යාලය මහ පිරිවෙන බස්නාහිර පළාතේ පිරිවෙන් අධ්‍යාපන ආයතන අතර කීර්තිමත් ආයතනයක් ලෙස විශාල දියුණුවක් කරා මෙහෙයවීමේ ගෞරවයට උරුමකම් කියන වත්මන් දියුණුවේ නියමුවාණන් පාණදුරේ විජිතනන්ද නාහිමියන් ය. තරුණ අවදියේ දී ම මෙම ආයතනයේ ආධිපත්‍යයට පත් වූ උන්වහන්සේ සිය ආචාර්ය ප්‍රාචාර්යයන් වහන්සේ විසින් පවත්වා ගෙන එන ලද ආගමික, සාමාජික හා අධ්‍යාපනික මෙහෙවර සක්‍රියව ඉදිරියට පවත්වා ගෙන යාමට දරනු ලබන වෙහෙස අනල්ප ය.

සියයකට අධික ශිෂ්‍ය පිරිසක් සහ දොළොස් දෙනකුගෙන් සමන්විත ආචාර්ය මණ්ඩලය අපේක්ෂිත අරමුණු වෙනුවෙන් මෙහෙයවන උන්වහන්සේ විජය සෞගත විද්‍යාලයේ චිර පැවැත්ම උදෙසා දෙමහල් නේවාසිකාගාර, පිරිවෙන් ශාලා, පරිගණක ඒකකය, පුස්තකාලය සහ පිරිවෙන් කාර්යාලය මෙන් ම දාන ශාලාව වැනි භෞතික පහසුකම් රාශියක් මෙන්ම අංග සම්පූර්ණ විහාරස්ථානයකට අවශ්‍ය චෛත්‍යරාජයාණන් වහන්සේ, අටවිසි බුද්ධ මන්දිර, බෝධි ප්‍රාකාරය, ප්‍රවේශ වාහල්කඩ, ධාතු මන්දිරය සහ සිවු මහල් පිරිවෙන, දහම් පාසල් ගොඩනැඟිල්ලක් ද ඉදිකොට තිබේ. ශත සංවත්සරෝත්සවය නිමිත්තෙන් විවෘත කිරීමට අපේක්ෂිත සීමා මාලකය ද තවත් සුවිශේෂී ආරාමික අවශ්‍යතාවක් ඉටු කිරීමකි.

වාර්ෂිකව සැලකිය යුතු ශිෂ්‍ය පිරිසක් විශ්ව විද්‍යාල උසස් අධ්‍යාපනය සඳහා යොමු කිරීමට සමත් වන විජය සෞගත විද්‍යාල පිරිවෙන්, ප්‍රාචීන අධ්‍යාපනය සඳහා ද පහසුකම් සපයයි. වත්මන් පරිවෙණාධිපති ශාස්ත්‍රපති පින්වත්තේ අනුරුද්ධ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුළු ආචාර්ය මණ්ඩලය සිදු කරනු ලබන මෙහෙවර ද ප්‍රශංසනීය ය.

සියවස් සමරුව නිමිත්තෙන් විශේෂ පින්කම් මාලාවක් සහ උත්සවයක් පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබේ. සියවස් සමරු ධර්ම ශාස්ත්‍රීය සංග්‍රහය එළිදැක්වීම, සීමා මන්දිරය සහ සිවුමහල් පිරිවෙන, දහම් පාසල් ගොඩනැගිල්ල විවෘත කිරීම, සර්ව රාත්‍රික පිරිත් දේශනය සහ ශතාධික මහා සංඝරත්නය උදෙසා සංඝගත දක්ෂිණාවක් පිරිනැමීමට ද කටයුතු සම්පාදනය කර තිබේ.

රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති
ප්‍රවීණාචාර්ය
**අයගම සුසීල හිමි**



වලානේ ශ්‍රී විජයනන්ද අධිකරණ නාහිමි



පණ්ඩිතාචාර්ය මාදුපිටියේ මේධානන්ද නාහිමි



ඉහළ මහලේ ස්තූපය සහිත නව සිව්මහල් ගොඩනැගිල්ල



නව සීමාමාලකය

# පාණදුර වලාන ශ්‍රී විජය සෞගත විද්‍යාලය මහ පිරිවෙන් සියවසක අභිමානයට ආශිර්වාද ...

## උදාර ලෝක ශාසනික සේවාවක් කරන සුදීප්තිතර විද්‍යස්ථානයකි

**මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ මහා නායක අති පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහ නාහිමි**



සුනිශිත ධර්ම – විනය ඥානයෙන් පෝෂිතව, ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි ව්‍යාවෘත වෙමින් ස්වාර්ථ පරාර්ථ සාධනයෙහි නියුක්තව ශාසන බ්‍රහ්මචර්යාවෙහි උදාර පරමාර්ථයන් සාධනය කර ගැනීම භික්ෂු ප්‍රතිපදාව යි.

එකී උදාර භික්ෂු ප්‍රතිපදාවේ ආයති සුරක්ෂාව මෙන් ම ත්‍රිවිධ ශාසනයේ ප්‍රවර්තන, ප්‍රවර්ධනය හා සුරක්ෂණය අරමුණ කර ගනිමින් මෙයින් සියවසකට පෙර මහ පඬිරුවනක් වූ පණ්ඩිතාචාර්ය වලානේ ශ්‍රී විජයනන්ද මහා ස්වාමීන්ද්‍රයන්ගේ අප්‍රතිහත ධෛර්යයෙන් පාණදුර, වලාන ශ්‍රී විජය සෞගත විද්‍යාලය පිරිවෙන 1923 වර්ෂයේ දී ආරම්භ කරන්නට යෙදිණි.

අද්‍යතනය වන විට ප්‍රදේශයේ සුදීප්තිතර විද්‍යස්ථානයක් බවට පත්ව ප්‍රතිබල සම්පන්න ශාසන මාමක භික්ෂු පරපුරක් දායාද කරන වලාන ශ්‍රී විජය සෞගත විද්‍යාලය පිරිවෙනේ ශත සංවත්සරය නිමිත්තෙන් ආශිර්වාදාත්මක ශුභාශිංසන පණිවුඩයක් ලබා දෙනුයේ ඉමහත් සංතෝෂයෙනි.

වර්තමානය වන විට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී සම්බුද්ධ දර්ශනයේ සංස්පර්ශයෙන් ජන මනස ප්‍රබෝධවත් කරවීමෙහිලා ප්‍රතිබල සම්පන්න ධර්ම දේශකයාණන් වහන්සේ බිහි කිරීමෙහිලා සුවිසල් කාර්ය සමුදායක් ඉෂ්ට කරන පාර්වේණික මධ්‍යස්ථානයක් ලෙස සම්භාවනාවට පාත්‍රව ඇති ශ්‍රී විජය සෞගත විද්‍යාලය පිරිවෙන වාර්ෂික වශයෙන් සිදුකරන සමාජ සත්කාරයන් ද ගණනාවකි. දුෂ්කර පළාත්වල ශිෂ්‍ය දරුවන්ට පොත්පත් ප්‍රදානය කිරීම, උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම මෙන්ම ශ්‍රී විජය ප්‍රකාශන අරමුදල මඟින් ධර්ම පුස්තක මුද්‍රණය කොට බෙදාහැරීම ද ඒ අතර සුවිශේෂී වේ.

සියවස් සමරන ශ්‍රී විජය සෞගත විද්‍යාල මහ පිරිවෙන ආදී කර්තෘවරයාණන් වහන්සේ ඇතුළු මෙකී දීප්තිමත් විද්‍යස්ථානයේ ප්‍රගමනය උදෙසා නන් අයුරින් දායකත්වය සපයා ජන්මාන්තර ගත වූ ගෘහස්ථ ප්‍රව්‍රජිත සැමට උතුම් වූ නිර්වාණ සම්පත්තිය ම සාක්ෂාත් වේවා යි ප්‍රාර්ථනා කරන අතර ම වර්තමාන පරිවේණාධ්‍යක්ෂ ස්ථවිරපාදයන් වහන්සේ ඇතුළු සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලයට උදාර ලෝක ශාසනික සේවයෙහි නියුක්ත වන්නට ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදයෙන් ආයුරාරෝග්‍ය සම්පත්තිය උදාවේවා'යි ආශිංසනය කරමිහ.

## සසුනටත් රට දැයටත් වැඩ වඩන ධර්ම නිකේතනයකි

**ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක අග්ග මහා පණ්ඩිත පරියත්තිධර ත්‍රිපිටක විශාරද ශාස්ත්‍රපති අතිපූජ්‍ය මකුලෑවේ විමල මහ නාහිමි**



පාණදුර ප්‍රදේශයේ ඉතා කීර්තිමත් පිරිවෙන් ආයතන හා විහාරස්ථාන රැසක් පවතින අතර, අධ්‍යාපනික, ශාසනික සාමාජීය, සේවා රැසක් සිදු කරන ආයතනයක් වශයෙන් වලාන ශ්‍රී විජය සෞගත විද්‍යාලය මහ පිරිවෙන ද ප්‍රසිද්ධියක් උසුලනු ලබයි. 1923 මාර්තු මස 08 දින අතිපූජ්‍ය වලානේ ශ්‍රී විජයනන්ද අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආදි කර්තෘත්වයෙන් ඇරැඹි මෙම විහාරස්ථානය, පණ්ඩිතාචාර්ය අතිපූජ්‍ය මාදුපිටියේ මේධානන්ද, අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ යුගයේදී වඩාත් අභිවෘද්ධියට පත් වූ බව ප්‍රසිද්ධ කරුණකි.

අතිපූජ්‍ය මාදුපිටියේ මේධානන්ද නායක ස්වාමීන් වහන්සේ අද මෙන් මාධ්‍ය බහුලව නොතිබුණ කාලයේ ගුවන් විදුලි දක්ෂ ධර්ම දේශකයන් වහන්සේ නමක් වශයෙන් කා අතරත්, සම්භාවනාවට පාත්‍රව වැඩ සිටි අතර, සිංහල, පාලි, සංස්කෘත ඉංග්‍රීසි භාෂා ප්‍රවීණයෙක් වශයෙන් ද ලොකු පිළිගැනීමක් තිබුණ බව අපට සිහිපත් වේ. විජය සෞගත විද්‍යාල පිරිවෙන ද උන්වහන්සේ නිසා මහත් ප්‍රසිද්ධියට පත්විය.

වර්තමානයේ මෙම ආයතනයෙහි අධිපතිත්වය හොබවන කළුතර දිසාවේ උප ප්‍රධාන සංඝ නායක පදවිය හොබවන පූජ්‍යපාද පාණදුරේ විජිතනන්ද නායක ස්වාමීන් වහන්සේ තම ආචාර්ය ස්වාමීන් වහන්සේලාගෙන් ලත් ආභාෂය ඇතුව මෙම පිරිවෙන් ආයතනය වඩාත් ක්‍රමානුකූලව දියුණුවට පත් කර ඇත. භෞතික වශයෙන් පුස්තකාලය සහිත පිරිවෙන් ශාලාව ඉදි කිරීම, නව සීමා මාලකය ඉදි කිරීම, නව පිරිවෙන් ගොඩනැගිල්ලක් ඉදි කිරීම, මෙන්ම චෛත්‍ය රාජයාණන් වහන්සේ ගොඩනැගීම අටවිසි බෝධිඝරය ඉදි කිරීම, ආදි විහාරාරාංගවලින් විහාරස්ථානය රමණීයත්වයට පත් කර ඇත.

සසුනේ චිර පැවැත්ම උදෙසා කුල දරුවන් රැසක් පැවිදි කොට එම ශිෂ්‍ය පිරිස දැන උගත් භික්ෂු පිරිසක් බවට පත් කොට විදේශ ධර්මදූත සේවයෙහි ද යොදවමින් ශාසනික සංග්‍රහයක් විජිතනන්ද නාහිමියන් සිදු කරන අතර, දැයේ දරුවන් වෙනුවෙන් ශ්‍රී මේධානන්ද දහම් පාසල ආරම්භ කොට පවත්වාගෙන යමින් ද, ප්‍රඥා ප්‍රදීප ශිෂ්‍යත්ව අරමුදල' මඟින් ශිෂ්‍යත්ව පිරිනැමීමෙන් කරන සුවිසල් සේවය ද වඩාත් අගය කළ හැක. මෙසේ විවිධ කාර්යයන් රැසක් මඟින් සසුනටත්, රටටත්, දැයටත් වැඩ වඩන ශ්‍රී විජය සෞගත විද්‍යාලය මහා පිරිවෙන් ආයතනයට වසර සියයක් සපිරෙන මේ මොහොතේ තවත් ශතවර්ෂාධික කාලයක් මේ ආයතනය දිනෙන් දින දියුණුවට පත් වේවා. සම්බුදු සසුනේ චිර පැවැත්මට ශක්තියක් වේවා. විහාරාධිපති පරිවේණාධිපති නාහිමිවරු ඇතුළු සියලු දෙනාටම තෙරුවන් සරණින් නිරෝගි සුව දීර්ඝායු සැලසේවා'යි ආශිර්වාද කරමිහ.

## ප්‍රදේශයේ කීර්තිධර මහ පිරිවෙනකි

**මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහා නායක ආචාර්ය අති පූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතන මහ නාහිමි**



අප රටේ පැරණිතම අධ්‍යාපන ක්‍රමය බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායයි. එකී අධ්‍යාපන සම්ප්‍රදායට පාර්වේණික අධ්‍යාපන ක්‍රමය භික්ෂූන් වහන්සේ කේන්ද්‍රීය සාධකය කොට ගෙන එමඟින් පර්යාප්ති ශාසන සංරක්ෂණයට ද මඟ සලසන ලදි. මෙරටෙහි ඉතිහාසයේ විවිධ යුගවල මෙකී අධ්‍යාපන ක්‍රමය ඉතා දියුණුවෙන් පැවති අතරම පරිහානියට ගොදුරු වූ ආකාරය ද ප්‍රකට කරුණකි.

ඒ ඒ යුග පරිවර්තනයන් අනුව සැලකීමේ දී ස්වදේශීය සම්බුද්ධ ශාසනයේ නූතන සමයේ ආරම්භය හා ව්‍යාප්තිය සිදු වූයේ වැලිවිට අසරණසරණ සරණංකර සංඝරාජ මාහිමියන්ගේ ධර්ම විනයානුකූල ශාසනෝන්නතිකාමී වැඩ පිළිවෙත නිසාවෙනි. විශේෂයෙන් ම උන්වහන්සේ නියමකන්ද පිරිවෙන ආරම්භ කිරීමෙන් විනාශ වී තිබුණු භික්ෂු අධ්‍යාපනය යළි නඟාසිටුවූ සේක.

19 වැනි සියවසෙහි මැදභාගය වන විට මිෂනාරි අධ්‍යාපනය රාජ්‍ය අනුග්‍රහයෙන් ව්‍යාප්ත වූ නිසා මෙරටෙහි දේශීය අධ්‍යාපන ක්‍රමය අඩපණ විය. එසේ වුවත් වලානේ සිද්ධාර්ථ ස්වාමීන් වහන්සේ විසින් පාර්වේණික අධ්‍යාපන ක්‍රමය නඟාසිටුවමින් සසුනට දායාද කළ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර නිසා ආරාමීය ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ක්‍රමයෙන් ව්‍යාප්ත විය.

එහි ම ප්‍රතිඵලයක් ලෙස 1923 දී පාණදුර වලාන ශ්‍රී විජය සෞගත විද්‍යාලය පිරිවෙන ආරම්භ වූ අතර, එවකට භාෂාත්‍රයේ පඬිරුවනක් වශයෙන් වැඩ විසූ පූජ්‍යපාද පණ්ඩිතාචාර්ය වලානේ ශ්‍රී විජයනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙම පිරිවෙනේ ආදි කර්තෘන් වහන්සේ ද වූහ. උන්වහන්සේගේ අපවත් වීමෙන් පසු සුප්‍රකට බහුශ්‍රැත පඬිරුවනක් වූ පණ්ඩිතාචාර්ය පූජ්‍යපාද මාදුපිටියේ මේධානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙකී ආධිපත්‍යයට පත් වී ඇත.

කෙසේ වුවත් මෙම විද්‍යස්ථානයේ දීප්තිමත් අවධිය ලෙස වර්තමාන පිරිවෙනේ කෘත්‍යාධිකාරී පූජ්‍යපාද පාණදුරේ විජිතනන්ද නායක ස්ථවිරයන්ගේ අවධිය හැඳින්වීම අනුචිත නොවේ. සියලු විහාරාංගයන්ගෙන් සමලංකෘත වූ ශ්‍රී විජය සෞගත විද්‍යාලය පිරිවෙන මේ වන විට ප්‍රදේශයේ කීර්තිධර මහ පිරිවෙනක් බවට පත් වී තිබීම අපගේ ද සතුටට හේතු වේ.

මේ අවස්ථාවේ ස්වර්ණ ජයන්තිය සමරන වලාන ශ්‍රී විජය සෞගත විද්‍යාලීය මහ පිරිවෙන් කෘත්‍යාධිකාරී ධූර්ණ පූජ්‍ය පානදුරේ විජිතනන්ද නායක ස්ථවිරයන් ඇතුළු සැම දෙනාට ම තව තවත් ධර්ම ශාස්ත්‍රීය සේවාව සිදු කර ගෙන යාමට ශක්තිය ධෛර්යය ලැබේවා'යි ප්‍රාර්ථනා කරමිහ.

## ධර්ම ශාස්ත්‍රෝන්නතිය වෙනුවෙන් කර ඇති මෙහෙවර අගය කළ යුතුයි

**ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහා නායක අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය දෙඩම්පහල චන්දසිරි මහ නාහිමි**



වර්ෂ 1923 මාර්තු 08 දින පණ්ඩිතාචාර්ය පූජ්‍ය වලානේ ශ්‍රී විජයනන්ද නායක ස්වාමීන් වහන්සේගේ ආදි කර්තෘත්වයෙන් ඇරැඹි මෙම පිරිවෙන් ස්ථානය සියවසක් පුරා ධර්ම ශාස්ත්‍රොන්නතිය වෙනුවෙන් සිදු කර ඇති මෙහෙය මෙහිදී අගය කළ යුතු ය. ශ්‍රී විජයානන්ද නාහිමියන් ආරම්භ කළ පරිවෙණස්ථානය ආරක්ෂා කර ගනිමින් එහි දෙවැනි ආධිපත්‍යයට පත්වූයේ පණ්ඩිතාචාර්ය පූජ්‍ය මාදුපිටියේ මේධානන්ද අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. උන්වහන්සේ සිංහල, පාලි, සංස්කෘතාදී භාෂා ශාස්ත්‍ර පිළිබඳ ප්‍රවීණයෙකි. උන්වහන්සේගේ අපවත් වීමෙන් පසු පූජ්‍ය පාණදුරේ විජිතනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේට පිරිවෙනස්ථානයේ වගකීම් සම්භාරය ඉසිලීමට සිදුවිය. උන්වහන්සේගේ සෘජු නායකත්වය යටතේ මේ වන විට දීප්තිමත් පරිවෙණස්ථානයක් බවට ශ්‍රී විජය සෞගත විද්‍යාලය පත්ව ඇත.

ශතවර්ෂයක් සපිරෙන මෙම විද්‍යස්ථානය තුළින් මතු මතුත් සසුන් දියුණුව සලසන්නට හැකි වේවායි ප්‍රාර්ථනා කරමිහ.

# ලෝකයට දිය හැකි අනර්ඝතම වස්තුව නිර්මල බුදු දහමයි



**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ ස්කැන්ඩිනේවියානු රටවල ප්‍රධාන සංඝනායක විනය කීර්ති ශ්‍රී සිද්ධාර්ථ පරියාප්ති විශාරද ශාස්ත්‍රපති පූජ්‍ය**

**කිරිඳිගල්ලේ ධම්මරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය**

**ජාතික ජාත්‍යන්තර වශයෙන් ශාසනෝන්නතිය සිදු කරමින් වැඩ සිටින බහුශ්‍රැත විනයධර මහතෙරුන් වහන්සේ නමක් වන ඔබ වහන්සේගේ ජීවන තොරතුරු මතු කරමින්ම සාකච්ඡාවට ප්‍රවේශ වෙමු නායක හාමුදුරුවනේ**

මම ජන්ම ලාභය ලැබුවේ 1942 වර්ෂයේ නොවැම්බර් මස 17 වැනිදා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ කිරිඳිගල්ල නමින් හඳුන්වන බොහොම සොඳුරු ගම්පියසක තමයි මගේ ළමා කාලය ගත වුණේ.

ආයුර්වේද වෛද්‍යවරයකු වුණ දසනායක මුදියන්සේලාගේ ටිකිරි බණ්ඩාර පියාණන් වගේම මියනදෙනියේ හේරත් මුදියන්සේලාගේ ලොකු මැණිකේ මෑණියන් මගේ මවුපියන් බවත් ගෞරවයෙන් සිහිපත් කළ යුතුයි. ඒ වගේම පුරන ලද පාරමිතා බලයට අනුව 1956 වර්ෂයේ මැයි මස 24 වැනි දා මාරතුගොඩ පුරාණ විහාරස්ථානයේ දී කිරිඳිගල්ලේ ධම්මරතන යන ශාසනික නාමයෙන් ප්‍රව්‍රජ්‍යාභාවය ලබා ගෙන නිසි වයස සම්පූර්ණ වීමත් සමඟ 1964 වර්ෂයේ ජූනි මස 12 වැනිදා ඓතිහාසික මහනුවර මල්වතු මහා විහාර මංගල උපෝෂථාගාරයේ දී උපසම්පදා ශීලයෙහි පිහිටවනු ලැබුවා.

ඒ වගේම මාරතුගොඩ පුරාණ විහාරාධිපතිව වැඩ විසූ සාරසිය පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක ගෞරවාර්හ ඕවිස ශ්‍රී මේධානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේත්, කිරිඳිගල්ලේ මේඝගිරි විහාරාධිපතිව වැඩ විසූ ඉහළ දොළොස් පත්තුවේ උප ප්‍රධාන සංඝ නායක ගල්ලෑල්ලේ ශ්‍රී රතනජෝති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත් මගේ ආචාර්යවරුන් වශයෙන් කටයුතු කළ බව පුණ්‍යානුමෝදනා පූර්වකව කෘතවේදීව සිහිපත් කළ යුතුයි. පැවිදි වීමෙන් අනතුරුව කුරුණෑගල මලියදේව මහ පිරිවෙනෙන් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා ගෙන උසස් අධ්‍යාපනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණා. 1963 වර්ෂයේ සිට 1967 වර්ෂය දක්වා කැලණිය විශ්ව විද්‍යාලයෙන් සාමාන්‍ය ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය ලබා ගෙන 1979 වර්ෂයේ දී ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග සමත් වීමෙන් පසුව 1984 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපන ඩිප්ලෝමාව ලැබුවා. 1987 වර්ෂයේ දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා ගැනීමට කටයුතු කළා. ඒ වගේම 1967 වර්ෂයේ සිට 1969 වර්ෂය දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොකරැල්ල පොල්ගොල්ලේ ශාස්ත්‍රාරවින්ද්‍ර පිරිවෙන් විද්‍යායතනයේ ආචාර්යවරයකු වශයෙන් කටයුතු කළ බවත් සිහිපත් කිරීම වැදගත්.

**සසුන්කෙත සරු කරමින් දෙස් විදෙස් කිත්ගොස නඟමින් සිදුකරන සේවාවන් පාඨකයාට සිහිපත් කර දෙන්න හාමුදුරුවනේ**

1969 පෙබරවාරි මස 24 වැනි දා මහනුවර දිස්ත්‍රික්කයේ හාරසිය පත්තුවේ ගලසිය පත්තුවේ මාරතුගොඩ විදුමිණ පිරිවෙන ආරම්භ කළා. ඒ සඳහා ගුරුදේවයන් වහන්සේලාගේත්, ප්‍රාදේශීය භික්ෂූන් වහන්සේලාගේත් අනුග්‍රහය ලැබුණ බවත් සිහිපත් කළ යුතුයි. ඒ වගේම දායක දායිකාවන්ගේත් පූර්ණ සහයෝගය ලැබුණා.




එම පිරිවෙනේ ආරම්භක පරිවේණාධිපති වශයෙන් කටයුතු කරමින් රටට වැඩදායක ගිහි පැවිදි පිරිසක් බිහි කිරීමට ක්‍රියා කළා.

අද වන විට එය බොහොම ප්‍රසිද්ධ පිරිවෙන් විද්‍යායතනයක් .

1978 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන අංශයේ බාහිර කථිකාචාර්යවරයකු වශයෙන් කටයුතු කළා.

තවදුරටත් ප්‍රකාශ කරනවා නම්, 1983 වර්ෂයේ දී කිරිඳිගල්ල මේඝගිරි විහාරස්ථානයේ ශ්‍රී සුධර්මෝදය නමින් මූලික පිරිවෙනක් ආරම්භ කළා. මාරතුගොඩ විදුමිණ පිරිවෙන් විද්‍යායතනය හා අනුබද්ධ ආයතනයක් වශයෙන් තමයි එම පිරිවෙන ආරම්භ කළේ. කුඩා සාමණේර හාමුදුරුවන්ගේ භික්ෂු ආකල්ප සංවර්ධනයට යොමුවුණ ආයතනයක් වශයෙන් භික්ෂු අධ්‍යාපනයේ උන්නතියට කටයුතු කිරීම අරමුණ වශයෙන් ප්‍රකාශ කරන්න පුළුවන්.

ඊට අමතරව 1989 වර්ෂයේ සිට 1990 දක්වා ස්වීඩනයේ ධර්මදූත කටයුතුවලට සහභාගි වෙමින් ධර්ම ප්‍රචාරය සඳහා දායකත්වය ලබා දුන්නා. නැවතත් අධ්‍යාපන අමාත්‍යංශයේ පත්වීමක් මත 1990 වර්ෂයේ සිට 1995 වර්ෂය දක්වා මධ්‍යම පළාතේ පිරිවෙන් හා ආගමික අධ්‍යාපනය පිළිබඳ සම්බන්ධීකරණ නිලධාරි වශයෙන් සම්බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය සඳහා කැපවීමෙන් කටයුතු කළා.

ඒ වගේම 1995 වර්ෂයේ සිට අද දක්වා ම ස්වීඩනයේ ස්ටොක්හෝල්ම් බෞද්ධ විහාරය මූලික කරගෙන ස්වීඩනය, ඩෙන්මාර්කය, නෝර්වේ, පින්ලන්තය හා අයිස්ලන්තය යන රටවල ධර්ම දූත කටයුතුවල යෙදුණා.

ශ්‍රී ලාංකික මූලයක් ඇතිව ඒ රටවල ජීවත්වන බෞද්ධ ජනතාවටත්, වෙනත් රටවලින් පැමිණි බෞද්ධ ජනතාවටත් බෞද්ධ ප්‍රතිපත්ති පූරණය සඳහා අවශ්‍ය දැනුම ලබා දෙනවා.

**භික්ෂු ප්‍රතිරූපය ආරක්ෂා වන ආකාරයට පළමුවෙන්ම කටයුතු කළ යුතුයි. ලංකාවේ පිරිසට වඩා විදේශිකයන්ගේ සිතුම් පැතුම් වෙනස් වන නිසා විවිධ අභියෝගවලට මුහුණ දෙන්න වෙනවා. එනිසා තමා හැම පැත්තකින්ම ශක්තිමත් ව අත්දැකීම් සමුදායක් ඒකරාශි කරගෙන තිබීමෙන් ඕනෑම පරිසරයකට ඔරොත්තු දීමේ හැකියාව ලැබෙනවා. ලංකාවෙන් ලෝකයට දිය හැකි අනර්ඝතම වස්තුව නිර්මල බුදුදහම බව අවබෝධ කරගෙන කටයුතු කිරීම අතිශයින් ම වැදගත්.**

**දේශීය විදේශීය ධර්ම ප්‍රචාරයෙහිලා අත්දැකීම් සම්භාරයකින් පිරිපුන් වයෝවෘද්ධ, තපෝවෘද්ධ, සීලවෘද්ධ නාහිමිපාණන් වහන්සේ නමක් වූ ඔබ වහන්සේ ධර්ම ප්‍රචාරයේ නියැළීමට බලාපොරොත්තුවන ස්වාමීන් වහන්සේලාට ලබාදෙන අවවාද අනුශාසනා පැහැදිලි කරමින් සාකච්ඡාව අවසන් කරමු අපේ හාමුදුරුවනේ.**

ඒක ඉතාම වැදගත් පළමුවෙන් ම භික්ෂුව කියන්නේ කවුද යන්න නිවැරැදිව තේරුම් ගත යුතුයි.

භික්ෂු ප්‍රතිරූපය ආරක්ෂා වන ආකාරයට පළමුවෙන්ම කටයුතු කළ යුතුයි. ලංකාවේ පිරිසට වඩා විදේශිකයන්ගේ සිතුම් පැතුම් වෙනස් වන නිසා විවිධ අභියෝගවලට මුහුණ දෙන්න වෙනවා. එනිසා තමා හැම පැත්තකින්ම ශක්තිමත් ව අත්දැකීම් සමුදායක් ඒකරාශි කරගෙන තිබීමෙන් ඕනෑම පරිසරයකට ඔරොත්තු දීමේ හැකියාව ලැබෙනවා. එම ශක්තිය විදේශගත වීමට පෙර ලබා ගෙන තිබීම වැදගත්. බෞද්ධ දර්ශනය වගේම භාෂා ඥානයත් වර්ධනය කර ගෙන තිබීම අත්‍යවශ්‍යයි.

එහෙම නැත්නම් අනෙක් පිරිස අපහසුතාවට පත්වෙනවා වගේම තමනුත් අපහසුතාවට පත්වෙනවා. සැම විටම භික්ෂු ආකල්පවලින් පරිපූර්ණ ප්‍රතිරූපයත් නිවැරැදි ධර්මාවබෝධයත්, පිරිපුන් බහුශ්‍රැත බවත් තුළ ඕනෑම අභියෝගයකට මුහුණ දීමේ ශක්තිය ලැබෙනවා. ලංකාවෙන් ලෝකයට දිය හැකි අනර්ඝතම වස්තුව නිර්මල බුදුදහම බව අවබෝධ කරගෙන කටයුතු කිරීම අතිශයින් ම වැදගත්.

හේමමාලා රන්දුනු



# බුදුරදුන් ඥාතීන් හමුවට ගමන් ඇරඹූ මැදින් පුරපසළොස්වක පෝදා

**හේමන්ත සෘතුවේ එළඹෙන මැදින් පුර පසළොස්වක පොහොය දිනය බෞද්ධයන්ගේ සුවිශේෂී පුන් පොහෝ දිනයකි.**

බුද්ධත්වයෙන් පසු රජගහනුවර වේළුවනාරාමයේ වැඩසිටි බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුර විසූ පිය රජතුමා ඇතුළු ඥාති පිරිස දැකීමට ගමන් ආරම්භ කරන ලද්දේ මැදින් පුර පසළොස්වක පොහෝ දිනයකවීම මෙම පොහොයේ විශේෂත්වය යි. මැදින් පොහෝ දා ආරම්භ කළ උපන් ගමට වැඩීම කිරීමේ ගමනට දෙමසක් ගත වූ අතර බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩමවන ලද්දේ වෙසක් පොහෝ දිනයක දී ය.

බුදුරජාණන් වහන්සේ දුෂ්කර ක්‍රියාව ඇතුළු වීර්ය වඩා වෙසක් පොහෝ දිනයක සම්මා සම්බුද්ධත්වයට පත් ව ඇසළ පොහෝ දිනයක දම්සක් පවත්වා අනුක්‍රමයෙන් ධර්මදූත පිරිස් බිහි කරමින් ලෝක සත්වයන් වෙත අපමණ කරුණාවෙන් ක්‍රියා කරද්දී බුදුරදුන්ගේ කීර්තිරාවය දඹදිව සතර දිග්භාගයේ ම පැතිර යන්නට විය. තම පුතු වූ සිදුහත් කුමරුන් සම්බුද්ධත්වයට පත් වී රජගහනුවර වේළුවනාරාමයේ වැඩ සිටිමින් ලෝ සතුන්ට දුකින් මිදෙන මඟ පෙන්වා

දෙන බව ඇසූ සුද්ධෝදන රජතුමාට පුතු දැකීමට වූ ආශාව දිනෙන් දින වැඩි විය.

අවස්ථා නවයක දී පිරිවර දහස බැගින් යුතු අමාත්‍යවරයෙකු බැගින් දූත කාර්යයෙහි යොදවා බුදුරජාණන් වහන්සේ කිඹුල්වතට කැඳවාගෙන එන ලෙස සුද්ධෝදන රජතුමා පිටත් කොට හැරියේ ය. එසේ යැවූ අමාත්‍යවරුන් නව දෙනා සහ නව දහසක පිරිස බුදුන් දැක දහම් අසා රහත්ව පැවිදි විය.

ඉන්පසු සිදුහත් බෝසතාණන් වහන්සේ සමඟ එකම දිනයක උපන් කාළුදායි ඇමතිවරයා කැඳවා දහසක් පිරිවර ලබා දී දූත කාර්යයෙහි යෙද වූ අතර තමාට පැවිදි වීමට අවසර ලබා ගත් කාළුදායි ඇමතියා බුදුරජාණන් වහන්සේ වෙත එළඹ දහම් අසා පිරිවර සමඟ රහත් ඵලයට පත් විය. මේ සමඟ අවස්ථා දහයක දී සුද්ධෝදන රජතුමා විසින් එවූ දූත පිරිස දස දහස් දහ දෙනෙක් (10 010) පැවිදි බිමට පත්ව සිටියහ.

පැවිදි වී සතියක් ගෙවුණු පසු කාළුදායි මහ රහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේ වෙත එළඹ පිය රජතුමාගේ අපේක්ෂාව දන්වා කිඹුල්වත්පුරයට වැඩම කිරීමට ආරාධනා කළහ. ඒ වන විට හේමන්ත සෘතුවේ මැදින් පොහෝ දිනය එළඹී තිබුණි. මැදින් පොහොය පරිසරය ප්‍රබෝධමත් වන කාලයකි. තුරුලතා නව දළු ලා වැඩෙන, මල් පිපී විචිත්‍රවත් වන කාලයකි. ගොවීන් කෙත්වතු අස්වද්දා අස්වනු නෙළා ගනිමින් සමෘද්ධිමත්ව සිටින කාලයකි. අධික ශීතලෙන් හෝ රස්නයෙන් තොර සෞම්‍ය දේශගුණයක් පවතින කාලයකි. රජගහනුවර සිට කිඹුල්වත්පුරයට යන මාර්ගය සැට යොදුනකි. යොදුනක් යනු සැතපුම් දහසයක දුර ප්‍රමාණයකි. ගස් වැල් මලින් ඵලින් බර වී සුවඳවත් වී විචිත්‍රවත් වී රට සමෘද්ධිමත් වී ඇති සමයේ මාර්ගයේ සහ පරිසරයේ විචිත්‍රත්වය දක්වමින් කිඹුල්වතට වැඩීමට සුදුසුම කාලය එළඹ ඇතැයි ගාථා හැටකින් කාළුදායි තෙරණුවන් බුදුරජාණන් වහන්සේ වෙත දන්වා සිටියහ.

කාළුදායි තෙරණුවන්ගේ ඇරැයුම පිළිගත් බුදුරජාණන් වහන්සේ සුද්ධෝදන රජතුමා එවූ දූත පිරිසෙන් පැවිදි වූ දස දහස් දහ දෙනා ද ඇතුළු විසි දහසක් මහ සඟ රුවන පිරිවරාගෙන මැදින් පුර පසළොස්වක් පොහෝදින සන්ධ්‍යාවේ දී කිඹුල්වත්නුවරට වැඩීම පිණිස රජගහනුවර වේළුවනාරාමයෙන් පිටත් වූහ.

දිනකට එක් යොදුන බැගින් සැට යොදුන් දුර දින සැටක දී සම්පූර්ණ කළ බුදු පාමොක් මහ සඟන කිඹුල්වත්පුරයට ළඟා වූයේ වෙසක් පුරපසළොස්වක පොහෝ දිනයේ දී ය. මේ කාලයේ බුදුපාමොක් මහ සංඝරත්නයට සුද්ධෝදන රජතුමා විසින් පිණ්ඩපාත දානය සකස් කොට කාළුදායි තෙරුන් අත එවන ලදී.

වෙසක් පොහෝ දා කිඹුල්වත්පුරයට ළඟා වූ බුදුරජාණන් වහන්සේ ශාක්‍යයන්ගේ මානය දුරු කිරීමට යමාමහ පෙළහර පෑ අතර බුදුපාමොක් මහ සඟනට පිය රජතුමා නිග්‍රෝධාරාමය පූජා කළේය. පසු දින පිණ්ඩපාතයේ යෙදෙමින් පිඩුසිඟා යාම බුද්ධ වංශයේ සිරිත බව පිය රජුට පෙන්වා දුනි. නන්ද කුමරු හා රාහුල කුමරු පැවිදි වූයේ ද මෙම කිඹුල්වත්පුර වැඩමවීමේ දී ය.



රාජකීය පණ්ඩිත
**දෙදියගල නන්දරතන හිමි**

## ප්‍රහේලිකා අංක 34

බුදුසරණ
ත්‍යාග අනුග්‍රහය බෞද්ධාලෝක පදනම
බෞද්ධාලෝක පදනම BAUDDHALOKA FOUNDATION

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් සම්මානිත ආචාර්ය කේ. එල්. ඒ. රණසිංහ මහතා විසිනි.**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | 2 | | ■ | ■ | 3 |
| ■ | | ■ | ■ | 4 | |
| 5 | | 6 | | ■ | |
| | ■ | | ■ | 7 | |
| | ■ | ■ | 8 | | ■ |
| 9 | | | | ■ | ■ |

**හරහට**

1. බුදු දහමේ මෙනම් ධර්ම පහක් දක්වා ඇත.
4. කාශ්‍යප බුදුරදුන් බුදුබව ලබාගත්තේ මෙම ගසක් සෙවණේ යැයි සඳහන් වේ.
5. දෙව්දත් තෙරුන්ට ලේ වමනය වන පරිදි පහරදුන්නේ මෙනම් භික්ෂුවකැයි කියැවේ.
7. මඟී ප්‍රවාහනය සඳහා යොදා ගන්නා දෙයකි.
8. ක්‍රිස්තු වර්ෂ ක්‍රමයේ ආගමනයට පෙර මෙරට භාවිත වූ වර්ෂ ක්‍රමයකි.
9. අංගුලිමාල තෙරුන්ගේ මෑණියන්ගේ නමයි.

**පහළට**

2. දෙවියන් වෙත කෙරෙන පිහිට ඉල්ලීම් හැඳින්වීමට මෙම නම යෙදේ.
3. රජරට පළාතේ වී අස්වැන්න නෙළා පළමුව එයින් ශ්‍රී මහා බෝධියට පුදන දානයේ නමයි.
5. මහාභද්‍ර කල්පයෙහි දෙවනුව පහළ වූයේ මෙනම් බුදුරදුන් බව සඳහන් ය.
6. බෞද්ධාගමික සිද්ධීන් සඳහන් මෙම වාර්ෂික ප්‍රකාශනය බිත්ති මත ප්‍රදර්ශනය කරන්නකි.
7. බුදුරදුන් විසින් මෙනම් බ්‍රහ්මයකු දමනය කරන ලද බව බෞද්ධ සාහිත්‍යයේ දක්වයි.
8. මෙම ග්‍රහයා සාමාන්‍යයෙන් ශුභ ප්‍රතිඵල නොදෙන අයෙකු බව ප්‍රවාදයයි.

**පිරුවානා පොත් වහන්සේ ඇතුළු වටිනා ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**

## සිරි සදහම් පැන විසඳුම්

**සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුර ලියා එවා ගුණසේන සහ සමාගමෙන් "මහ පිරිත් පොත් වහන්සේ " ධර්ම ග්‍රන්ථය හිමිකර ගන්න.**

**සතිපතා ජයග්‍රාහකයින් පස් දෙනකුට ත්‍යාග තිළිණ කෙරේ**

බුදුසරණ
මෙවර ප්‍රශ්නය - 92

**අටලෝ දහම නම් කරන්න**

ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

පිළිතුර : ..............................
නම : ..............................
නිවසේ ලිපිනය : ..............................
..............................
දුරකතන අංකය : ..............................

ඇම්. ඩී. ගුණසේන - බුදුසරණ සිරි සදහම් පැන විසඳුම් , බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10

# ධර්ම සන්නිවේදන මෙහෙවර සඳහා කැප වූ යතිවරයාණෝ

## පූජ්‍ය දරණාගම කුසලධම්ම නාහිමි



**ධර්ම සන්නිවේදනය සඳහා ම පමණක් වූ රූපවාහිනී නාලිකාවක් ආරම්භ නොවූ යුගයක ප්‍රේක්ෂක ශ්‍රාවක සිත් තුනුරුවන් වෙත යොමු කරමින්, ලෝ වැසියන්ගේ සිත් සම්බුදු දහමෙන් සුවපත් කිරීමේ අරමුණින් සැම හිත සුව පිණිස "බෞද්ධයා" රූපවාහිනී නාලිකාව ආරම්භ කරනු ලැබූහ.**

දවසේ විසිහතර පැය පුරා දම් දෙසුම් ප්‍රධාන ආගමික වැඩසටහන් පමණක් විකාශය කිරීම බෞද්ධයා රූපවාහිනී නාලිකාවේ පරමාදර්ශය වේ. මෙරට බෞද්ධ සමාජයේ යහපත උදෙසා ආරම්භ කළ පළමු බෞද්ධ රූපවාහිනී නාලිකාව ද එම බෞද්ධයා රූපවාහිනී නාලිකාව ය.

දහම් පිපාසිත සමාජයේ දහම් පවස නිවා සදහම් සුවයෙන් සැනසීම උදාකර දෙන්නට පූජනීය දරණාගම කුසලධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගත් මෙම උත්සාහයේ ප්‍රතිඵල තවත් යුග ගණනාවක් පුරා බොදු ජනතාව අත්විඳිනු නො අනුමාන ය.

මෙරට ප්‍රකටව වැඩ සිටි ධර්ම විනයධර මහා යතිවරයන් වහන්සේලා මෙන් ම ඉතා අප්‍රකටව වැඩ සිටි ධර්ම විනයධර යතිවරයන් වහන්සේලාට ද දහම් දෙසීමේ අවස්ථාව බෞද්ධයා රූපවාහිනී නාලිකාව මඟින් උදා විය. එමෙන් ම තරුණ ධර්ම කථික ස්වාමීන්ද්‍රයන් වහන්සේ රැසක් ද සමාජය එමඟින් දැන හඳුනාගනු ලැබූහ.

බෞද්ධයා රූපවාහිනියට අමතරව බෞද්ධයා ගුවන්විදුලිය 2011 දී පූජනීය දරණාගම කුසලධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේ ආරම්භ කළහ. අනතුරුව ශ්‍රී සම්බෝධි සදහම් සඟරාව ද උන්වහන්සේ ආරම්භ කළහ.

මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මෙහෙයවීමෙන් මෙරට ඓතිහාසික පුදබිම්හිදී පමණක් නොව දඹදිව පුණ්‍ය භූමින්හි ද ඓතිහාසික පින්කම් වරින්වර සිදු කළ අවස්ථා බොහෝ ය. තුනුරුවන් වෙත මහත් ශ්‍රද්ධා ගෞරවයෙන් ම කටයුතු කළ උන්වහන්සේ ගිහි පැවිදි උභය සමාජයේ ම මහත් ගෞරවයට පාත්‍රව ම වැඩ සිටි ආදර්ශවත් යතිවරයන් වහන්සේ නමක් වූහ.

උන්වහන්සේ විසින් මෙහෙයවන ලද සමාජ සේවා සද්කාර්යයන් ද බොහෝ ය. එමෙන්ම බෞද්ධයා නාලිකාවට අමතරව එහි ශාඛා ප්‍රධාන නගර රැසක ම ආරම්භ කරමින් බෞද්ධයා නාලිකාවේ ප්‍රගමනයට කළ මෙහෙවර බොහෝ ය.

බෞද්ධයා මාධ්‍ය ජාලයේ ගරු වත්මන් සභාපති ශ්‍රී සම්බෝධි මහා විහාරාධිපති පූජනීය බොරලන්දේ වජිරඤාණ ස්වාමීන්ද්‍රයන් වහන්සේ ස්වකීය ගුරුදේවෝත්තමයන් වහන්සේට උපහාර ලෙස බෞද්ධයා මාධ්‍ය ජාලයේ සහ ශ්‍රී සම්බෝධි මහා විහාර ප්‍රධාන ශාඛා මධ්‍යස්ථානයන්හි ද ඉමහත් අභිවෘද්ධියට සහ සංවර්ධනයට හා ආරක්ෂාවට ද මහඟු මෙහෙවරක් දිවා රෑ වෙහෙසී ඉටු කිරීම ද බොදුනුවන්ගේ ඉමහත් වාසනාවකි.

පූජනීය දරණාගම කුසලධම්ම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පස්වන වාර්ෂික ගුණ සමරුව නිමිත්තෙන් පූජනීය බොරලන්දේ වජිරඤාණ ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසනා පරිදි සමාජ සේවා කටයුතු රැසක් සමඟ පින්කම් මාලාවක් සිදු කිරීමට ද කටයුතු යොදා තිබිණි.

ඒ නිමිත්තෙන් සම්බෝධි මහා විහාරාධිපතිව වැඩ සිට අපවත්වී වදාළ පූජනීය පාණදුරේ අරියධම්ම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ අපවත්වී වදාළ පූජනීය පියදස්සි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ද ගුණානුස්මරණය මාර්තු මස 3 වැනි දා සිට පැවැත්මීමට කටයුතු යොදා තිබිණි. ගැටඹේ රාජෝපවනාරාමාධිපති පූජනීය කැප්පිටියාගොඩ සිරිවිමල අනු නාහිමියන්ගේ ආශිර්වාදයෙන් ගැටඹේ රාජෝපවනාරාමයේ දී පින්කම් මාලාවක් ඉකුත් 3 සහ 4 දෙදින තුළ පැවැත්විණි.

බොරලන්දේ වජිරඤාණ ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසනා පරිදි සහ මෙහෙයවීමෙන් අධ්‍යක්ෂ ජනරාල් සම්මානිත මහාචාර්ය රෝහණ  මහතා සහ පරිපාලන සහ මූල්‍ය අධ්‍යක්ෂ මහේෂ්ද අල්විස් මහතාගේ සහ බෞද්ධයා මාධ්‍ය ජාලයේ වැඩසටහන් අධ්‍යක්ෂ කල්‍යාණ අලවත්තේගම මහතා සහ බෞද්ධයා ගුවන්විදුලි අධ්‍යක්ෂ සහන් වනිගරත්න මහතාගේ ද පූර්ණ කැපවීමෙන් එම ගුණ සමරු පින්කම් මාලාව පැවැත්වීමට කටයුතු යොදා ඇත.

බුදුසරණ හිටපු කර්තෘ
බෞද්ධ පත්‍ර කලා විශාරද
**සීසර් සුදුසිංහ**



# කඩවත ගල්ඒදණ්ඩ රාජ මහා විහාරය

අතීතයේ දී, ගල්කණු පෙළක් මත ඉදිකරන ලද ඒදණ්ඩකින් එගොඩව මෙම විහාරස්ථානය වෙත යා යුතුව තිබූ බැවින් එය ගල් ඒදණ්ඩ නම් වූ බව කියැවේ.

ක්‍රිස්තු පූර්ව තුන්වැනි සහ සතරවැනි සියවස්වලට අයත්, කාවන්තිස්ස රජු විසින් කරවූවා යැයි සැලකෙන මෙම රාජමහා විහාරය සියනෑ කෝරළයේ පිහිටි අතිශය වැදගත් විහාරස්ථානයකි. එම භූමියෙන් හමු වූ සඳකඩ පහනක නටබුන් අද ද එහි දැකිය හැකි ය. ගල්කණු අනුරාධපුර කලා සම්ප්‍රදායට නෑකම් කියන බව හෙළි වී ඇත. ඉන් පසුව වසර සිය ගණනක් තුළ වළගම්බා රජු සහ හයවැනි පරාක්‍රම රජු, සහ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අතින් ද මෙම විහාරස්ථානය ප්‍රතිසංස්කරණය කෙරුණේ යැයි විශ්වාස කෙරේ.

දීර්ඝ කාලයක් තිස්සේ විහාරාධිපතිව වැඩ විසූ රාජකීය පණ්ඩිත ශාස්ත්‍රවේදී නාරන්දෙනියේ ප්‍රඥාරාම හිමිපාණන් වහන්සේ මෙම විහාර භූමියේ ප්‍රගතිය උදෙසා කළ මෙහෙවර ඉමහති. වර්තමාන විහාරාධිපතිව වැඩ වසන්නේ ගිරුවාපත්තුව, මාතර, හම්බන්තොට දෙදිසාවෙහි ප්‍රධාන සංඝනායක උල්ලල චන්ද්‍රිම හිමියෝ ය.

වත්මන් විහාරාධිකාරී නියෝජ්‍ය පරිවේණාධිපති ශාස්ත්‍රපති යටිගල රතනවංශ හිමියෝ ප්‍රදේශවාසීන්ගේ මහත් ගෞරවාදරයට පත්ව සිටිති. විහාර සංවර්ධනය උදෙසා විහාරාධිකාරී හිමිපාණන් වහන්සේගේ නවතම ව්‍යාපෘතිය මේ දිනවල ක්‍රියාත්මක කෙරෙමින් පවතී. ඒ විහාරය ආශ්‍රිතව භික්ෂු මධ්‍යස්ථානයක් පිහිටුවීම යි. එය නිර්මාණය කෙරෙනුයේ අධ්‍යාපනික පුහුණුව ලබන ස්වාමීන් වහන්සේට සුදුසු ආගමික ආයතනයක් ලෙස ය.

**සුනිලා විජේසිංහ**
**පහළ කරගහමුණ, කඩවත**

# බලු කපුටු දානයත් සැප විපාක ලැබෙන පින්කමක්

වාරියපොල, කොළඹගම ශ්‍රී මියුගුණාරාම රාජමහා විහාරාධිකාරී, නේපාලයේ ලුම්බිණි නුවර ශ්‍රී ලංකා මහා විහාරයේ විහාරාධිපති විචිත්‍රභාණී,

ආචාර්ය ගල්ලැහැපිටියේ පේමරතන හිමි



**දානය කියා කියූ සැණින් අපට සිහියට එන්නේ මහා සංඝරත්නය උදෙසා දෙන සාංඝික දානය යි. එහෙත් බුද්ධ ශාසනයේ දී විවිධ අයුරින් දානය විග්‍රහ වෙනවා.**

මරණයට කැප වූ සතුන්ට ජීවිත දානය දෙනවා. ඒ අභය දානය යි. තව පිරිසක් සතුන් කෙරෙහි මහත් අනුකම්පාවෙන් ඔවුන්ට කෑමබීම දෙනවා. ඇතැම් අය වැඩිහිටි, ළමා නිවාසවලට ආහාර දෙනවා. එයත් දානයක්. ඒ අතර මංමාවත්වල සිටින සුනඛයන්, කපුටන් ආදී සතුන් උදෙසා බලුකපුටු දානය දෙනවා. දෙනු ලබන දාන අතරින් බලුකපුටු දානයේ අනුසස් තිබෙනවා ද? මෙම් ඒ පිළිබඳව කළ සාකච්ඡාවකි.

***පින්වත් ස්වාමින් වහන්ස, ජාති, ආගම්, කුල භේදයකින් තොරව බොහෝ දෙනා බලුකපුටු දානය දෙනවා. ඒ දානයෙන් අපට රැස්වෙන්නේ කෙබඳු පිනක් ද?***

බුදුරජාණන් වහන්සේ ලෝකයාට මහත් අනුකම්පා සහගතයි. උන්වහන්සේ වදාළා පින්වත් මහණෙනි, මම තරම් දන් දීමේ විපාක දන්නා කෙනකු ලෝකයේ ඉන්නවා නම් කෑමට ගත් බත්පතේ අවසාන බත් කට හෝ තව කෙනකුට නොදී අනුභව කරන්නේ නෑ.කියලා. ලොවුතුරා බුදුරජාණන් වහන්සේ නමක් එසේ වදාළේ උන්වහන්සේ ගේ විශ්මිත අවබෝධයෙන්. රහසින්වත් සැක සහිත දෙයක් උන්වහන්සේ වදාළේ නැහැ. දානය කියන දේ භාග්‍යවතුන් වහන්සේ වර්ණනා කළා.

උන්වහන්සේ බොසත් අවධියේ දානය දෙද්දී ගුණවතුන් පමණක් තෝරා ගන්නේ නැහැ. දෙන්නට යමක් තිබුණා නම්, ලබා ගන්න කෙනකු සිටියා නම් තිබෙන දේ සතුටින් පූජා කළා .දාන පාරමිතාව ලෙස,

උදාහරණයක් ලෙස බෝසත් අවධියේ වෙස්සන්තර ආත්මයේ තමාගේ ලෙයින් උපන් දරු දෙදෙනා වූ ජාලිය ක්‍රිෂ්ණාජිනා දන් දුන්නේ කිසිදු සීලයක්, ගුණයක්, තෙතමනයක් නැති නන්නාඳුනන බ්‍රාහ්මණයකුට යි. සීලයක් ගුණයක් නැති පුද්ගලයකුට දරුවන් දුන්නායි කියලා උන්වහන්සේගේ විශ්මිත අවබෝධයට, ලොව්තුරා බුදු බවට එය ගැටලුවක් වූයේ නැහැ. එනිසා දානය කියන්නේ ගුණවතුන් පමණක් තෝරාගෙන දෙන දෙයක් නොවේ. දෙන්නට යමක් තිබෙනවා නම් ලබා ගන්නට කෙනෙක් ඉන්නවා නම් එය ලබාදීම දානය යි.

අපි දන්නවා පසුගිය කොවිඩ් වසංගත කාලයේ මිනිසුන්ගේ ජන ජීවිතය ඉතා වේගයෙන් අකර්මණ්‍ය වුණා. කුසට අහරක් නැතිව ඇතැම් දෙනාට කුසගින්නේ ඉන්න වුණා. එහෙත් අප රටේ කිසිදු කෙනකු හාමතේ මිය ගියේ නැහැ. ඒ අපි සංසාරයේ දන් දීපු ජාතියක් නිසා. එදා අවුරුදු දෙකක් නගර වසා තිබුණා. ඒ කාලයේ මංමාවත්වල සිටිය සුනඛයන්, බළලුන්, කුරුල්ලන් වගේ සතුන් ඉතා අසරණ වුණා. ඒ සතුන්ට දින ගණන් ආහාරයක් ලැබුණේ නැහැ. ඒත් අපේ රටේ පින්වත් දුවලා, පුතාලා ගමක්, නගරයක් පාසා හන්දිවල බලුකපුටු දාන දුන්නා.



භාග්‍යවතුන් වහන්සේ වදාළා බත්පතේ ඉතුරුවන කෑම ටික සතකුට ආහාරය පිණිස දුන්නොත් ඒ දුන්නා වගේ සිය ගුණයක් ලැබෙනවා කියලා. ඒක බුද්ධ වචනයක්. ඒ නිසා බලුකපුටු දානය සැප විපාක ලබා දෙන පින්කමක්.

බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි මේ සංසාරයේ අම්මා, තාත්තා නොවූ කෙනෙක්. බිරිඳක්, සැමියෙක්, දරුවෙක්, සහෝදරයෙක්, සහෝදරියක් නොවූ කෙනෙක් මේ ලෝකයේ නැහැ. එහෙම නම් මේ කපුටු, බළල්, කුරුල්ලන්, සුනඛයන් ආදි මේ සියලුම සතුන් මේ සංසාරේ කවදා හරි ආත්මයක අපට කිරි දුන් අම්මා වෙන්න පුළුවන්. දහඩිය හෙලා පෝෂණය කළ තාත්තා වෙන්න පුළුවන්. ආදරේ කළ බිරිඳ, ස්වාමියා, දරුවා වෙන්න පුළුවන්. එක කුසේ උපන් සහෝදරයා, සහෝදරිය වෙන්න පුළුවන්. ඒ අය කවුද කියලා අපට හඳුනා ගන්න බැහැ. ඒ අය තිරිසන් ආත්මයේ, එනිසා බුද්ධ වචනය විශ්වාස කරන්න. බලු කපුටු දානයක් දුන්නත් කල්ප ගණනක් ඔබට සැප විපාක ලැබෙනවා ම යි. බලුකපුටු දානය අනන්ත පින් සිදුවන දානයක්.

***තිරිසන් සතෙක් මියගිය පසු සමහර පිරිස් ඒ සතාට දානයක් දී පින් පෙත් අනුමෝදන් කරනවා. ඒ පින මියගිය සතාට ලැබෙනවා ද?***

බොහෝ නිවෙස්වල තිරිසන් සතුන්ට. දරුවන්ට වගේ ආදරය කරනවා. සලකනවා. ලෙඩට, දුකට පිහිට වෙනවා. එසේ සෙනෙහසින් හදා වඩා ගන්නා ඒ සතා මරණයට පත් වුණාම ඒ උදවිය බොහෝ සේ කම්පාවට පත් වෙනවා. අපි ඇතැම් මාධ්‍යවල දුටුවා නිවසේ සුරතලයට හදාවඩාගත් සුනඛයා මියගියාම නිවැසියෝ ස්වාමින් වහන්සේ වැඩස කරවගෙන පාංශුකූලය දී පින්පෙත් අනුමෝදන් කරනවා.

එය මේ වගේ තේරුම් ගන්න. එදා බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයේ තෝදෙය්‍ය කියලා මහා සිටුවරයෙක් වාසය කළා. ඔහු ඉතා ධනවත් පරම්පරාවෙන් එන කෙනෙක්. පරම්පරා හතක ධනය ඔහුට තිබුණා. එහෙත් කවදාවත් දානයක් දුන්නේ නැහැ. බණ පදයක් ඇසුවේ නැහැ. ස්වාමින් වහන්සේ නමකට වන්දනාමාන කළෙත් නැහැ. තණ්හාවෙන් ජීවත්වෙලා මියගියා. ඔහු සිටු නිවසේ සිටි බැල්ලකගේ කුසේ පිළිසිඳ ගත්තා. භාග්‍යවතුන් වහන්සේ මේ සියල්ල ම දිවැසින් දුටුවා.

සිටුවරයාට එක පුතෙක් සිටියා. ඔහු මේ උපන් සුනඛ පැටියාට බොහෝ සෙනෙහෙවන්තයි. මේ කවුද කියා සිටු පුතාට තහවුරු කිරීමට දිනක් භාග්‍යවතුන් වහන්සේ සිටු මාලිගය අසලින් වැඩියා. භාග්‍යවතුන් වහන්සේ දුටු පැටියා බුරාගෙන ඉදිරියට පැන්නා. භාග්‍යවතුන් වහන්සේ වදාළා තෝදෙය්‍ය නුඹ පෙරදීත් මට නින්දා අපහාස කළා. අදත් මට බුරනවා නේද කියලා. තෝදෙය්‍ය නාමය ඇසුණු ගමන් මේ පැටවා කන් කඩාගෙන, වලිගය හකුලාගෙන ගොස් ලිප් බොක්කේ අළු උඩ ලැග්ගා. වෙනදාට සුවපහසු ආසනවල සැතපුණු මේ සුනඛ පැටවා අද ලිප් බොක්කේ ගුලිවෙලා හිටියා. සවස සිටු පුත්‍රයා නිවසට පැමිණ පැටියා ගැන විපරම් කළ විට සේවකයෝ දවල් කාලයේ සිදු වු සියලු දේ කියා සිටියා. සුනඛයාට තම පියාගේ නම කිව්වා කියා ඇසුණාම සිටු පුතා කිපුණා. වහා ජේතවනාරාමයට ගියා

"ස්වාමීනි ඔබ වහන්සේ අපේ සුරතලාට මගේ පියාගේ නම කියලා කතා කළේ ඇයි?"

"සිටු පුත්‍රය, ඒ සුරතලා පෙර භවයේ ඔබේ පියා නිස යි." "ඔබ වහන්සේ ඒක ඔප්පු කරන්නේ කොහොම ද?"

"පුත්‍රය, ඔබ ඔය පැටියා පිරිසුදු කරලා දිය නො මුසු කිරිබතක් කවන්න. හිස අතගාමින් ඉන්න. නින්ද යාගෙන එද්දී අහන්න තාත්තේ, ඔබ අපට නොදුන් දෙයක් තිබෙනවා ද? කියලා.

සිටු පුතා සියල්ල එලෙසම කළා. ඒ මොහොතේ සුරතල් සුනඛ පැටවා වත්ත කෙළවරට ගොස් එක් ස්ථානයක පහුරු ගෑවා. එතැන හාරා බලද්දී රන් මිරිවැඩි සඟල, රන් හැරමිටිය,රන් පිඟාන ආදිය තිබුණා. සිටු පුතා මහත් දුකට පත් වුණා. මගේ පියාට මෙතරම් ධනයක් තිබිලත් තිරිසන් ලෝකයේ ඉපදුණා කියා කම්පාවට පත්ව ඔහු සතු ධනය එදා පටන් දන් දීමට පුරුදු වුණා.

එදා භාග්‍යවතුන් වහන්සේ සිටු පුතාට කිව්වේ නැහැ. ඔබගේ පියා තිරිසන් ලෝකයේ ඉපදුණේ පැන් වඩලා පින් අනුමෝදන් කරන්න කියලා. සිටුපුතා එහෙම කරන්න හිතුවෙත් නැහැ. පියා තිරිසන් ලෝකයේ ඉපදුණ බව දැන දැනත් එහෙම ඉල්ලීමක් එතැන කෙරුණෙත් නැහැ. තිරිසන් සතාට මොන ආකාරයේ පිනක් කරලා අනුමෝදන් කළත් ඒ පින අනුමෝදන් කරන්න බැහැ.

ධර්මයට අනුව නම් මියගිය තිරිසන් සතාට පින් අනුමෝදන් වෙන්න බැහැ.

***මිය ගිය සුරතල් සතා වෙනුවෙන් අපි යම් පිනක් කළොත්, පින ඒ සතාට අනුමෝදන් වෙන්නේ නැතිනම් ඒ පිනට මොකද වෙන්නේ?***

අපි ශ්‍රමය, ධනය, කාලය වැය කරලා මිය ගිය සෙනෙහෙවන්තයන්ට පින් අනුමෝදන් කරනවා. එහෙත් ඒ පින ඒ අයට ගන්න බැරි නම් භාග්‍යවතුන් වහන්සේ වදාළා සම්පූර්ණයෙන් ම ඒ පින පින්කම කළ අයට අනුමෝදන් වෙනවා. ඒ විශ්වාසයෙන් අපි පින්කම් කළ යුතුයි.

සමහරු අහසේ පියාසරන කුරුල්ලන් දෙස බලා හිතනවා අනේ මටත් කුරුල්ලෙක් වෙලා මෙහෙම පියාඹලා සැහැල්ලුවෙන් ඉන්න පුළුවන්නම් කොතරම් හොඳ ද? කියා. බොළඳ ප්‍රාර්ථනා කරනවා. ධර්මය පිළිබඳ, බුද්ධ වචනය මාත්‍රයක් දන්න කෙනකු ඒ වගේ පව්කාර ප්‍රාර්ථනයක් කරන්නේ නෑ. කුරුල්ලා කුඩා වුවත් කෙතරම් පව් කර ගන්නවා ද? ඔවුන් කෑමට ගන්නේ තවත් ප්‍රාණියෙක්. ඒ සතුන් දන්නේ නෑ තමන් කර ගන්නේ ප්‍රාණඝාතයක් කියලා. ඔවුන් නොදන කළත්, ජීවත්වීමට කළත් එයින් අකුසලයක් රැස් වෙනවා. ඒ ප්‍රාණඝාත අකුසලය. ඒ නිසා ඔබ කවදාවත් පින්කමක් කරලා බොළඳ ප්‍රාර්ථනා කරන්න එපා.

එනිසා පින්වතුනේ මේ සසර ඉතාමත් බියකරු යි. භාග්‍යවතුන් වහන්සේ වදාළා පින්වත් මහණෙනි, මා තරම් දන්දීමේ අනුසස් දන්නා තව කෙනකු නැහැ. දාන පාරමිතාව සත්‍ය යි. දානයේ ආනිශංස සත්‍යයි කියලා. පුළුවන් ආකාරයට ඔබත් දන් දෙන්න පුරුදු වෙන්න.

නයනා නිල්මිණී

**සිල්වත් යැයි කියන පුද්ගලයෙක් අනුන්ගේ දොස් කියයි නම් ඔහුගෙන් පරිස්සම් වන්න**

# මකුරුප්පේ සෝමාලංකාර නාහිමිපාණෝ

## අනුනායක පදවි ලබති



මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝසභාවේ විසි දෙවැනි අනුනායක පදවියෙන් සම්ප්‍රසාදිත රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති මකුරුප්පේ සෝමාලංකාර නාහිමිපාණන් වහන්සේ වෙත ශ්‍රී සන්නස්පත්‍ර ප්‍රදානෝත්සවය මාර්තු මස 18 වැනි දින සිදු කිරීමට නියමිත ය.

මකුරුප්පේ සෝමාලංකාර අනුනාහිමිපාණන් වහන්සේ වර්ෂ 1960 ජූනි මස 15 වැනි දින කන්ද උඩරට නුවර එළිය දිස්ත්‍රික්කයේ කොහොන කෝරළයේ දියතිලක පත්තුවේ මකුරුප්ප ග්‍රාමයේ දී උපත ලැබූහ.

පුරාකෘත පුණ්‍ය මහිමය හේතුවෙන් වර්ෂ 1974 ජූනි මස 26 වන දින හඟුරන්කෙත වදවල ශ්‍රී විමලාරාමයේ දී රාජකීය පණ්ඩිත හඟුරන්කෙත විමල අනුනාහිමි, රඹුක්වැල්ලේ සෝරත අනුනාහිමි සහ හඟුරන්කෙත ඤාණාලෝක නාහිමි යන ආචාර්යයන් වහන්සේලාගේ ශිෂ්‍ය පුත්‍රයකු වශයෙන් ප්‍රව්‍රජ්‍යා සම්පත් ලැබූහ.

1980 ජූනි මස 17 වැනි දින කෝට්ටේ රාජමහා විහාරස්ථ සිරි මංගල උපෝසථාගාරයේ දී අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලැබූහ.

කැලණිය විශ්වවිද්‍යාලයෙන් 1984 වර්ෂයේ දී ශාස්ත්‍රවේදී උපාධිය ලබා 1985 සිට රත්නපුර පනාමුර පර්ෂද විද්‍යාලයෙන් ගුරු සේවයට එක් වූ අනුනාහිමිපාණෝ අනුක්‍රමිකව රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති උපාධි සහ අධ්‍යාපන ඩිප්ලෝමා, ජපන්භාෂා ඩිප්ලෝමා, විදුහල්පති ශ්‍රේණි විභාග ආදිය සම්පූර්ණ කළහ. විදුහල්පති හිමියන් ලෙස වසර ගණනාවක් සේවය කොට 2020 වර්ෂයේ විශ්‍රාම ලැබූහ. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ දහම් සරසවි පාඨමාලාවේ කථිකාචාර්ය හිමිනමක වශයෙන් ද කටයුතු කොට තිබේ.

31 වැනි වියෙහි දී අරුක්ගොඩ ඉන්ද්‍රසරාරාම විහාර පාර්ශ්වය නියෝජනය කරමින් කර්මවාගාචාර්යයන් වහන්සේ නමක වශයෙන් කෝට්ටේ සංඝ සභාවෙහි උපසම්පදා කාරක සභාවට පත් වී 2006 වර්ෂයේ දී ජ්‍යෙෂ්ඨ කර්ම වාගාචාර්ය ධුරයට පත්ව 2011 වර්ෂයේ සිට මේ දක්වා උපසම්පදා ලේඛකාධිකාරී හිමියන් වශයෙන් කටයුතු කරන සේක.

අභිනව අනුනාහිමිපාණන් වහන්සේ වෙත ශ්‍රී සන්නස්පත්‍ර ප්‍රදානෝත්සවය මාර්තු මස 18 වැනි ශනි දින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රාජමහා විහාරස්ථ සිරි මංගල උපෝසථාගාරයේ දී අතිපූජ්‍ය ඉත්තෑපාන ධම්මාලංකාර මහ නාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සහ ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේතුමන් ඇතුළු සම්භාවනීය ප්‍රභූන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන අතර අභිනව අනුනාහිමිපාණන් වහන්සේ වෙත අභිනන්දන උත්සවය 19 වැනි ඉරු දින ත්‍රෛයිනිකායික ගරුතර මහා සංඝරත්නයේ සහ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු අග්‍රවිනිශ්චයකාරතුමාගේ සහභාගීත්වයෙන් කිඳෙල්පිටියේ ශ්‍රී මහා චෛතියාරාමයේ දී පැවැත්වේ. 19 වන දින රාත්‍රියේ හෙරළියාවල සුධර්මාරාමයේ දී රාත්‍රී සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක් පවත්වා 20 වැනි දින දහවල් සංඝගත දක්ෂිණාවක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කොට ඇත.

නිරහංකාර සංඝශෝභන ගුණයන්ගෙන් යුත් අභිනව අනුනාහිමිපාණන් වහන්සේ ලෝක ශාසනාභිවෘද්ධිය පිණිස කටයුතු කිරීමට ආයු ආරෝග්‍යාදී සම්පත් සකලාභිවෘද්ධිසාධනය වේවා'යි ප්‍රාර්ථනා කොට සිටිමු.

✍ **දිමුතු පුන්සර කොළඹගේ**

# මාතර හම්බන්තර දේදිසාවේ සංඝනායක පදවි ලබන

## දෙබොක්කාවේ රතනසිරි නාහිමි



මහනුවර උපෝෂිත පුෂ්පාරාම විහාරද්වයාධිපති අතිපූජ්‍ය ශ්‍රීමත් මහා නායක ස්වාමීන්ද්‍රවර ප්‍රමුඛ සානුනායක කාරක සංඝසභාව මඟින් හක්මණ ගංගොඩගම ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරාධිපති, විශ්‍රාමලත් විදුහල්පති, ශාස්ත්‍රපති දෙබොක්කාවේ රතනසිරි නාහිමිපාණන් වහන්සේ වෙත මාතර හම්බන්තර දේදිසාවේ සංඝනායක පදවිය පිරිනමා තිබේ. ඒ පිළිබඳ ශ්‍රී සන්නස්පත්‍ර ප්‍රදානෝත්සවය මාර්තු 15 වැනි දින පස්වරු 2.30 ට මහනුවර මල්වතු මහා විහාරයේ රාජාධි රාජපූජිත මංගලෝපෝසථාගාරයේ දී සිදු කෙරේ.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල දෙබොක්කාව ග්‍රාමයේ දී ජයලත් කඩුපිටි ආරච්චිගේ දොන් ගුණපාල නමින් 1952 ඔක්තෝබර් මස 28 වැනි දින උපත ලද නාහිමිපාණන් වහන්සේ 1967 මාර්තු 22 වැනි දින ගංගොඩගම සුදර්ශනාරාමාධිපති පල්ලත්තර පඤ්ඤතිස්ස මාහිමියන්ගේ ආචාර්යත්වයෙන් පැවිදි බිමට පත්ව 1975 ජූනි 13 දින මහනුවර මල්වතු මහා විහාරයේ දී උපසම්පදාව ලැබූහ.

පැපිලියාන සුනේත්‍රාදේවි පිරිවෙන හා මාතර සුදර්ශී පිරිවෙනින් අධ්‍යාපනය ලබා කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව සිංහල විශේෂවේදී උපාධිය ලබා ඉන්පසු ශාස්ත්‍රපති උපාධියත් ලබා අධ්‍යාපන කටයුතු නිමා කළහ.

අධ්‍යාපනය ලබා ගුරු සේවයට පිවිස ස්වකීය කල්‍යාණමිත්‍ර කතරගම අභිනවාරාමාධිපති කපුගම සරණතිස්ස නාහිමියන්ගේ ඉල්ලීම පරිදි කතරගම ගෝතමීගම කනිටු විද්‍යාලයේ සහ සෙල්ලකතරගම මහා විද්‍යාලයේ ඉගැන්වීම් සිදු කොට 1989 දී හක්මණ කැබිලියපොල ශ්‍රී ගුණානන්ද විද්‍යාලයේ ආචාර්ය හිමිනමක වශයෙන් පත්වීම් ලබා අනුක්‍රමිකව එහි නියෝජ්‍ය විදුහල්පති ධුරය හොබවා විදුහල්පති ධුරයට ද පත්ව 2007 වර්ෂයේ විශ්‍රාම ලැබූහ.

කොළඹ ආනන්ද විද්‍යාලයේ සහකාර විදුහල්පති, ශාස්ත්‍රපති රම්මල ධම්මරක්ඛිත හිමි බොරලන්දේ ඉන්ද්‍රරතන සාමණේර හිමි, තිස්සමහාරාමයේ අනුරුද්ධ සාමණේර හිමි හා සීනිපැල්ලේ ධම්මානන්ද සාමණේර හිමි යන ශිෂ්‍ය හිමිවරුන් සම්බුද්ධ ශාසනයට දායාද කොට තිබේ. අවට විහාරස්ථාන සමග පැවැත්විය යුතු ශාසනික සබඳතා මැනවින් පවත්වා ගෙන යමින් හක්මණ ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී පදවිය ද හොබවන සේක.

මෙලෙස උභය ලෝක ශාසනාර්ථචර්යාවෙහි පිළිපන් බැවින් ප්‍රමෝද්‍යයට පත් මහනුවර උපෝෂිත පුෂ්පාරාම විහාරද්වයාධිපති අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ ශ්‍රීමත් මහා නායක ස්වාමීන්ද්‍රවර ප්‍රමුඛ සානුනායක කාරක මහා සංඝ සභාව මඟින් තලාවේ නන්දසාර නාහිමිපාණන් වහන්සේ අපවත් වීමෙන් පුරප්පාඩුව පැවති මාතර හම්බන්තර දේදිසාවේ සංඝ නායක පදවිය සද්ධර්ම කීර්ති ශ්‍රී පඤ්ඤතිස්ස ගෞරව නාමධෙය සහිතව දෙබොක්කාවේ රතනසිරි මාහිමිපාණන් වහන්සේ වෙත පිරිනමන ලදි.

ශ්‍රී සන්නස්පත්‍ර ප්‍රදානෝත්සවය 15 වැනි දින පැවැත්වීමෙන් අනතුරුව අභිනව නාහිමිපාණන් වහන්සේ පිළිගැනීමේ උත්සවයක් මාර්තු මස 19 වන ඉරු දින හක්මණ ලයනල් ජෝර්ජ් සේදර සෙනරත් ශ්‍රවණාගාරයේ දී දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක, අග්ගමහා පණ්ඩිත මැටරඹ හේමරතන නාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

ශාස්ත්‍රපති
**අතපත්තුකන්දේ ආනන්ද නාහිමි**

# දෙඩම්පහල සිරි සුගුණ නා හිමි



අහංගම, මිදිගම,ශාසනාවංසාරාමය, කුරුණෑගල, උහුමිය ලයනල් ද සොයිසාරාමය, මොරටුව කටුබැද්ද සොයිසාරාම මහා විහාරය, උතුර කළුතර පුලිනතලාරමය යන පංච මහා විහාරාධිපති හිටපු ගුරු උපදේශක, ශාස්ත්‍රපති දොඩම්පහල සිරි සුගුණ නා හිමියෝ අපවත් වී වදාළහ. උන් වහන්සේගේ අදාහන පුජෝත්සවය පසුගියදා (මාර්තු 01) මොරටුව, කටුබැද්ද සොයිසාරාම විහස්ථ භූමියේ දි සිදු කෙරිණි.

**බුදුගල ජිනවංස හිමි**

# කඩවත කිරිල්ලවල ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිවූ සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ

කොළඹ නුවර මහාමාර්ගයේ කඩවත නගරය පසුකොට කි.මී. 5ක් පමණ නුවර දෙසට යන විට හමුවන කිරිල්ලවල ප්‍රදේශයේ ඉඳිගහමුල මංසන්ධියෙන් උඩුපිල දෙසට කිලෝ මීටරයක් පමණ යන විට සුන්දර ගම්මානයක පිහිටි මෙම විහාරස්ථානය හමුවේ.

මෙම විහාරස්ථානයේ ආරම්භය 1900 වර්ෂය තෙක් දිවයන දිගු ඉතිහාසයකට හිමිකම කියන උතුම් පූජනීය ස්ථානයකින් බව ඓතිහාසික මූලාශ්‍රවලින් පෙන්වා දෙයි. අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ අංකුර බෝධීන් වහන්සේ නමක් රෝපණය කරමින් ආරම්භ කරන ලද විහාරස්ථානය අද වන විට මනරම් බුද්ධ මන්දිරය, ධාතු මන්දිරය, ධර්මශාලා ආදී සියලු විහාර අංගයන්ගෙන් සමන්විත වේ.

විහාරාධිපති ලෙස කටයුතු කරන මහර ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී ශාස්ත්‍රපති ඕනෑගම නන්දරතන හිමියෝ මෙම විහාරස්ථානයේ අභිවෘද්ධියට කටයුතු කරමින් සිටී. උන්වහන්සේගේ මූලිකත්වයෙන් පවත්වනු ලබන සිරි සිදුහත් දහම් පාසල ප්‍රදේශයේ දරු දැරියන්ගේ දහම් අධ්‍යාපනය වැඩිදියුණු කිරීමටත් සාරධර්ම ගුණධර්ම දියුණුකර ගැනීමටත් මහඟු පිටුබලයක් වී ඇත.

සෑම පොහොය දිනකම පවත්වනු ලබන සීල සමාදාන පින්කම සහ සෑම සතියක ම සෙනසුරාදා සහ පොහොය දිනයේ පවත්වනු ලබන දෙතිස් වෑංජන සහිත උතුම් බුද්ධ පූජා පින්කම ප්‍රදේශවාසී සැදැහැවතුන්ගේ ආධ්‍යාත්මය සංවර්ධනයට මහඟු මෙහෙයක් ඉටුකරනු ඇත.

**පාපකාරී ජීවිතයක් ගෙවන්නා ජීවත් වූ ව ද මළමිනියක් වැනි ය**

## සංකල්ප විහාරයේ මල් පූජා පින්කමක්

පිළියන්දල, මාකන්දන සංකල්ප විහාරයේ වාර්ෂිකව පැවැත්වෙන දස ලක්ෂයක් මල් පූජා කිරීමේ අසිරිමත් මල් පින්කම 30 වැනි වරටත් අප්‍රේල් පළමු වැනි දින පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඊට සමගාමීව පින්කම් මාලාවක් මාර්තු 28 දා සිට පැවැත්වීමට කටයුතු යොදා තිබෙන අතර අප්‍රේල් පළමුවැනි දින උදෑසන කිරි ආහාර පූජාව සහ සවස 6ට දස ලක්ෂයේ අසිරිමත් මල් පූජාව පැවැත්වේ. පින්කම මෙහෙයවීම බැරගම ඤාණසිරි හිමියන් විසින් ද විශේෂ අනුශාසනාව කැස්බෑවේ පඤ්ඤානන්ද හිමියන් විසින් ද සිදු කෙරේ. විහාරාධිපති උග්ගොඩ ධම්මින්ද හිමියන්ගේ අනුශාසනා පරිදි මෙම පින්කම සංවිධානය කර ඇත.

## යොවුන් දහම් සක්මන



විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් යහපත් අනාගතයක් ගොඩනඟනු වස් සිහින දකින වත්මන් තරුණ පරපුරට, යහපත අයහපත පෙන්වා දී සොඳුරු තාරුණ්‍යය දහම තුළින් සුවපත් කරනු පිණිස මහමෙව්නාව භාවනා අසපු සංචිතය සහ ශ්‍රද්ධා රූපවාහිනිය එක්ව සංවිධාන කළ 'යොවුන් දහම් සක්මන' සදහම් වැඩසටහන පෙබරවාරි 11 වැනි දින 10000කට අධික තරුණ පිරිසකගේ සහභාගිත්වයෙන් කුණ්ඩසාලේ මහමෙව්නාව භාවනා අසපුවේ දී අතිසාර්ථකව නිමාවට පත් විය. මහමෙව්නාව භාවනා අසපුවාසී ස්වාමින් වහන්සේගේ මෙහෙයවීමෙන් පැවැත්වුණු මෙම වැඩසටහන අඛණ්ඩව පැය 5කට ආසන්න කාලයක් පැවැත්විය. 2016 වසරේ සිට අඛණ්ඩව සිදුකරන යොවුන් දහම් සක්මන මෙවර මහනුවර කේන්ද්‍ර කර ගනිමින් කුණ්ඩසාල මහමෙව්නාව අසපුවේ දී පැවැත්වීම සුවිශේෂී විය. දිවයිනේ විවිධ ප්‍රදේශවලින් පැමිණි තරුණ තරුණියන්ගෙන් පිරී ඉතිරී ගිය කුණ්ඩසාල අසපුව යහපත් අනාගතයක් වෙනුවෙන් සිහින දකින තාරුණ්‍යයට නිවැරැදි දැක්මක් එකතු කළේ ය.

## තලවතුගොඩ සංඝමිත්තාරාමය

තලවතුගොඩ,වැලිපාර සංඝමිත්තාරාමයේ මෙවර පෝදා සදහම් වැඩසටහන් මෙසේ ය. පෙරවරු 8.00 - 9.00 රාජකීය පණ්ඩිත හිඟුරේ ප්‍රඥාසේකර හිමි, 9.30 -10.30 රාජකීය පණ්ඩිත වේරදුවේ මහින්ද හිමි, 2.00 - 3.00 ගලතුරේ උත්තරා දසසිල් මාතාව, 4.00 - 5.00 දර්ශනපති – ගැමුණුපුර සෝමවංස හිමි.

# පෝදා පින්කම්

## මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය වැඩිහිටි සීල සමාදානය

පෙරවරු 6.00 - 7.00 සිල් සමාදන් කරවීම සහ බුද්ධ පූජාව ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත ගබ්බෙල වජිර හිමි, 8.00 - 9.00 භාවනාව රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති හක්මණ සුමනසිරි නාහිමි, 9.00 - 10.00 ධර්ම දේශනාව මොරටුව කටුබැද්ද ස්වර්ණ ශෛල බිම්බාරාම විහාරාධිපති ගෞරව ශාස්ත්‍රවේදී ගඟසිරිපුර ඤාණරතන හිමි, 10.00 - 11.00 සූත්‍ර දේශනාව රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පාණදුර පසන්න හිමි, 11.00 - 11.15 බුද්ධ පූජාව බුත්තල ධම්මවිජය හිමි කළුඅග්ගල විජිතධම්ම හිමි, පස්වරු 12.20 - 1.00 පිරිත් හා තෙරුවන් ගුණ ගලහිටියේ නාගිත හිමි, තලංගල්ලේ ධම්මදස්සි හිමි, 1.00 - 2.00 ධර්ම සාකච්ඡාව ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත වේරදූවේ මහින්ද හිමි, 2.00 - 3.00 ධර්ම දේශනය - කැබිතිගොල්ලෑව වාහලකඩ ශ්‍රී උත්තරාරාම විහාරාධිපති ත්‍රිපිටකාචාර්ය හඳපාන්ගොඩ ධම්මරංසි හිමි 3.00 - 3.45 ධර්ම දේශනාව කොබෙයිගනේ ධම්මදස්සි හිමි 4.00 - 5.00 ධර්ම දේශනාව ශාස්ත්‍රපති වැලිගෙපොල සීලවංස හිමි 5.00 - 6.00 ධම්ම පදය මීගොඩ ධම්මාවාස හිමි 6.00 - 6.30 බෝධි පූජාව සහ සිල් අලුත් කිරීම රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති හක්මන සුමනසිරි නාහිමි.

## මාවිත්තර සිරි තිසරණ ධර්මායතනය

පෙරවරු. 6.30 සිල් සමාදන් වීම, 7.00 උදෑසන සම්බුද්ධ පූජාව, 8.00 ධර්ම දේශනය ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත, පුලිකන්ඩිකුලමේ රතනසිරි හිමි, 9.00 සිට 11.00 දක්වා විශේෂ භාවනාව අභිධර්ම උපදේශක ඩිල්ෂාන් කරුණාරත්න මහතා, 11.15 දහවල් සම්බුද්ධ පූජාව, පස්වරු 1.00 ධර්ම දේශනය අතුරුගිරිය ආර්ය නිකේතන පරිවේණාධිපති, රාජකීය පණ්ඩිත, කැස්බෑවේ පඤ්ඤානන්ද හිමි, 2.30 විශේෂ ධර්ම දේශනය කොට්ටුන්න ධම්මදස්සි භාවනා මධ්‍යස්ථානාධිපති, ත්‍රිපිටකාචාර්ය, රාජකීය පණ්ඩිත, දොළොස්වල උදිතධීර හිමි, 4.00 ධර්ම දේශනාව කුරුණෑගල ධම්මවිමල හිමි, 5.00 ආශිර්වාද පිරිත් සජ්ඣායනාව, රාත්‍රී 6.30 විශේෂ බෝධි පූජා පින්කම මකුළුදූව විද්‍යාලයේ විදුහල්පති, ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත වෙහෙරගොඩ අමරසිරි හිමි.

## කොබවක ශ්‍රී සුමනාරාම මහා විහාරය

කොබවක ශ්‍රී සුමනාරාම මහා විහාරාධිපති, දෙල්මැල්ලේ සුමනරතන හිමියන්ගේ අනුශාසනා පරිදි පසළොස්වක පෝය දින කොබවක ශ්‍රී සුමනාරාම මහා විහාරස්ථානයේ දී පින්කම් රැසක් පැවැත්වේ.

පෙරවරු 08.30ට ධර්ම දේශනාව පවත්වනු ලබන්නේ වරකාගොඩ ගනේඋඩ පුරාණ රාජමහා විහාරාධිවාසී කිතුල්ගොඩ විමලබුද්ධි හිමි, 10.00 ට සදහම් වන්දනාව හා දහවල් සම්බුදු පූජා වන්දනාව හොරණ ශ්‍රී අනුලාරාමවාසී ආදළුවේ සුබෝධනී මෙහෙණින් වහන්සේ සවස 01.30ට භාවනාව ශාස්ත්‍රපතිනි වෑකඩ හද්‍රා මෙහෙණින් වහන්සේ.

## කල්‍යාණි රාජමහා විහාරය

පෙරවරු 06.00 - 6.30 සීල සමාදානය,6.30 -7.00 උදෑසන බුද්ධ පූජාව – ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරයේ කෘත්‍යාධිකාරි ශාස්ත්‍රවේදී රන්දිලිගම මහින්ද හිමි, 08.00 -9.00 භාවනාව ශ්‍රී කල්‍යාණි උභය රාජමහා විහාරාධිපති, කැලණිය විශ්වවිද්‍යාලයේ කුලපති අග්ගමහා පණ්ඩිත, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමි, 09.00 - 10.00 ධර්ම දේශනාව - කෙහෙල්වල නන්ද හිමි, 10.00 -11.00 ධම්ම පදයෙන් බිඳක් - අධ්‍යාපනපති කැලණියේ ශාසනවංශ හිමි,

පස්වරු 02.00 - 3.00 වෛද්‍ය දේශනය, 03.00 - 4.00 ධර්ම දේශනාව හීනැටිගල ඉන්ද්‍රවංශ හිමි, 04.00 - 5.00 ධර්ම දේශනාව - අධ්‍යාපනපති, කැලණියේ ශාසනවංශ හිමි, 05.00 - 6.00 භාවනාව මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමි, 06.00 -7.00 ගිලන්පස බුද්ධ පූජාව කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය දෙනියායේ පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත හිමි.

## මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය තරුණ සීල සමාදානය

පෙරවරු 06.00 -7.00 සිල් සමාදන් කරවීම, අනුශාසනාව හා බුද්ධ පූජාව පූජාපිටියේ සන්තුසිත හිමි, 8.00 -9.00 භාවනාව කොත්මලේ ඤාණවංස හිමි, 9.00 -10.00 ධර්ම දේශනාව, ශාස්ත්‍රපති තුම්බෝවිල ධම්මරතන නාහිමි, 10.00 -11.15 පරෝපකාර සංග්‍රහය – අනුශාසනාව හා බුද්ධ පූජාව , ශාස්ත්‍රපති පණ්ඩිත මහඔය අනුරුද්ධ හිමි,

පස්වරු 12.30 -1.00 පිරිත් හා තෙරුවන් ගුණ - අකුරැස්සේ ධම්මරතන හිමි, 1.00 -2.00 ධර්ම සාකච්ඡාව ගල්කිස්සේ සෝමානන්ද හිමි, 2.00 -3.00 වෙසෙසි දෙසුම , කැලණිය විශ්ව විද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තරිඳු ධනංජය මහතා, 03.00 -4.00 ධර්ම දේශනාව - දර්ශනපති පුස්සැල්ලායායේ චන්දිම හිමි, 4.15 -5.00 ධම්මපදය ශාස්ත්‍රපති පණ්ඩිත ගබ්බෙල වජිර හිමි, 5.00 -6.00 ධර්ම දේශනාව , දියතලාවේ පියදස්සි හිමි, 6.00 -6.30 බෝධි පූජාව ශාස්ත්‍රපති පණ්ඩිත හක්මන සුමනසිරි නාහිමි

## සිරි සුදස්සනාරාම සදහම් සෙනසුන

පෙරවරු 6.00 - 7.00 සීල සමාදානය හා අනුශාසනාව, 7.00 - 7.30 තෙරුවන් වන්දනාව, 8.15 - 10.00 භාවනාව 10.00 - 11.00 ධර්ම දේශනය, 11.00 - 11.30 තෙරුවන් වන්දනාව උදෑසන වැඩසටහන් මෙහෙයවීම ආචාර්ය මිරිස්සේ ධම්මික නා හිමියන් විසිනි.

පස්වරු 12.30 - 1.00 සූත්‍ර සජ්ඣායනය, 1.00 - 2.00 ධර්ම දේශනය පරාපාමුල්ලේ සිරිවිමල හිමි, 2.00 - 3.30 ධර්ම සාකච්ඡාව තලගල ධම්මගවේශී හිමි 4.00 - 5.00 ධර්ම දේශනය මොරාවත්තේ සුබෝධි හිමි.

## පිහිට පතයි

මාතර, ඌරුගමුව, මුරුතවල වත්ත,රන්නාවල පදිංචි ජී.ජී.නන්දසිරිගේ (60) වකුගඩු දෙකම අක්‍රිය වී ඇති බව කියයි. ඔහුගේ ජීවිතය සුරක්ෂිත කර ගැනීමට O+ වර්ගයේ වකුගඩුවක් පරිත්‍යාග කිරීමට කැමති පරිත්‍යාගශීලියකු වෙතොත් 071 -3968940 දුරකතනයට දැනුම් දෙන ලෙස කියයි. ප්‍රතිකාර කිරීමට මහජන බැංකුව වලස්ගල ශාඛාවේ ජී.ජී.නන්දසිරි නමින් ආරම්භ කොට ඇති අංක 304200120001795 ගිණුමට පරිත්‍යාග බැර කළ හැකි බවද කියයි.

---

කඩවත, ඉහළ කරගහමුණ පදිංචි බී.එම්. පූර්ණිමා (32) දරුණු වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඇයට O හෝ B පොසිටිව් වර්ගයේ වකුගඩුවක් පරිත්‍යාග කළ හැකි අයෙකු වේ නම් 0763627018 හෝ 0768506242 දුරකතනයට දැනුම් දෙන ලෙස ඉල්ලීමක් කරයි. මුදලින් ආධාර කිරීමට කැමැතිනම් ඉතිරි කිරීමේ බැංකුව – (කඩවත ශාඛාව) 100757713061 මුදල් බැර කළ හැකිය. වැඩි විස්තර 0763627018 හෝ 0768506242 දුරකතනයෙන් විමසිය හැකි බවද කියයි.

---

ගම්පල පදිංචි පී.ජී.පත්මිණී යන අය දරුණු වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඇයට බී පොසිටිව් වර්ගයේ වකුගඩුවක් පරිත්‍යාග කළ හැකි අයෙකු වේ නම් 0812350681 හෝ 0770222586 දුරකතන අංකයෙන් විමසිය හැක.

---

වයස අවුරුදු 45ක් වන කේ.එම්.එන්.ප්‍රියදර්ශනී යන අය වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. අසාද්‍ය තත්ත්වයේ පසුවන ඇයට හැකි ඉක්මනින් ඕ පොසිටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව වෛද්‍ය නිර්දේශය බවද කියයි.

එක් දරු මවක් වන ඇයට ප්‍රතිකාර සඳහා විශාල මුදලක් වැයවන බව ද ලංකා බැංකුව, බටුවත්ත ශාඛාවේ, ගිණුම් අංක 74529247 දරණ ගිණුමට මුදල් පරිත්‍යාග කළ හැකි බව ද කියයි. වකුගඩුවක් පරිත්‍යාග කිරීමට කැමති අයකු වේ නම් 0764386965 අංකයට දැනුම් දෙන ලෙස ඉල්ලා සිටියි.

## සසුන් කෙත පොබ කළ

# වල්ගොව්වාගොඩ ශ්‍රී මේධංකර විමලබුද්ධි නා හිමි

1941 සැප්තැම්බර් මස 17 වැනි දින මහනුවර දී ජන්ම ලාභය ලද අප නාහිමිපාණන් වහන්සේගේ ගිහි නාමය දුනුවිල මුදියන්සේලාගේ ටිකිරි බණ්ඩා විය.

1956 පෙබරවාරි 16 වැනි දින වල්ගොව්වාගොඩ ශ්‍රී ජිනරතන සහ මල්වතු මහා විහාරයීය ලේඛකාධිකාරි යටිගම්මන ශ්‍රී මේධංකර විමලඥාන යන නා හිමිවරු ගුරු කොට මෙයියාගොඩ විහාරස්ථානයේ දී පැවිදි බිමට පත් විය.

වර්ෂ 1986 දී මල්වතු මහා විහාරයීය විස්සත්වර්ගික කාරක මහා සංඝ සභාවේ සභික ධුරයට පත් වල්ගොව්වාගොඩ ශ්‍රී මේධංකර විමලබුද්ධි නා හිමියෝ 1992 දී මහනුවර ශ්‍රී සංඝරාජ පිරිවෙනේ පරිවේණාධිපති ධුරයට පත් වූහ.

වර්ෂ 2004 ඔක්තෝබර් 23 වන දින මල්වතු පාර්ශ්වයේ මහා ලේඛකාධිකාරි ධුරයට පත්වන අප නා හිමියන් 2008 වර්ෂයේ දී මහනුවර ඓතිහාසික ශ්‍රී දළදා මාළිගාවේ තේවා කටයුතු සඳහා සම්බන්ධ වීමට භාග්‍ය හිමිකර ගත්හ.

80 වසරක් ආයු වළඳා අපවත් වී වදාළ අප නාහිමිපාණන් වහන්සේට අජරාමර නිවන් සුව ප්‍රාර්ථනය කරමු.

**ආනන්ද විජේරත්න**

## ප්‍රධාන අධිකරණ සංඝනායක ධුරයෙන් පිදුම් ලබන

# පෑබොටුවේ අරියවිමල නාහිමි



මීගහතැන්න, වැල්මීගොඩ ශ්‍රී අභිනවාරාමාධිපති, මීගහතැන්න විද්‍යාරාම විද්‍යායතන පිරිවෙන් විශ්‍රාමලත් පරිවේණාධිපති, සාම විනිසුරු, ශාස්ත්‍රපති පෑබොටුවේ අරියවිමල නාහිමිපාණන් වහන්සේගේ ශාසනික, ආගමික, අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජීය මෙහෙවර අගය කරමින් අමරපුර සිරි සද්ධම්මවංශ මහා නිකාය මඟින් 'විනය කීර්ති ශ්‍රී විමලසාර වංසාවතංස' යන ගෞරව නාම සම්මුති සහිත 'පස්දුන් කෝරලයේ ප්‍රධාන අධිකරණ සංඝනායක' පදවියෙන් පිදුම් ලැබූහ.

**පැලවත්තේ සිරිසුගත හිමි**

# පල්ලේගම වංගීස නාහිමියෝ

## ප්‍රධාන සංඝනායක ධුර ලබති



තථාගත වචනය අර්ථවත් කරමින් ධර්ම විනයෙහි සුශික්ෂිත, ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත, ධර්ම ධර භික්ෂුවක් ලෙස දර්ශනපති පල්ලේගම වංගීස නාහිමියන්ගේ ආගමික, ශාසනික හා ශාස්ත්‍රීය සේවාවන් අගයමින් මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශවීය මහා නායක අතිගරු තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානායක මාහිමිපාණන් විසින් පසුගිය මස 05 වැනි සඳු දින ශාසන කීර්ති ශ්‍රී ජිනරතන සද්ධර්ම වාගීශ්වර යන ගෞරවනාම සම්මුතිය සහිත රුහුණු මාගම්පත්තුව ඇතුලු ගිරුවාගම් දොළොස් දහස්රට ප්‍රධාන සංඝනායක ධුරය උන්වහන්සේට පිරිනමා ඇත.

**නරවැල්පිට වජිරබුද්ධි හිමි**

# වේපතගුර ගුණරතන හිමියෝ

## ප්‍රධාන අධිකරණ සංඝනායක පදවි ලබති



මහනුවර උපෝෂිත පුෂ්පාරාම විහාරද්වයාධිපති අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහානායක ස්වාමීන්ද්‍ර වරප්‍රමුඛ කාරක මහා සංඝ සභාව මඟින් මාතර අපරැක්ක ශ්‍රී මණිරතනාරාම පුරාණ විහාරාධිපති, හක්මණ පනන්වෙල ශ්‍රී විද්‍යාරාජ පරිවේණාධිපති, ශාස්ත්‍රපති වේපතගුර ගුණරතන නාහිමිපාණන් වහන්සේ වෙත කීර්ති ශ්‍රී චූලාලංකාර යන ගෞරව නාමය සහිතව ගිරුවාපත්තුව ඇතුළු මාතර හම්බන්තර දෙපළාතේ ප්‍රධාන අධිකරණ සංඝ නායක පදවිය පිරිනමා තිබේ.

ඒ පිළිබඳ ශ්‍රී සන්නස්පත්‍ර ප්‍රදානෝත්සවය මාර්තු 16 වැනි දින මල්වතු විහාරයේ දී සිදු කිරීමට නියමිත ය. අභිනව නාහිමිපාණන් වහන්සේ පිළිගැනීමේ උත්සවය මාර්තු 22 වැනි දින අපරැක්ක මණිරතනාරාමයේ දී නියංගොඩ විජිතසිරි අනුනාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සිදු කිරීමට නියමිත ය.

**අතපත්තුකන්දේ ආනන්ද නාහිමි**




# ගුණ සැමරුම් පින්කමක්

ඌවේ ස්‍යාමවංශික මහා නිකායේ ආදි කර්තෘවර බොරගොල්ලේ ශ්‍රී සෝමානන්ද මහ නාහිමි, තත් ශිෂ්‍ය අඹේවෙල පඤ්ඤාසාර මහ නාහිමි ඇතුළු ආදි කර්තෘවරුන් ගේ ගුණ සැමරුම් පින්කමක් පෙබරවාරි 25 - 26 - 27 දිනවල වැලිමඩ කැප්පෙටිපොළ පාලුගම ශ්‍රී සුභද්‍රාරාම මහා විහාරස්ථානයේ දී විල්ඔය පඤ්ඤාතිලක හිමියන්ගේ අනුශාසකත්වයෙන් පැවැත්විණි.

වර්ෂ 1956 එළඹි 2500 සම්බුද්ධ ජයන්ති සැමරුම් වැඩසටහන් සංවිධානය කළ අවධියේ පෙබරවාරි 25 වන දිනට එළඹි නවම් පුර පසළොස්වක පොහෝ දින මහානාහිමිපාණන් වහන්සේ අපවත් වී වදාළ සේක.

පාලුගම සුමනසාර මහනාහිමි , අඹේවෙල පඤ්ඤාසාර මහනාහිමි ඇතුළු ශිෂ්‍ය පුත්‍රාදීන් රැසක් සම්බුද්ධ ශාසනයට දායාද කළ මහා නාහිමිපාණන් වහන්සේට සහ තත්ශිෂ්‍ය පිරිසට නිවන් සුව පතමු.

**තුම්බෝවිල ධම්මරතන නාහිමි**

# බෝදාගම සීලවිමල හිමි



මාලඹේ සුසීලාරාම විහාරාධිකාරි සුසීලාරාම ශ්‍රී පඤ්ඤාතිස්ස දහම් පාසලේ ප්‍රධානාචාර්ය කොළඹ තර්ස්ටන් මහා විද්‍යාලයේ ධර්මාචාර්ය බෝදාගම සීලසුව අරණ ආශ්‍රමයේ අනුශාසක ශාස්ත්‍රපති බෝදාගම සීලවිමල ස්වාමීන්ද්‍රයන් වහන්සේ ලෝ සසුන් දෙකට අපරිමිත සේවාවන් ඉටුකරන සුපේශල ශික්ෂාකාමී බුද්ධ පුත්‍රයාණන් කෙනෙකි.

මෙම මස 18 වන දින 53 වැනි ජන්ම දිනය සමරනු ලබන උන්වහන්සේට ශාසනික, ආගමික, සමාජයීය, අධ්‍යාපනික ශාස්ත්‍රීය කටයුතුවල යෙදෙන්නට නිදුක් නිරෝගීභාවය හා ශක්තිය තෙරුවන් සරණින් ලැබේවායි ආශිංසනය කරමිහ.

**අත්තිඩියේ සුමේධ හිමි**


# ගල්ටැම්වත්තේ නන්දරතන නා හිමි සේවය ඇගයේ

ඓතිහාසික යුදගනා රාජමහා විහාරාධිපති රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ගල්ටැම්වත්තේ නන්දරතන ස්ථවිරපාදයන් වහන්සේ ඌව වෙල්ලස්ස දෙපළාතේ ප්‍රධාන සංඝ නායක පදවියෙන් පුද ලබා ඇත.

නන්දරතන නායක ස්ථවිරයන් වහන්සේගේ දැන උගත්කම් මෙන්ම විහාරස්ථානය මූලික කරගෙන සිදු කෙරෙන වාර්ෂික ඇසළ මහා පෙරහර මෙන්ම ශාසනික හා අධ්‍යාපනික මෙහෙවර අගය කළ මහනුවර අස්ගිරි මහා විහාර කාරක මහා සංඝ සභාව, ඌව වෙල්ලස්ස දෙපළාතේ ප්‍රධාන සංඝනායක පදවිය නන්දරතන ස්ථවිරයන් වහන්සේට පිරිනමා ඇත. මෙම ඓතිහාසික සංඝනායක පදවියෙන් පුද ලබන ධර්ම කීර්ති ශ්‍රී චන්ද්‍රජ්‍යොතිභිධාන රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ගල්ටැම්වත්තේ නන්දරතන නායක ස්ථවිරයන් වහන්සේට තෙරුවන් සරණ දෙවි රැකවරණ ලැබ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා ඌව වෙල්ලස්ස ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් සේවය කිරීමට නිරෝගී සුව හා දීර්ඝායුෂ ලැබේවා'යි ප්‍රාර්ථනා කරමු.

**මහාචාර්ය කුඹුරුගමුවේ වජිර නාහිමි**

# පන්විල විපස්සි නායක ස්වාමීන් වහන්සේගේ විසිපස්වන ගුණ සැමරුම



ආරෝග්‍යශාලා සේවාවේ නිර්මාතෘ අතිපූජ්‍ය පන්විල විපස්සි නායක ස්වාමීන් වහන්සේගේ 25 ගුණ සැමරුම් උළෙල පසුගියදා කොළඹ ජාතික රෝහලේ උතුම් පැතුම් බෝධීන් වහන්සේ අභියස දී සිදුවිය.

**සචින් දිල්රුවන්**

# කෙලෙස්වලින් සිත වැහුණොත් පිරිතේ සෙත ලැබිය නොහැකියි



**සිල්පද ආරක්ෂා කිරීම, ගුණධර්ම දියුණු කිරීම, තෙරුවන් සරණේ පිහිටා පින් කිරීම, යහපත් දේ ජීවිතයට හුරු කිරීම ලෙහෙසි දෙයක් නොවේ. බොහෝම දුෂ්කර දෙයක්. ඒ සඳහා පෙනෙන වගේ ම නොපෙනෙන ලෝකවලත් බාධා පවතිනවා. මේ බාධා මැඬගෙන අපේ ජීවිතවලට ගුණධර්ම දියුණු කර ගන්නට විශාල ලෙස උපකාරී වෙනවා දෙවියන්ගේ ආශිර්වාදය. දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගැනීමට ඒ වගේම උපකාරයි පිරිත් සජ්ඣායනාව. නිවැරැදිව පිරිත් සජ්ඣායනාව කළ යුත්තේ කෙසේද? යන්න පිළිබඳ මහමෙව්නාව භාවනා අසපුවාසී අංකුඹුරේ අමිතදීප හිමි සමඟ කළ සාකච්ඡාවකි.**



***පින්වත් ස්වාමින් වහන්ස,පිරිතෙහි ආශිර්වාදය ලැබෙන්නට නම් පිරිත තමා විසින් ම සජ්ඣායනා කරන්න ඕනෑ කියා අප අසා තිබෙනවා. ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.***

සමාදන් වූ සිල්පද ආරක්ෂා කිරීම, තෙරුවණේ පිහිටීම, පිරිත් සජ්ඣායනාව ආදී යහපත පිණිස ජීවිතය හැඩ ගස්වා ගැනීමේ දී අපට බොහෝ සේ උපකාරී වනවා දෙවියන්ගේ ආශිර්වාදය. ඒ වගේම තමා රැස්කර ගෙන තිබෙන පින. එනිසා බාධා කරදර මැඬගෙන අපේ ගුණධර්ම දියුණු කර ගන්නට නම් අපි නිතරම ඉදිරියට ගත යුත්තේ පින යි. එවිටයි නොපෙනෙන ලෝකයේ ආශිර්වාදය ලබා ගත හැකිවන්නේ. පිරිත් සජ්ඣායනාවට කැමැති ඔබ මේ වැඩපිළිවෙල ජීවිතයට හුරුකර ගන්න.

පිරිත තමා විසින් ම සජ්ඣායනා කරද්දී තමාට පිරිත ඇහෙනවා. ඒ වගේම පිරිත කියාගෙන යද්දී දිව වියැළෙනවා. පිරිතේ ඇති ධර්මයට අනුකූලව තමාගේ හිත වෙනස් වෙනවා. වෙන අරමුණක් සිතමින්, වෙන වැඩක යෙදෙමින් ඔබට බැහැ පිරිත් සජ්ඣායනා කරන්න. පිරිත් කියන අවස්ථාවේ දී පිරිතට ම අවධානය යොමු වෙනවා. පිරිතෙන් සිත පිරී යනවා. ඒ වගේම පිරිත සජ්ඣායනා කරද්දී උගුර ආතුර වෙනවා. මෙසේ පිරිත් සජ්ඣායනා කරන කාලය තුළ දී ඔබට තිබෙනවා නම් යම් රෝගාබාධයක්, කරදරයක්, උපද්‍රවයක්, අන්තරාවක්, අමනුෂ්‍ය දෝෂයක් ඒවා දුරු වෙන්න උපකාරී වෙනවා. ඒක මේ වගේ දෙයක්.

විසක් කැවුණු කෙනකුට වමනය යාමට හෝ විරේකවීමට බෙහෙතක් දෙනවා. ඒ අවස්ථාවේ දී විරේකවීම හෝ වමනය යාම ලෙහෙසි දෙයක් නොවේ. හැබැයි ඒ විරේකයෙන් හෝ වමනය නිසා විස නැසී යනවා. ඒ වගේ තමාම හඬ නඟා පිරිත් සජ්ඣායනා කිරීම තුළින් තමාගේ උවදුරු පහවෙලා යනවා. පිරිත සජ්ඣායනා කරද්දී පිරිතෙන් සෙත සැලසෙනවා. තමා පිරිත කියනා විට පිරිතේ පරිත්‍රානුභාවය ජීවිතයට ළං වෙනවා.

***ස්වාමීන් වහන්ස, පරිත්‍රානුභාවය කියන්නේ කුමක් ද?***

ධර්මයේ පරිත්‍රානුභාවය විස්තර වන්නේ මේ ආකාරයට යි. පිරිත් සජ්ඣායනා කරද්දී එහි බුදුගුණ කියැවෙනවා. බුද්ධානුභාවය ලැබෙනවා.

පිරිත තුළ ධර්මයේ ගුණ කියැවෙනවා. එවිට ධම්මානුභාවය ලැබෙනවා.

පිරිත තුළ සංඝරත්නයේ ගුණ කියැවෙනවා. එවිට සංඝානුභාවය ලැබෙනවා.

පිරිත කියන්නේ සත්‍ය වචනයක්. ඒ නිසා ම සත්‍යානුභාවය ලැබෙනවා.

පිරිත කියන්නේ පින් වැඩෙන වචනයක්. ඒ නිසා පුණ්‍යානුභාවය ලැබෙනවා.

පිරිත කියන්නේ කුසලයක්. එයින් කුසලානුභාවය ලැබෙනවා.

පිරිතක් සජ්ඣායනා කරන විට සම්‍යක් දෘෂ්ඨික දෙවිවරු එයට ආශා කරනවා. එයින් දේවානුභාවය ලැබෙනවා. පරිත්‍රානුභාවය කියන්නේ බුද්ධානුභාවය, ධම්මානුභාවය, සංඝානුභාවය, පුණ්‍යානුභාවය, කුසලානුභාවය, දේවානුභාවය, සත්‍යානුභාවය කියන මේ සියල්ලේ එකතුව යි. ඔබම පිරිත සජ්ඣායනා කරන කොට ඔබ කරා ඒ සියලු ආනුභාවයක් පැමිණෙනවා. සියලු ආශිර්වාදය ලැබෙනවා.

***පිරිත් සජ්ඣායනා කිරීමෙන් ආශිර්වාදය සලසා ගන්නේ කොහොම ද?***

නිතර පිරිත් සජ්ඣායනා කරමින් වාසය කරන මනුස්සයාට සර්පයෝ දෂ්ඨ කරන්නේ නැහැ කියනවා. දෂ්ඨ කිරීමට එන සර්පයා පවා බැහැරව යනවා. පිරිතේ ආනුභාවය නිසා. ඒ වගේම සතුරුකම් කරන්න යමෙක් කැමැතිව ඉන්නවා නම් ඒ සතුරා තමාගේ උපක්‍රමය අතහරිනවා පිරිතේ බලයට. කිපුණු හස්ථියෙක් ඔහු ඉදිරියට ආවත් ඒ හස්ථියා මෙල්ල වෙනවා. ඒ වගේම බණ පොතේ මෙහෙමත් සඳහනක් තියෙනවා. ඇවිළීගෙන එන ගින්න පවා පිරිතේ ආශිර්වාදයෙන් නවතින බව යි. ශරීරගත වූ හළාහල විසක් පවා පිරිතේ ආනුභාවයෙන් තුනී වී මාරාන්තිකවීම වළකාගත හැකි බවයි. තමා නසනු කැමතිව තමා කරා එන පිරිස පවා මිත්‍යාභාවයට පත්කර ගත හැකි බලයක් පිරිතට තිබෙනවා. උගුල් ඇටවීම, හදිහූනියම් පවා සම්පූර්ණයෙන් තමාගේ ජීවිතයෙන් බැහැරව යනවා. ඒ පිරිතේ ආශිර්වාදය ආනුභාවය නිසා.

***අපි කෙතරම් පිරිත් සජ්ඣායනා කළත් පිරිතේ ආශිර්වාදය ලැබෙන්නේ නැහැනේ කියලා ඇතමෙකුට සිතෙන්නට පුළුවන් අවස්ථා තිබෙනවා නේද ස්වාමීන් වහන්ස***

පිරිතේ ආශිර්වාදය නො ලැබෙන කරුණු තුනක් ධර්මයේ සඳහන් වෙනවා.

ඒ තමාගේ කර්මය බොහෝ බලවත්නම් ඔහුට පිරිතේ ආශිර්වාදය ලැබෙන්නේ නැහැ. ඒක පිරිතේ දෝෂයක් නොවේ. තමා රැස්කර ගත් කර්මයේ දෝෂයක්.

දෙවැන්න රාග, ද්වේෂ, ඊර්ෂ්‍යා, මෝහ, මාන්න ආදී කෙලෙස්වලින් තම සිත වැහිලා නම් පිරිතේ ආශිර්වාදය නො ලැබී යනවා. ඒකත් තමාගේ දෝෂයක් මිස පිරිතේ දෝෂ යක් නොවේ.

තුන්වැන්න තමයි පිරිත ගැන තිබෙන අවිශ්වාසය. තමා තුළ ශ්‍රද්ධාවක් නැත්නම් මේ පිරිතෙන් මට ආශිර්වාදයක්, ආරක්ෂාවක් ලැබෙනවා කියා හැඟීමක් නැත්නම් ඔහුටත් පිරිතේ ආරක්ෂාවක් ලැබෙන්නේ නැහැ. එහිත් දෝෂය පිරිතේ නොවේ තමාගේ ම යි.

එනිසා ඔබ පිරිත ගැන එහෙම තේරුම් ගන්න. තමාට ආශිර්වාදය පිණිස පිරිත් සජ්ඣායනා කරන්න පුරුදු වෙන්න. පිරිත් සජ්ඣායනාව ජීවිතයේ අංගයක් බවට පත්කර ගන්න.

නොයෙක් ශාරීරික අපහසුතා නිසා කෙනෙක් ගුවන් විදුලියෙන් හෝ රූපවාහිනියෙන් පිරිතේ ආශිර්වාදය ලබා ගැනීම පිණිස පිරිත් අසාගෙන සිටියාට වරදක් නැහැ. එහෙත් පුළුවන් සෑම වෙලාවක දී ම සංඝයා වහන්සේ අසලට ගොස් පිරිත් සජ්ඣායනා කරන්න පුරුදු වෙන්න. ගුවන් විදුලියේ හෝ රූපවාහිනියේ පිරිත් විකාශනය වන විට ඔබත් මහත් ශ්‍රද්ධාවෙන් පිරිවානා පොත්වහන්සේ අතට ගෙන පිරිත් සජ්ඣායනා කරන්න. එවිට ඔබට පිරිතේ ආශිර්වාදය ලැබෙනවා ම යි.

නයනා නිල්මිණී

**ජීවිතය දෙව් විමනක් කර ගන්නේත්, අපායක් කර ගන්නේත් තමන් ම ය**

බුදුසරණ





# සුන්දර මාවෙල ගම් පියසේ අභිමානවත් වෙහෙර බිම

# පින්බර සම්බෝධිගිරි විහාරය

**රත්නපුර බළංගොඩ මාර්ගයේ ඇල්ලේපොල හන්දියෙන් හැරී ගවරන්තැන්න වැලිගෙපොල මාර්ගයේ ගිරිහෙල් පීරාගෙන කිලෝමීටර් දහයක් පමණ ගිය විට මාවෙල ගම හමුවේ.**

ඉපැරැණි ගම්මානයක් වූ මාවෙල ගම වඩාත් ප්‍රචලිතව ඇත්තේ එහි ඇති ඉපැරැණි මහා බෝධීන් වහන්සේ නිසා ය. එහි ඉතිහාසය ක්‍රිස්තු පූර්ව දෙවන තුන්වන සියවස් පමණට ඇදී යන්නේ මෙයට ආසන්නයේ පැවැති සඳගිරි නුවරත් එහි රෝපණය වූ දෙතිස්ඵල බෝධීන් වහන්සේ සමඟ ඉපැරැණි මාවෙල බෝධි වෘක්ෂය අතර ඇති සබඳතාවය ද නිසා ය.

මාවෙල ගමට යාබද ගිරි ශිඛර අතරේ ඇති ඉපැරැණි ගල්ලෙන් බොහොමයක අතීත ජනාවාස පැවැති බව ද හඳුනාගෙන ඇත. කලෙකට ඉහතදී මෙම බෝ සමිඳුන් සෙවණෙහි භාවනානුයෝගීව වැඩ සිටි තාපසයන් ගැන ද පැරැන්නෝ කියති.

මෑත කාලයේ දී මෙම උතුම් පින්බිම දැක හැඳින විහාරස්ථානයක් බවට පත් කිරීමට මුල පිරුවේ 1970 වසරේ දී පමණ ය. ඒ රත්නපුර වරකාතොට පාරේ ශ්‍රී බෝධිරාජාරාම විහාරාධිපතිව වැඩ සිටි බටුගෙදර සුධම්ම හිමිපාණන්ගේ මඟ පෙන්වීමෙනි.

ඒ ඉපැරැණි බෝ සමිඳුන් සෙවණේ වස් සමාදන් වීමෙනි. මාවෙල ප්‍රදේශයේ සත් ගුණවත් බෞද්ධ ව්‍යාපාරික මහතකු වූ එම්. එම්. අරණෝලිස් මහතා සිදු කළ භූමි පරිත්‍යාගයකින් බෝ සමිඳුන්ට යාබදව කුඩා කුටියක් ඉදි කිරීමෙන් සම්බෝධිගිරි විහාරයට මුල පිරුණි.

මාවෙල ගමට ආසන්නව ආගමික වතාවත් සඳහා ආසන්නයේ වෙනත් විහාරස්ථානයන් ද නො තිබුණ නිසා සම්බෝධිගිරි විහාරයේ සංවර්ධන කටයුතු ඉක්මන් විණි.

විහාරාධිපති විශ්‍රාමලත් විදුහල්පති බළංගොඩ සුමේධාලංකාර හිමියන්ගේ මූලිකත්වයෙන් සිදු වූ විහාර සංවර්ධන කටයුතු සඳහා මඟ විවරවීම සහ අවශ්‍ය අනුශාසනා සිදු වූයේ මාවෙල සිරි සුමන නාහිමියන් වෙතිනි.

විහාරස්ථානයේ සංවර්ධන කටයුතු නිමාවන විට දරුවන්ගේ ධර්ම ඥානය ඇති කරවීම සඳහා ආරම්භ වූ දහම් පාසල ද දවසින් දවස උසස් ප්‍රතිඵල පෙන්වමින් සිය ගණනක් දරුවෝ යහමඟට යොමු කරමින් සිටී. ධර්මාචාර්ය විභාගයෙන් පවා සමත් ව විශිෂ්ටයන් වූ දරුවෝ ද සිටිති.

සැදැහැති දායක පින්වතුන්ගේ සහ දානපතියන්ගේ ධන පරිත්‍යාගයෙන් මාවෙල සිරි සම්බෝධිගිරි විහාර බිමෙහි ඉදිවුණ මව් පිය ගුණ මහ සෑය මාවෙල කඳු මුඳුනේ සිට සමනොළ කඳු පෙළ දෙසට නිරාවරණය වන්නේ මහවලතැන්න කිරිමැටිතැන්න පසුකර හමනා සිසිලැල් පවන ද සමඟින් ය.

මනරම් වූ වටපිටාවක ඉදිවුණ මෙම මහා සෑ රදුන්ගේ වැඩ නිමාකොට කොත් පැළඳවීම සහ නිරාවරණ පූජාව ද සිදුවූයේ මැදින් මස ආරම්භයේ දී ය. ඈත සිට බලන්නකුට සෑරදුන් වැජඹෙන තේජාන්විත බවටත් වැඩියෙන් බුදු සිරිත දැක සිත් පහන් කර ගන්නට අවස්ථාව සැලසෙන්නේ මහා සෑ රදුන් වටා සහ එහි තුළ ගර්භයේ බිත්තිවල ද මූර්ති ලෙස මෙන් ම චිත්‍ර ලෙසින් ද පෙන්වා ඇති බුදු සිරිතේ විවිධ අවස්ථා දකින විට ය.

මෙම සෑයට මව් පිය ගුණ මහා සෑය යන නම ලැබී ඇත්තේ ද එහි තුළ ඇති චිත්‍ර සහ මූර්ති බොහොමයක් ම මව් පිය ගුණයට මුල් තැන දෙන ඒවා නිසා ය. මව් පිය ගුණ සුවඳ සිතට දැනෙනා ලෙසින් ඒවා මූර්තිමත් වී ඇත.

තමන් කුමන සමාජ ස්ථරයක සිටිය ද තමන්ගේ ශක්ති පමණින් මව්පිය උපස්ථානයන් කළ යුතු ය යන උදාර පණිවිඩය සමාජගත කරන්නට ගත් උත්සාහයක් ලෙස සම්බෝධිගිරි විහාරයේ මව් පිය ගුණ සෑය නිර්මාණය කළ බව විහාරාධිපති හිමියෝ පවසති.

එනිසාම ඒතුළ බෝසතාණන් වහන්සේ තම දිවි පරදුවට තබා මව්පිය උපස්ථානයේ යෙදුණු අයුරු පෙන්වන ජාතක කතා ද චිත්‍ර හා මූර්ති මඟින් පණගන්වා ඇත. අවසනට දක්වා ඇත්තේ මාතෘ දිව්‍ය රාජයාට අභිධර්මය දේශනා කිරීමේ පුවත යි.



**විහාරාධිපති බළංගොඩ සුමේධාලංකාර හිමි**



**ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකායේ රත්නපුර දිසාපාලක මාවෙල සිරිසුමන නාහිමි**



**ධර්මප්‍රිය ලියනආරච්චි**
රත්නපුර සමූහ

**වර්ෂ 2023 ක් වු මාර්තු 06 සඳුද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.**